මෙම පර්යේෂණය සිදුකිරීමේ දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය තෝරාගන්නා ලදී. එහිදී නිලධාරි මණ්ඩලයේ 20 දෙනෙකු හා සේවාලාභීන් 20 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් ඔවුන්ට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කොට එයට පිළිතුරු ලබා ගැනීමෙන් හා ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වමින් පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී. විශේෂයෙන් ම ආයතනයේ කළමනාකරණ ක්‍රියාදාමය සිදුවන ආකාරයත්, කළමනාකරණ පද්ධතිය තුළ ඇතිවන ගැටලු අනාවරණය කරගැනීමටත් උක්ත ආයතනය මූලාශ්‍රයක් වශයෙන් යොදා ගැනිණි. මීට අමතරව ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් ද ප්‍රස්තුත කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මා යොමු විය.

නූතන සමාජ ප්‍රවාහය තුළ මුල් බැසගෙන පවතින කළමනාකරණ න්‍යාය මෙරට පාලන ක්ෂේත්‍රයේ කටයුතු සඳහා සම්බන්ධ කරගනී. එහෙත් ඒ තුළ ඉස්මතු වන්නා වූ ව්‍යාකූල තත්ත්වයන් හේතුවෙන් කළමනාකරණ ක්‍රියාදාමය අසමතුලිත වන අතර එය ආයතනයේ බිඳ වැටීමට බලපානු ලබයි. අවිධිමත් කළමනාකරණ ව්‍යූහය එයට නොයෙක් බාධාවන් පමුණුවයි. එහිදී පෙරදිග චින්තනය තුළ බිහි වූ විශිෂ්ට දර්ශනවාද අතරින් බුදුදහමෙහි ඉදිරිපත් වී ඇති ඉගැන්වීම් ආශ්‍රයෙන් නූතන රාජ්‍ය ආයතනයන්හි කළමනාකරණ ක්‍රියාදාමය සාර්ථක කරගැනීමට හැකි ය.

***ප්‍රමුඛ පද:*** *කළමනාකරණය, නූතන, රාජ්‍ය, ආයතන*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **vurdsjp@gmail.com**

# සාරධර්ම පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

**නිකපිටියේ නන්දරතන හිමි**[1]

සාරධර්ම, ආචාර ධර්ම යනු පුද්ගල යහපත හා සමාජ යහපත සඳහා අවශ්‍ය කරන ධර්මතා වේ. එම ධර්මතාවන්ට අනුව හැසිරීම සදාචාරය ලෙස ද ඊට පටහැනි චර්යාව දුරාචාරය ලෙස හැඳින්වේ. සාරධර්ම පිළිබව න්‍යායාත්මක විග්‍රහයක් මගින් පැහැදිලි ව්‍යතිරේකයක් ඉදිරිපත් කිරීම, සාරධර්ම ගොඩනැගෙන ආකාරය මනෝ විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම සහ සාරධර්ම පිළිබඳ මනෝ විද්‍යාවේ පවත්නා දැනුම් සම්භාරය සංගෘහිත කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වේ.

පෙරදිග සහ බටහිර දර්ශනවල සාරධර්ම යන පදය සමානාර්ථයෙන් විග්‍රහ වී නැත. පෙරදිග සාරසංකල්පය දීර්ඝකාලීන ව පරිණාමය වී ඇත්තකි. ගසෙක අභ්‍යන්තරයෙහි පවතින ‘‘හරය’’ යන අර්ථයෙන් සහ මී මැස්සා පුෂ්පාදියෙන් ලබාගන්නා මධුව යන අර්ථයෙන් ද ‘‘මධ්වා’’ යන්නෙන් ඍග්වේදයේ සාර ශබ්දය භාවිත වී ඇත. ඒ අනුව පෙනී යන්නේ ප්‍රාග්බෞද්ධ යුගයේ සිට ම සාර ශබ්දය සදාචාර සංකල්පයක් වශයෙන් ද ප්‍රයුක්ත වී ඇති බවයි. බුදු දහම තුළ සාර-අසාර ශබ්ද සදාචාර සංකල්පය මත පදනම් ව ඉදිරිපත් වෙයි. සාර-අසාර ධර්ම වරදවා සංකල්පනය ‘‘මිච්ඡා සංකප්ප’’ ලෙස ද, නිවැරදි ව සංකල්පනය සම්මා සංකල්ප’’ ලෙස ද විග්‍රහ වන්නේ එහෙයිනි. ග්‍රීක චින්තකයන් විසින් සාරධර්ම යන්නට සද්ගුණය යන අර්ථයෙන් Ethics යන පදය සාරධර්ම පදය හා සම්බන්ධ වේ. ඊට අමතරව ව Moral, Ethic යන පද ද සඳහන් කළ හැකි වුවද සියුම් වූ වෙනස්කම් ඇත. සිංහලයේ ද සාරධර්ම පදයට අමතරව සදාචාර, සද්ගුණ, අගයන් යන වචන ද දැකගත හැකිය.

සාරධර්මයක් පුද්ගලයා චරිතායනය කරගන්නේ සංකීර්ණ ක්‍රියාවලියකින් පසුව ය. මත,විශ්වාස, අධ්‍යාපනය, ජීවන දර්ශනය මත පදනම් ව ආකල්ප ගොඩනැගෙයි. ආකල්ප රාශියක් එක් වූ තැන සාරධර්ම වේ. එවැනි වූ සාරධර්ම සදාචාර විනිශ්චයෙහි ලා පාදක වෙයි. සාරධර්ම ගොඩනැගීම පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහය විසිරී පවතින දැනුම, මනෝ විශ්ලේෂණාත්මක ප්‍රවේශය, ඉගෙනුම් න්‍යායාත්මක ප්‍රවේශය, ප්‍රජානන සංවර්ධනාත්මක ප්‍රවේශය යන ප්‍රවේශයන් මගින් සංගෘහිත කළ හැකි ය.

සාරධර්ම සදාචාරයෙන් අගයන්ගෙන් වෙනස් වේ. සෑම අගයක් ම සාරධර්ම වන්නේත් සෑම සාරධර්මයක් ම අගයක් වන්නේත් නැත. එකිනෙකට පරස්පර සාරධර්ම පවතින අවස්ථා ඇත. එය සාරධර්ම ගැටලුවකි. විශ්වීය සාරධර්ම ද ඇතැම් තැනෙක්හී විග්‍රහ වේ. එහෙත් සාරධර්ම තුළ වර්ගවාදය, ජාතිවාදය, කුලවාදය අන්තර්ගතව පවතින බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *සාරධර්ම, සදාචාරය, මනෝ විද්‍යාව, ආචාර ධර්ම*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **nandarathana@gmail.com**

# උපැවිද්ද පිළිබඳ සිංහල බෞද්ධ ජන විඥානය

**මූලටියන විනීත හිමි**[1]

ගෘහ ජීවිතයක දෙමාපිය, ඥාති හිතෛෂීන් හා ගත කරන සාමාන්‍ය ලෞකික ජීවිතයෙන් ඉවත් වී යම් විශේෂ ශ්‍රමණ ව්‍රතයක් සමාදන් වී ආධ්‍යාත්මික අරමුණක් වෙනුවෙන් කැප වූ තැනැත්තා පැවිද්දා නම් වේ. එම පැවිදි ජීවිතය අතහැර සාමාන්‍ය ලෞකික ජීවිතයකට යළි පැමිණීම උපැවිදි භාවය වේ. ඒ පිළිබඳ ව මූලික බෞද්ධ ඉගැන්වීම් හා උපැවිදි වීමට බලපාන හේතු පිළිබඳවත් සිංහල බෞද්ධ ජනසමාජය තුළ උපැවිදි වීම පිළිබඳ දරන ආකල්පයත් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා දත්ත මෙහිදී විශ්ලේෂණය විය.

ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂුවක් උපැවිදි වීම කෙරෙහි බලපාන්නේ විවිධ හේතු සාධකයන් ය. ඒ අතර සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යනාදී ගැටලු රාශියක් බලපායි. වසර දහස් ගණනක බෞද්ධ සංස්කෘතියක පසුබිමක් උරුම කරගන්නා මෙරට සිංහල බහුතරය බෞද්ධ වේ. පැවිද්දත් සමග පූජනීයත්වයෙන් ගරුබුහුමන් ලබන භික්ෂුව ඉහත කවර ම හේතුවක් නිසා හෝ උපැවිදිවීම කෙරෙහි සිංහල ජනසමාජය දක්වන ආකල්ප විවිධ ය. ඒ අතර බෞද්ධ ධර්මය හා ශාසනය පිළිබඳ තිබෙන අවබෝධය හෝ අත්දැකීම අනුව ද අදහස් වෙනස් වේ. මෙම පර්යේෂණයේ දී දත්ත සපයා දුන් කණ්ඩායම් අතර උපැවිදි වී සමාජය තමන් කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳවත් එම තත්වයට නො පත් බාහිර වශයෙන් ජීවත් වන පුද්ගලයින් ලෙසින් දක්වන ආකල්පයත් වශයෙන් ද ආකල්ප වෙනස් වේ. මේ අනුව සිංහල බෞද්ධ ජනතාව පැවිද්දෙකු උපැවිදිවීම පිළිබඳ ව දරන ආකල්ප විවිධ වන අතර ඒ සඳහා දේශනාවේ දැක්වෙන කාරණා මෙන්ම පාරම්පරිකව ජනසමාජය ගොඩනගාගත් ආකල්ප ද බලපා තිබේ.

පැවිදිවීම සඳහා වර්තමානයේ පෙළඹෙන බොහෝ දෙනා ආධ්‍යාත්මික අරමුණු ම පදනම් කරගත අය නො වේ. කෙසේ වෙතත් විවිධ හේතු කාරණා නිසා ඇතැම්හු උපැවිදි වති. සිංහල ජනසමාජය ඒ පිළිබඳ ව දක්වන්නේ ඍණාත්මක ආකල්පයකි. එහෙත් එය හුදු සාම්ප්‍රදායික චින්තනයක එල්බගැනීමක් මිස කරුණු අවබෝධයෙන් ඇතිකරගත් මැදිහත් ආකල්පයක් නො වන බව මෙහිදී නිගමනය කෙරේ.

***ප්‍රමුඛ පද:*** *පැවිද්ද, උපැවිද්ද, ජනසමාජය, ජනවිඥානය, සම්ප්‍රදාය*

[1] **පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, vurdsjp@gmail.com**

# වෘත්තීය ජීවිතය හා සම්බන්ධයෙන් උද්ගත වන ගැටලු විසඳීමෙහි ලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව

**පී. ආර්. නිසංසලා**[1]

රැකියාව හා පුද්ගල ජීවිතය එකිනෙකට සම්බන්ධ ක්‍රියාදාමයකි. වෘත්තිය ආරම්භ වන්නේ මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේදීම ය. වෘත්තියක් ප්‍රධාන වශයෙන් පුද්ගලික හා රාජ්‍ය අංශයට අයත් වේ. බුදු දහමින් නිවැරදි වෘත්තිය ජීවිතය ඇගයුම් කොට ධාර්මික වෘත්තීන්ට මගපෙන්වයි. ඕනෑම කෙනෙකු වෘත්තියක් තෝරා ගැනීමේදී සම්මා ආජීවයෙන් යුක්ත විය යුතු බව බුදුන් වහන්සේ පෙන්වා දී තිබේ. වගකීම් බහුලවීම, වැඩ අධික වීම, නිසි වැටුපක් නො ලැබීම, ආයතන ප්‍රධානීන්ගේ අයහපත් ක්‍රියා කලාපය වැනි හේතු සාධක තුළින් වෘත්තිය ජීවිතයේ ආතතිය හා රැකියා අතෘප්තිය වැනි ගැටලුවලට මුහුණ පෑමට සිදු වේ. වෘත්තිය ජීවිතයේ ගැටලු නිරාකරණය විෂයෙහි වර්තමානයෙහි යොදාගෙන ඇති ක්‍රමවේද ලෙස රැකියා තෘප්තිය ඇති කිරීමට සුහසාධන සේවා ඉහළ නැංවීම, සේවා වැටුප් ක්‍රමවත්ව ලබාදිම, කාර්යඵල ඇගයීම, මානව සම්පත් කළමනාකරණය, සේවක අභිප්‍රේරණය ඇති කිරීම ආතති කළමනාකරණය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, නිවැරදි වෘත්තිය පුහුණුවක් ලබාදීම යනාදිය ලබාදිය හැකි බව පර්යේෂණය තුළින් හඳුනාගත හැකි විය. වෘත්තියෙහි ජීවිතයෙහි ගැටලු අවම කරගැනීමෙහිලා භාවනා ක්‍රම, බුදුන් වහන්සේගේ කාල කළමනාකරණ ඉගැන්වීම්, ශ්‍රමය ඇගයීම හා යහපත් සේව්‍ය - සේවක සබඳතාවකට උපයෝගී කරගත හැකිය. දත්ත විශ්ලේෂණයෙහි දී හඳුනාගත හැකි වූයේ රාජ්‍ය හා පෞද්ගලික වෘත්තීන් දෙකෙහි ම වෘත්තිය ගැටලු ඇති බවත් ඒ සඳහා ඉහත කී ක්‍රියාමාර්ග යම්තාක්දුරකට යොදාගෙන ඇති බව දැකගත හැකිය. ඇතැම් වෘත්තිකයන් තම වෘත්තියෙන් අතෘප්තිමත්ව කටයුතු කරන අතර ඔවුන් පෞද්ගලික අංශයේ වෘත්තිකයන් බව හඳුනා ගත හැකි විය. වෘත්තිය ගැටලු හේතුවෙන් ආයතන අකාර්යක්ෂමතාව මෙන්ම පවුල් ජීවිතයේ ගැටලු ඇතිවන ආකාරයත් මේ නිසාම සේවය හැරයාම දක්වා වෘත්තිකයා පෙළඹී ඇති බවත් හඳුනා ගත්තහ. ඒ සඳහා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය වැනි සූත්‍ර මෙන් ම බුදුන් වහන්සේ විසින් ශ්‍රාවකයන් පාලනය කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් ද යොදා ගත හැකි බව සඳහන් කළ හැකිය.

නිවැරදි වෘත්තිය මගපෙන්වීමක් හා වෘත්තිය පුහුණුවක් ලබාදීම හා නිදහස් මනසක් ඇති කර ගැනීම තුළින් වෘත්තිය ගැටලු අවම කර ගත හැකි බවත්, ඒ සඳහා බෞද්ධ විසඳුම් මැනවින් උපයෝගි කරගත හැකි බවත් මෙහිදී නිගමනය කෙරේ.

***ප්‍රමුඛ පද:*** *වෘත්තිය, රැකියාව, අතෘප්තිය, ශ්‍රමය, ආතතිය*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **ruwini92ganewatta@gmail.com**

# ජාතක කතාවලින් හෙළිවන සාරධර්ම සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**පී. ඒ. ඉරේෂා චතුරාණි**[1]

සමාජයේ සෑම පැතිකඩක් ම විවරණය කරන්නා වූ ද, නොයෙක් සමාජ ක්ෂේත්‍රයන්ට ආදර්ශ සපයමින් ඒවායෙහි පවතින්නා වූ අඩු ලුහුඬුකම් මෙන්ම පුද්ගල චරිතයන්ගේ ස්වභාවය කියාපාන්නා වූ ද ග්‍රන්ථයක් ලෙස පන්සිය පණස් ජාතක පොත හඳුන්වා දිය හැකිය. සදාචාර සම්පන්න, සංවරශීලි සමාජයක් බිහි කිරීම පිණිස ජාතක සාහිත්‍යයෙන් ලබාගත හැකි උපකාරය අතිවිශාල ය. එකී ජාතක කතා ඔස්සේ සන්නිවේදනය වන එක් ගුණාංගයක් ලෙස සාරධර්ම හඳුනාගත හැකිය. නූතනයේ බොහෝ අංශවල පරිහානියක් සිදු වී තිබේ. ඒ පරිහානියට හේතු ජාතක කතාවලින් මනාව සන්නිවේදනය කරයි. සාරධර්ම ගිලිහී යාම නිසා සිදුවන සමාජ පරිහානිය වළක්වා ගැනීමට ජාතක කතා උපයෝගී කොට ගත හැකිය යන කරුණ සාධනය කරගනු වස් මා විසින් ජාතක කතාවලින් හෙළිවන සාරධර්ම සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදි. ප්‍රස්තුත මාතෘකාවට අදාළ වන ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් දත්ත රැස්කෙරුණි.

පන්සිය පනස් ජාතක පොතෙහි ඇතුළත් සෑම ජාතකයක ම සාරධර්ම සන්නිවේදනය සිදු වේ. එකී සන්නිවේදනය සිදු කිරීමට පහසු මාධ්‍යයන් ලෙස සාහිත්‍යය මෙන්ම විහාර සිතුවම් උපයෝගී කරගෙන ඇත. විදේශිකයන්ට නතු වූ ලාංකේය සමාජයේ සාරධර්ම පරිහානිය දුටු පහතරට චිත්‍ර ශිල්පීන් විහාර සිතුවම් අතරට වැඩි වශයෙන් ජාතක කතා එක් කොට මනා සන්නිවේදනයක් සිදු කර ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

සාරධර්ම සෝදා පාළුව තදින් පෙනී යන මෙකල පුද්ගල හා සමාජ සංවර්ධනය අපේක්ෂා කරන සෑම අංශයක් ම ජාතක කතා උපයෝගී කර ගැනීමෙන් මනා සංවර්ධනයක් ලබාගත හැකිය. ජාතක කතා සන්නිවේදනයට සිතුවම් උපයෝගී කර ගැනීමෙන් චිත්‍ර කලාව ද වර්ධනය වේ. ජාතක කතා මඟින් පෙන්වාදෙන ක්‍රමවේදයන් ඔස්සේ පුද්ගලයාට මෙන්ම සමාජ ක්ෂේත්‍රයන්ට ද සංවර්ධනයක් ලබාගත හැකි බව මෙහිදී නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *ජාතක කතා, සාරධර්ම, සමාජය, සන්නිවේදනය, සංවර්ධනය*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **ireshachathu4@gmail.com**

# සිංහල පාරිභාෂික ශබ්ද මාලාව පෝෂණයෙහි ලා හෙළ හවුල සම්ප්‍රදායේ දායකත්වය හා බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (මුනිදාස කුමාරතුංග ඇතුළු හෙළ හවුලේ ප්‍රමුඛ පෙළේ සාමාජිකයන් පස් දෙනෙකු ඇසුරින්)

**ජේ. එම්. ඩබ්. එස්. සඳරුවන්** [1]

රාජ්‍ය භාෂා පෙරළියත්, නවීන විද්‍යා දියුණුවත් හේතු කොට ගෙන සිදු වූ සිංහල වාක් කෝෂයේ ඌනතා පූරණය කරනු වස්, රාජ්‍ය මැදිහත් වීමට නොදෙවෙනි දායකත්වයක් ලබා දුන් ගුරු කුලයක් ලෙස හෙළ හවුල හැඳින්විය හැකිය. යටත්විජිත පාලන සමය තුළ නිසි තැන් නොලැබීම නිසා පෝෂණයට ලක් නොවූ සිංහල වාක් කෝෂය සංවර්ධනය කිරීමෙහි ලා කුමාරතුංග ප්‍රමුඛ හෙළ හවුල දැරූ පරිශ්‍රමය විමසීමට මෙන්ම ඇගයීමට ලක් කිරීම කාලීනව යෝග්‍ය වූවකි. නව අදහස් පැවැසීමට අවශ්‍ය වාක් කෝෂමය සංවර්ධනය උදෙසා හෙළ හවුලේ දායකත්වය වැදගත් වන්නේ ඔවුන් ඒ සඳහා පෙන්වා දුන් නව ක්‍රමවේදයන් හේතුවෙනි. රාජ්‍ය මැදිහත් වීම යටතේ සැකසුන පාරිභාෂික ශබ්දමාලාවන්හි අනුගමනය කළ භාෂා ප්‍රතිපත්තියට ප්‍රතිවිරෝධී මඟක් අනුගමනය කළ හෙළ හවුල පාරිභාෂික යන වචනයට පවා භාවිත කළේ වඩු වදන් හෙවත් සිප්යුරු වදන් යන්නයි. හෙළ බසේ සියත් බව හා අනන්‍යතාව රැකෙන පරිදි සිප්යුරු වදන් තැනීමේ නිරත වූ හෙළ හවුල කාලීන අවශ්‍යතාවන් පිරිමැසීමට තරම් ප්‍රමාණාත්මක සිප්යුරු වදන් රාශියක් හෙළ බසට දායාද කොට ඇත. විවිධ විෂයයන්ට අදාළ වූ නියතාර්ථවත් පාරිභාෂික ශබ්ද ලෙස සැලකිය හැකි උක්ත සිප්යුරු වදන්, හෙළ බසෙහි පවතින නිෂ්පන්න ශබ්ද තරමටම ව්‍යක්ත ලෙස නිර්මාණය කර තිබීම විශේෂ කරුණකි. නව අදහස් පරභාෂාවලින් තෙපරබෑම වෙනුවට හෙළ බසින් පැවසීමට අවශ්‍ය මඟ පෙන්වීම නිවැරදිව සිදු කරන ලද්දේ හෙළ හවුල විසිනි.

***ප්‍රමුඛ පදඃ*** *හෙළ හවුල, පාරිභාෂික පද, වඩු වදන්, සිප්යුරු වදන්, කුමාරතුංග*

[1] **සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, sandarujmw@gmail.com**

# අද්‍යතන විද්‍යුත් මාධ්‍ය බෞද්ධාගමික වැඩසටහන් ජන සමාජයට සිදු කරන බලපෑම පිළිබඳ  සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**බී. එන්. එන්. දයාරත්න**[1]

නූතන තාක්ෂණය හමුවේ සන්නිවේදනය ද තාක්ෂණික වශයෙන් විශාල පරිවර්තනයකට ලක්ව තිබෙනු දකිය හැකිය. ඒ අනුව වෙනස්වීමට ලක් වූ සන්නිවේදනය හේතුවෙන් තොරතුරු ග්‍රාහක ලෝකය ද පුළුල් විය. නූතන ජනමාධ්‍ය ඔස්සේ විවිධාකාර වූ මාධ්‍ය සංදේශ විශාල වශයෙන් ලබා ගැනීමේ අවස්ථාව ග්‍රාහකයා සතු විය. තත්ත්වය එසේවුව ද ග්‍රාහකයා මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ දී එය තමාට අභිමත පරිදි වරණයට ලක්කරනු ලැබ ඇත. ඒ අනුව ජනමාධ්‍ය මඟින් ලබාදෙන සියලුම සංදේශ ඒ ආකාරයෙන්ම ලබා ගැනීමට ග්‍රාහකයා නොපෙළඹේ. විවිධ වූ සංදේශ අතරින් විද්‍යුත් මාධ්‍ය ඉදිරිපත් කරන්නා වූ බෞද්ධාගමික වැඩසටහන් ජන සමාජයට සිදු කරනු ලබන බලපෑම් පිළිබඳව අධ්‍යයන පර්යේෂණයේ අරමුණ වීය. ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකාච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය යන දත්ත රැස් කිරීම සඳහා භාවිත වීය.

ආගම හා සම්බන්ධ කාරකයන් බෙහෝ දුරට පුද්ගලයා කෙරෙහි මනෝ මූලිකව බලපෑම් කරනු ලබයි. එබැවින් සමාජයේ වැදගත් සමාජ සංස්ථාවක් ලෙස සැලකෙන ආගමික සංස්ථාවට ජනයාගේ වැඩි නැඹුරුවක් ඇත. එමෙන්ම වර්තමාන ආගමික මධ්‍යස්ථාන, ආගමික නායකයන් ජනමාධ්‍ය භාවිත කරන ආකාරය ද නූතන මාධ්‍ය සංස්කෘතිය තුළ බෞද්ධාගමික සන්නිවේදනය සඳහා සැලකිය යුතු අවකාශයක් වෙන්කිරීම ද සිදුකර ඇත. එසේ නමුත් මෙම වැඩසටහන් සම්බන්ධයෙන් ඒ ඒ පුද්ගලයාගේ රුචිකත්වය, විශ්වාස, ආකල්පවල විවිධතා අනුව තමා නරඹන වැඩසටහන නිර්ණය වේ.

විවිධ වයස් කාණ්ඩයන්, විවිධ තරාතිරම් නියෝජනය කරනු ලබන විවිධ වයස් කාණ්ඩයන්හි පුද්ගලයන් මෙම බෞද්ධාගමික වැඩසටහන් කෙරෙහි යොමුව ඇත. ග්‍රාහකයන් බෞද්ධාගමික වැඩසටහන් කෙරෙහි යොමුවීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ, දෛනික ජීවිතයේදී ඔවුන් මුහුණ දෙන්නා වූ බොහෝ තත්ත්වයන් පිළිබඳව සාකච්ඡාවට ලක් කිරීමය. ග්‍රාහකයින් එම තත්ත්වයන් ආගමික වශයෙන් විග්‍රහකර ගැනීම, ඔවුන්ගේ කායික හා මානසික හැසිරීම්හි පැහැදිලි වෙනසක් ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතුවයි. එබැවින් සංකීර්ණ දිවි පෙවෙතක් ගත කරන කාර්ය බහුල ග්‍රාහකයින් හට මානසික සැහැල්ලුව ලබා ගැනීමේ පහසු සහ එකම මඟ බවට මෙම බෞද්ධාගමික වැඩසටහන් පත්ව ඇත.

***ප්‍රමුඛ පදඃ*** *ආගම, සන්නිවේදනය, ජනමාධ්‍ය, බෞද්ධාගම*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, nayomi.nadee93@gmail.com**

# මහනුවර යුගයේ විහාරසිතුවම්වලින් නිරූපිත නර්තන අංග හා ආනුසංගික කලා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් (බේරුවල සපුගොඩ විහාරය හා පාණදුර රන්කොත් විහාරය ඇසුරින්)

**කේ. එන්. එම්. ප්‍රනාන්දු**[1]

සන්නිවේදන මාධ්‍යයේ එක් කලාවක් ලෙස සිතුවම් කලාව දැක්විය හැක. ඒ අතර විහාර බිතුසිතුවම්වලට ද හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. බෞද්ධ සිද්ධස්ථාන කේන්ද්‍රකොටගෙන සකස් වූ හෙයින් විහාර සිතුවම් තුළ දේශීය සංස්කෘතිය විදහාලන කලාංග අන්තර්ගත වේ. චිත්‍ර, නැටුම් හා මූර්ති ආදී අංග එහිලා විශේෂ ය. ඒ අතුරින් බේරුවල සපුගොඩ විහාරය හා පාණදුර රන්කොත් විහාරයන්හි බිතුසිතුවම්වලින් නිරූපණය කොට ඇති නර්තන අංග සාකච්ඡා කොට දැක්වීම අධ්‍යයනයේ මූලික අරමුණ විය. සෙසු අරමුණු ලෙස නර්තන හා බැඳි ආනුසංගික කලා මාධ්‍යයන්ට අයත් වන ඇඳුම් පැළඳුම්, වෙස්මුහුණු ආදී දෑ ද සාකච්ඡාවට ලක්වේ.

තීරු ක්‍රමය හා සිතුවම යටින් තේමාව දැක්වීම ආදී ලක්ෂණ ප්‍රකට වීම මත මෙම සිතුවම් මහනුවර යුගයට අයත් බව හඳුනාගනු ලැබිණි. මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිත ව දැකිය හැකි විහාර ද්විත්ත්වයක් පර්යේෂණය සඳහා යොදාගත් බැවින් නිරීක්ෂණ ක්‍රමය මඟින් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත රැස් කෙරිණි. උඩරට, පහතරට හා සබරගමු වශයෙන් දේශීය නර්තනය ශෛලීය වශයෙන් වෙනස් වුව ද තෝරාගත් විහාර ද්විත්ත්වයේ බහුලව ඇත්තේ පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන වර්ග ය. නාග කන්‍යා, ගරා රාක්ෂ, මුදලි කෝලම ඊට නිදසුන් වේ. කළ, රබන්, කඩු නැටුම් ආදී ගැමි නැටුම් ද හඳුනාගත හැකි විය. උඩරට සම්ප්‍රදායට අයත් උඩැක්කි නර්තනය ඒ අතර විශේෂ ය. තුලනාත්මක අධ්‍යයනය මගින් විහාර ද්විත්වයේ ම සමාන නර්තන අංග සිතුවම් කොට ඇති බව අවධාරණය විය. පෙරහැර අවස්ථා නිරූපණයේ දී මෙම නර්තන අංග අන්තර්ගත කොට ඇත. වත්මන් පෙරහැරවල දැකිය නොහැකි බහුබූත කෝලම ඒ අතුරින් විශේෂ ය. සර්කස් සංදර්ශනයන්හි වත්මනයේ මෙය බහුල යෙදේ. නාග කන්‍යා, ගරා රාක්ෂ, බොරු කකුල් නැටුම වැනි අංග සැලකීමේ දී නූතනයේ භාවිත වන රංග වස්ත්‍රාභරණ අතර වෙනස්කම් ප්‍රකට විය.

දේශීය නර්තන අංග සඳහා විහාර බිතුසිතුම් කලාව තුළ වැඩි ඉඩක් වෙන් ව ඇති බවත්, ඒවා යම් යම් වෙනස්කම් සහිතව වර්තමානයේ දී භාවිත වන බවත් අධ්‍යයනයට ලක් වූ විහාර ස්ථානයන්හි බිතුසිතුවම්වලින් හඳුනා ගන්නා ලදී.

***ප්‍රමුඛ පදඃ*** *බිතුසිතුවම්, මහනුවර යුගය, නර්තනය, ආනුසංගික කලා*

[1] භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, nimeshamaduwanthianu@gmail.com

# ලාංකේය අංගම්පොර කලාව හා සිංහල නර්තන සම්ප්‍රදායන්හි සම්බන්ධය

**කේ. ඩබ්. ශානිකා නිර්මලී**[1]

ගෝත්‍රික මිනිසා සතුන් දඩයම් කිරීමෙන් ඔවුන්ගේ මූලික අවශ්‍යතාව වන ආහාර සපයා ගැනීම සිදුකරගෙන ඇත. සතුන් සමඟ ගැටුම් ඇති කර ගනිමින් ඔවුන් දඩයම් කර ගැනීමට දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස සටන බිහි වී ඇත. පිරිමි පක්ෂය විසින් සටන් කොට සොයා එන සත්ත්ව දඩයම විශාල ගිනිමැලයක පුළුස්සා ආහාර පිණිස අනුභව අනුභව කරන ලදී. සටන් කොට ගෙන ආ දඩයම සාමූහිකව සතුටින් භුක්ති විඳීමේ දී නැටුම බිහිව ඇති බැවින්, ලාංකේය සටන් කලාව සමඟ නර්තන සම්ප්‍රදායේ සම්බන්ධය ඈත අතීතයට දිව යන බැව් පෙනේ. මෙසේ පැවති ගෝත්‍රික සමාජය වර්ධනය වීමත් සමඟම පවුල, ආත්මාරක්ෂාව, මමත්වය, බලය පතුරුවා හැරීම ආදී වෙනත් අරගල ඇති විය. මෙහිදී ද පිරිමි පක්ෂය සටන් කළ අතර, කාන්තාවෝ ඊට සහාය දැක්වීමට හා ශක්තිය ලබා දීමට නොපෙනෙන බලවේගවල පිහිට පැතූහ. ඒ ඔස්සේ ශාන්තිකර්ම පැනනැගුණි. මෙසේ බලන කල ලාංකේය සටන් සම්ප්‍රදායන්හිත්, නර්තන කලාවේත් සම්බන්ධය මෑතකදී බිහිවූවක් නොව අතීතයේ සිටම මේ සබැඳියාව පැවති බව පෙනී යයි. මේ ද්විත්ව කලා අංගයන්හි සම්බන්ධය කෙසේ පවතින්නනේ ද යන්න සොයා බැලීම මෙහි මුඛ්‍ය පරමාර්ථයයි.

මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයනය යටතේ ද්විතීක මූලාශ්‍රය භාවිත කිරීමත්, ක්ෂේත්‍ර අධ්‍යයනය සම්මුඛ සාකච්ඡා ක්‍රමයන් පදනම් කරගනිමින් ප්‍රාථමික මූලාශ්‍රය භාවිත කරමින්ද මෙම පර්යේෂණය සිදුකරනු ලැබීය. අංගම් ඇදුරන් සම්මුඛ සාකච්ජාවට ද ලක් කරන ලදි. එදා මෙදා තුර සිංහල නර්තන කලාවේ මෙන්ම අංගම්පොර කලාවේ ද වෙනස්කම් ඔස්සේ අතීතයේ පැවති කලාංගයන්හි වර්ධනීය තත්ත්වයක් ඇතිවූවාසේම මෙම කලාංගයන්හි පරිහානියට එයම හේතු සාධක බවට පත් වී ඇත. කෙසේ නමුදු වර්තමානයේ මෙසේ පවතින මෙම කලාංගයක් අනාගත පරපුරට දායාද කිරීමේදී එහි පාරිශුද්ධත්වයට හානි නොකිරීමට කලාකරුවා වග බලාගත යුතු ය. මෙම කලාංගයක් සමාජගත කිරීමේදී තම පෞද්ගලික ලාභ අපේක්ෂාවන් නොතකා පොදු කලාවෙහි අභිවෘද්ධිය සඳහා කටයුතු කරන ශිල්පීන් පිරිසක් සිටින්නේ නම් මෙම කලාංග ද්විත්ත්වය ම සුපිරිසුදුව අනාගතයට දායාද වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *නර්තන, අංගම්පොර කලාව, සටන*

[1] **භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, nirmalishanika6@gmail·com**

# ඓතිහාසික ගලේ බණ්ඩාර දේවාලයෙහි ආගමික හා සමාජ සංස්කෘතික පසුබිම

**එස්. බී. එන්. අයි. යූ. සෙනෙවිරත්න**[1]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගරයේ පිහිටා ඇති "ඓතිහාසික ගලේ බණ්ඩාර දේවාලයෙහි ආගමික හා සමාජ සංස්කෘතික පසුබිම" අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙහිදී කුරුණෑගල රාජධානියේ ආරම්භය හා විකාශනය, ගලේ බණ්ඩාර දේවාලයේ භූගෝලීය පසුබිම, ඓතිහාසික වැදගත්කම, ඇත්කඳ රජමහා විහාරය හා සම්බන්ධතාව, කපු පරම්පරාව හා මුස්ලිම් පූජකවරුන් හා බැඳි දෙවොල පිළිබඳ විමසීමට ලක් කෙරිණි.

ප්‍රාථමික සහ ද්විතීය මූලාශ්‍රය පදනම් කරගෙන මෙම දත්ත රැස්කරන ලදි. මෙය ඇදහිලි හා විශ්වාස මුල්කොටගෙන සිදු කරන ලද කෘතියක් බැවින් මෙහිදී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ තොරතුරු රැස් කර ගන්නා ලදි. මීට අමතරව ග්‍රන්ථ පරිශීලනය හා සඟරා පුවත්පත් මඟින් ද මේ සඳහා තොරතුරු රැස් කොටගෙන ඇත.

කුරුණෑගල රාජධානියේ රාජ්‍යය පාලනය කළ මුස්ලිම් සම්භවයකින් එන වත්හිමි බණ්ඩාර රජු පිළිබඳව ඇති ඇදහිලි හා සංස්කෘතික වශයෙන් පවතින විශේෂත්වය ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. මෙහිදී වත්හිමි කුමරු ගලේ බණ්ඩාර දෙවියන් නමින් දේවත්වයට පත් වූ ආකාරය හා මුස්ලිම් හා සිංහල යන සංස්කෘතීන් දෙක අතර එම දෙවියන් පිළිබඳව පවතින දේව ඇදහිලි හා විශ්වාසයන් මෙහිදී අධ්‍යයනය කිරීමට හැකි විය. මෙම දේවාලය හා බැඳුණු ජනශ්‍රැතීන් පිළිබඳවත්, දේවාලය තුළ ගලේ බණ්ඩාර දෙවියන් සඳහාම පවත්වන කවි කෝල්මුර යාතිකා මෙන්ම චාරිත්‍ර විධීන් පිළිබඳවත් මෙම අධ්‍යයනය ඔස්සේ අවබෝධය ලබා ගැනීමට හැකි විය.

ගලේ බණ්ඩාර දෙවියන්ගේ මව්පියන් මුස්ලිම් හා සිංහල යන ලබ්ධීන් දෙකක නිසාවෙන්, ආගමික පුදපූජා පැවැත්වීමේ දී එක් එක් ආගමට අයත් ශාස්තෘවරුන්ගේ මඟ පෙන්වීම්වලට අනුව දේවාලය තුළ පුදපූජා පවත්වනු ලැබේ. කෙම්මුර දිනයන්හි පූජා මෙන්ම, වාර්ෂිකව පවත්වන මංගල්‍යයන් හා පුදපූජා විධීන්වලින් සමන්විත වන අතර එම මංගල්‍යයන් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කිරීමට මෙම අධ්‍යයනයෙන් හැකි විය. සමස්තයක් ලෙස මෙම දේවාලය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් ඓතිහාසික ගලේ බණ්ඩාර දේවාලයෙහි පවතින ආගමික මෙන්ම සමාජ හා සංස්කෘතිය දත හැකි විය. මෙහිදී මුස්ලිම් හා සිංහල සංස්කෘතීන් දෙක තුළ එක් දෙවියකු පිළිබඳ පවතින විශ්වාසය හා පුදපූජා රටාව පිළිබඳව අදහසක් ලබා ගැනීමට ද හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *ඉස්ලාම්, ඓතිහාසික, සංස්කෘතික*

[1] **භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, karunarathnesupun@gmail.com**

# විවාහය සඳහා උඩරට මුල් ඇඳුම භාවිතය පිළිබඳ වත්මන් සමාජ ආකල්පය

**එච්. පී. අරුණි සුලෝචනා**[1]

අතීත මානවයාගේ සංස්පර්ෂණයට ලක් වූ ද්‍රව්‍ය, ශේෂ හා ලිඛිත මූලාශ්‍රය විචාරශීලී ලෙස ඓතිහාසික අධ්‍යයනයන්ට භාජනය කිරීමෙන් ඔවුන්ගේ භෞතික හා සංස්කෘතික සංවර්ධනය පිළිබඳ මැන බැලීම ඉතිහාස ශික්ෂණයේ එක් පැතිකඩකි. පුරාතන ජනතාවගේ ඇඳුම් පැළඳුම් සමාජ සංස්කෘතිය පිළිබිඹු කරන එක් සාධකයකි. ඒ අතර උඩරට මුල් ඇඳුම් කට්ටලය ලාංකේය අනන්‍යතාව විද්‍යමාන කෙරෙන ප්‍රබල සංස්කෘතික මානයකි. මෙය දේශීය ප්‍රභවයක් සහිත දෙව් කෙනෙකු ලෙස පිළිගැනෙන "දැඩිමුණ්ඩ දෙවියන්ගේ " ඇඳුම් කට්ටලය ලෙස ද ව්‍යවහාර වේ. උඩරට මුල් ඇඳුම් කට්ටලය රජුගේ සිට රජයේ අමාත්‍ය මණ්ඩලය දක්වා ක්‍රමික ව ගලා ආවකි. දකුණු ඉන්දියානු සහ යුරෝපියානු ආභාසය මත ප්‍රභවය ලත් මෙම ඇඳුම් කට්ටලය වත්මන් විවාහ සම්ප්‍රදාය තුළ ජනප්‍රිය අංගයක් බවට පත් ව ඇත. විවාහ සම්ප්‍රදාය තුළ උපයුක්ත කර ගන්නා මෙම මුල් ඇඳුම හා සබැඳි වත්මන් සමාජ පසුබිම පිළිබඳ ව තුලනාත්මක ව විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අභිප්‍රාය වේ. ඒ අනුව මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය අධ්‍යයනයත්, ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා පදනම් කරගනිමින් මෙම පර්යේෂණය සිදුකරනු ලැබීය.

ක්‍රි. ව. 1701න් පසු කාල වකවානුව තුළ නායක්කාරවංශික කාන්තාවන් විවාහපත් දිනයේ දී තම ස්වාමිපුරුෂයාගේ තේජස් භාවය උද්දීපනය කරනු වස් මෙම ඇඳුම් කට්ටලය භාවිත කරන ලදී. එය වත්මන් විවාහ සම්ප්‍රදාය දක්වා කාලානුරූපී ව වෙනස්කම් සමුදායකට භාජනය වෙමින් පැවත එන්නකි. කුල ස්තරායනයට නතු වූ සමාජ පසුබිම තුළ නිර්මිත මෙම ඇඳුම් කට්ටලය වත්මන වන විට ප්‍රදර්ශනාත්මක අංගයක් බවට පත් ව ඇති බැව් විද්‍යමාන වන්නකි. සරල ආකාරයෙන් ගොඩනැගුණු මෙකී සංස්කෘතිකාංගයෙහි වර්ණ සුභාවිත කිරීම, කලාංග භාවිතය, චාරිත්‍ර වාරිත්‍ර ආදී වූ පැතිකඩයන් කෙරෙහි වත්මන් පරපුරෙහි අවබෝධතා ඥානය ඉතා අල්ප ය. සෙංකඩගල පුරවරයට පමණක් සීමා වී තිබූ උඩරට මුල් ඇඳුම වර්තමානය වන විට ලාංකේය සමාජ සන්දර්භය පුරා ව්‍යාප්තව පවතින අතර ප්‍රදර්ශනාගාර රැසකින් සමන්විත ය. විදේශිකයන්ගේ විවාහ අවස්ථාවලදී ද මෙම ඇඳුම් කට්ටලය භාවිත කිරීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතී. වෙනස් වන සමාජ තත්ත්වය අරබයා සංස්කෘතිකාංගයන්හි වෙනස්වීම් සිදු වුව ද හුදු අලංකාරය හා වාණිජත්වය මත පමණක් පදනම් නොවිය යුත්තකි. ආගමික ප්‍රභවයක් මත සම්භවය ලද මෙම උඩරට මුල් ඇඳුම් කට්ටලය වර්තමානයේ වාණිජත්වය හා සුසංයෝග වූ ප්‍රදර්ශනාත්මක අංගයක් පමණක් බවට පත්වූවක් බැව් මෙම පර්යේෂණය තුළින් නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** *උඩරට, මුල් ඇඳුම, සාම්ප්‍රදායික, සංස්කෘතික, වාණිජ*

---

[1] **භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, arunisulochana25@gmail.com**

# අපරාධය පිළිබඳ බෞද්ධ විග්‍රහය; විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

**තලගස්පේ සුමංගල හිමි**[1]

බුදුදහමට අනුව අපරාධකරුවන් යැයි ජන කොටසක් නොමැත. අපරාධ සඳහා මූලික වන්නේ කිලිටි වූ පුද්ගල මනෝභාවයන් ය. අපරාධය පිළිබඳ බෞද්ධ විග්‍රහය තුළ වත්මන් සමාජයේ ප්‍රශ්නගත තත්ත්වයන් මඟහරවා ගැනීමට සහ වඩාත් යහපත් සමාජයක් නිර්මාණය කරගැනීමට අවැසි නිවැරැදි, නිරවුල්, ප්‍රබුද්ධ මඟ පෙන්වීමක් අන්තර්ගත වේ. එය අපරාධය පිළිබඳ සිදු කරන ලද දාර්ශනික විවරණයකි. ධර්මයෙන් පරිබාහිර වූ නීතියක් පිළිබඳ ව පරමාදර්ශී සමාජයක් තුළ සාකච්ඡා කළ නො හැකි ය.

මෙම පර්යේෂණය අපරාධය හා සබැඳි මූලික සංකල්ප සතරකින් යුක්ත වේ. අපරාධය පිළිබඳ බෞද්ධ විග්‍රහය පාදක කොටගනිමින් ඊට අනුගත නීතිය, අධිකරණය සහ දඬුවම පිළිබඳ බෞද්ධ විග්‍රහය දැක්වීම මෙහි අරමුණ විය. බුදුසමය, ව්‍යවහාරික විෂය ක්ෂේත්‍රයන් හා තුලනාත්මක ව අධ්‍යයනය කරමින් බුදුසමයේ ප්‍රායෝගික ඥාන සම්භාරය ගෙන හැර දැක්වීම පර්යේෂණ අධ්‍යයනයේ පරමාර්ථය විය. මුඛ්‍යාර්ථ සාධනය පිණිස සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් සංගෘහීත කරුණු දක්වන ලදී.

පර්යේෂණයේ සමස්ත විග්‍රහයට අනුව බෞද්ධ නීතියට අනුකූල ව නීතිය ගොඩනැගෙන ප්‍රධාන මූලධර්මය වන්නේ බෞද්ධ අධිකරණය යි. කායික දණ්ඩනයෙන් තොර වූ ආධ්‍යාත්මික සංවර්ධනයක් අපේක්ෂිත මානසික දණ්ඩනය පමණක් අනුමත කරන බෞද්ධ අධිකරණය නෛතික විනිශ්චය පිළිබඳ ප්‍රබුද්ධ ප්‍රකාශනයක් ලෙස හඳුනාගත හැකි ය. බෞද්ධ සම්ප්‍රදාය මඟින් භික්ෂුව කේන්ද්‍ර කරගනිමින් සංඝාධිකරණ ඉදිරිපත් කළ ද එහි ආදර්ශය සමස්ත සමාජය ම ඉලක්ක කොටගත්තකි.

බුදුදහම අනුමත කරන්නේ පුද්ගල හිංසනයෙන් තොර දණ්ඩන ක්‍රමවේදයකි. එය මානව දයාවෙන් යුක්ත වූ පුද්ගල ශික්ෂණ පිළිවෙතකි. දඬුවම යනු පලිගැනීමේ අරමුණින් සිදු කළ යුත්තක් නො වේ. එය අපරාධ පාලනය හා නිවාරණය අරමුණු කොටගනිමින් ක්‍රියාත්මක විය යුත්තකි. දඬුවම පිළිබඳ බුදුසමයේ අවසන් විග්‍රහය පුද්ගල සංවර්ධනය හා සමාජ යහපත බවත් පරිසමාප්ති වශයෙන් වටහාගත යුතු ය. බෞද්ධ අධිකරණ, නීතිය සහ දඬුවම පිළිබඳ දැනුම් පද්ධතිය ව්‍යවහාරික ආයතනයන්හි ක්‍රියාකාරීත්වය කෙරෙහි යොදාගන්නේ නම් ඒවායෙහි පවත්නා ගැටලු නිරවුල් කරගැනීමට ඉතා පහසු වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *බුදුසමය, ධර්මය, නීතිය, අපරාධය, අධිකරණය, දඬුවම*

[1] අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, **t.sumangala.1991@gmail.com**

# A Critical Study of the importance of Meditation as a Psychotherapeutic Methodology

**L. Aloka Rashmi Liyanage**[1]

Psychotherapy is a popular Subject in the modern world. It is the practical part of psychology. There are so many definitions for Psychotherapy in different texts. According to the Oxford Advanced Learner's Dictionary, Psychotherapy is the treatment of mental illness by discussing somebody's mental problems with them rather than by giving them drugs. The Buddhist psychotherapy is becoming popular in the modern world day by day because of its practical value. Meditation is to upgrade the mind. The meaning of the word *Bhāvana* is improving the mind. Meditation is the process of purifying the mind from great hatred and delusion. Meditation helps us make our mind for better position

The research methodology involves historical analytical and comparatives study with the primary and secondary Sources of information. The researcher will do several observations in the field of psychotherapy with the Buddhist monks of the university. The research problem is to investigate what is the value of meditation as a Buddhist Psychotherapeutic method among the concept of Buddhist Psychotherapy to prevent from the mental intoxicants in the present. The objectives are **to** identify the Buddhist Psychotherapy, identify the basic psychotherapeutic concept in the Buddhist meditation, find out the different types of mental intoxicants in the present, find out the relevance of Buddhist psychotherapy for the day today lives of the people in the present, Discover the practical usage of Buddhist psychotherapy for solving the mental intoxicant in the present.

The mental intoxicants are the main Social issue in the modern world. The psychologists find out the solutions for different types of mental problems. Then this study is a significant one because it reveals the value of Buddhist psychotherapy to the modern world to create a healthy mind of the man.

***Key Words:*** *mental intoxicants, meditation, psychotherapy, mental problems*

[1] **Department of Pali and Buddhist Studies, alokarasgo@gmail.com**

# "Beyond the Puff; A Comparative Study of the Representation of the Dandy in Selected Silver Fork Novels of 1825-1840"

**R. M. Wijayawardhana**[1]

While it is an undisputed fact that the Dandy was indeed an exclusive phenomenon whose very existence and pride depended on this sense of exclusivity, the traditional definition limits the Dandy to only a sense of ostentatious existence. The Dandy is not portrayed as a thinking, feeling, human being with emotions primarily, but is projected as one who chooses to dress differently and be exclusive within the Aristocracy as a mere agent of the counter response to Drudgism, and a vacant being void of self.

Thus this study aims to challenge this traditional definition of the Dandy by engaging in a detailed analytical comparative study of the Dandy in selected Silver Fork Novels of the Silver Fork Society of Fashionable Life and Literature between 1825 and 1840. While subverting Thomas Carlyle's traditional definition of the Dandy is not possible, for, it does bear merit to a certain extent, I intend on highlighting the possibility of expansion, to this definition of the Dandy. By investigating and highlighting the humane qualities of the Dandy that Carlyle seems to gloss over, and calling for their inclusion in the ideology of the Dandy, in making one view the Dandy not only in terms of the externalities that the Dandy projects by virtue of his exclusive identity in manner of dress, but mostly, as a being not void of emotion and self as generally depicted, one can infer that the Dandy is indeed far more than what he is accorded to be.

It is to thus to assert a sense of inclusion, ironically in this exclusive set of character, in arguing that the Dandy is not merely an ostentatious "Clothes-wearing man" but a man with emotion and varied ideology, character and even form, no doubt made distinct by virtue of his dress and manner - which is a contributory feature to the identity of the Dandy, but not the **only** feature (as expostulated by Thomas Carlyle and the Theorists who follow) in the portrayal of the Dandy, with particular reference to key Silver Fork Novels of 1825-1840.

***Key Words:*** *Dandy, Victorian, Silver Fork Novel, Aristocracy, Regency*

[1] **Department of English, rakitha_mario@hotmail.com**

# A Corpus Based Study on the Most Frequently Used Medically Relevant Content Words of Human Anatomy

**Sakunthala Dilrukshi[1]**

Corpus Linguistics is considered as one of the main branches in linguistics, which has gained an excessive popularity among linguists as well as many other researchers. As John Sinclair (2005) says, a corpus is "a collection of pieces of language text in electronic form." It gives access to a lot of findings about a particular language variety or a discipline. According to Biber (2005), although people have strong intuitions about language use, sometimes those intuitions can be wrong. Thus, based on this idea, the research problem was identified as instances of wrong or different intuitions about a language variety or a discipline. With a further study of the research problem, it was identified that the intuition of people about the most frequently-used words in a particular discipline and the collocations of those words can be easily wrong or very different to the real situation. Thus, the research question was set as to identify the most frequently-used medically relevant content words in one of the widely-studied disciplines of Medicine, Human Anatomy. As the research sample, two main text books that are prescribed in many countries for Human Anatomy were selected while balancing and representing the whole scope of the discipline. Then, with the assistance of one of the most reliable corpus analysis tools, Antconc, the next step was to design and compile the corpus. After the compilation, the size of the corpus was 205088 words within which 10593 word types were identified as the words that usually occur in Human Anatomy. Finally, the most frequently-used content words with their collocations could be identified and analysed clearly, proving that with the access to this corpus, it will be convenient for any student or researcher to do further studies on linguistics as well as on the particular discipline.

***Key Words:*** *Linguistics, Corpus, Content Words, Frequency, Collocation*

[1] **Department of English, saku.dilru@gmail.com**

# Horcruxes and Rings: Power and the factory genre in relation to the concept of the soul through the Faucauldian lens

**S. Vishmi Wijerathne**[1]

The fantasy genre can be considered as one of the most widely read genres in literature: it is popular for its representation of power. However, in comparison to its readership, the scholarship of it is significantly less, and the overall perception of the genre is that it represents power in a negative light. This dissertation provides an alternate view of power. It aims to examine the representation of power in the fantasy genre in relation to the concept of soul, through Foucauldian concepts of power. The fantasy genre will be represented by the series: *Harry Potter 1997-2007 (HP*) and *Lord of the Rings 1954-55 (LOTR)*. The two series would be textually analysed using the Foucauldian concepts: "The soul is the prison of the body" *(Discipline and Punish 1975),* "power is everywhere" *(The History of Sexuality 1976)* and the interdependence between knowledge and power (*The History of Sexuality 1976).* Through the analysis of power as represented in *HP* and *LOTR* the study shows that the fantasy genre does not look at power in a singular manner but providing an alternative outlook. Therefore, the study, by shedding light to the nuances of power present in society, contributes to the scholarship on the Fantasy genre.

***Key Words:*** *Fantasy, Power, Soul, Discourse, Resistance*

[1] **Department of English, wvishmi@yahoo.com**

# University Undergraduates' Involvement in Leftist Insurrections: AnAnalysis of Selected English Novels Written by Sri Lankan Authors

**G. A. R. C. Jayarathna[1]**

The 1971 and 1987/89 leftist insurrections that had befallen during the post-independence Sri Lanka are considered as paramount occurrences in the history of youth rebellions. This thesis specifically focuses on university undergraduates' involvement in the1971 and 1987/89 leftist insurrections, as their involvement has created a tremendous impacton Sri Lankan society. The analysis is based on the aforementioned phenomena, as represented in selected English novels written by Sri Lankan authors. The corpus includesEdiriweera Sarachchandra's Curfew and a Full Moon (1978), Shavindra Fernando's The Vague Poetess (1999), and Nihal de Silva's The Giniralla Conspiracy (2005); three mainstream novels that specifically represent university undergraduates' involvement in the 1971 and 1987/89 leftist insurrections, which originated against the order of the state. Eventhough several novels have been written on the 1971 and 1987/98 insurrections by Sri Lankan authors, there have not been enough studies done on those novels, except for a very few. Thisphenomena has been looked at in diverse points of view by various scholars and authors previously, but it has not been looked at solely through the aspect of 'classes and class struggle' which stems from Karl Marx's theory of Marxism, and the aspects of 'disciplinarypower' and 'power as repression' which stem from Michel Foucault's theory of Biopolitics.The purpose of this thesis is to explore the two issues: university undergraduates' involvement in leftist insurrections as a reaction to division of social classes in society, anduniversity undergraduates' involvement in leftist insurrections as a reaction to the control of body movements, through the abovementioned Marxist and Foucauldian conceptualizations,as represented in the selected novels. The study concludes how power and the differences in the social class have ultimately resulted in reducing Sri Lanka to a state of anarchy, as a consequence of massive violence and repression exerted over citizens of the country.

***Key Words:*** *Leftist insurrection, Power, Class struggle, Repression, Discipline*

[1] **Department of English, rishinij4@gmail.com**

# History, Archaeology and Geography

# ඩී. එම්. ද ඉසෙඩ් වික්‍රමසිංහ මහතා විසින් ශ්‍රී ලංකාවේ අභිලේඛන ක්ෂේත්‍රයට දක්වන ලද දායකත්වය පිළිබඳ විමර්ශනයක්

**ජී. පී. සී. අමාලි**[1]

බොහෝ විද්වතුන් ඉතා දුෂ්කර ක්ෂේත්‍රයක් යැයි අවධානය යොමු නොකළ "අභිලේඛන ක්ෂේත්‍රය" තුළම ජීවත් වෙමින් ඊටම ආලය කරමින් නිහඬ සේවයක් ඉටු කළ ශ්‍රී ලංකාවේ පහළ වූ ශ්‍රේෂ්ඨ අභිලේඛනඥවරයෙකු ලෙස ඩී. එම්. ද ඉසෙඩ් වික්‍රමසිංහ මහතා හඳුන්වා දිය හැකිය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමඟ සිදු වූ බෙල් හා වික්‍රමසිංහ හමුව වික්‍රමසිංහයන්ට අභිලේඛන ක්ෂේත්‍රය තුළ දීර්ඝ ගමනකට දොරටු විවර කරන ලදි.

මෙතුමා අභිලේඛන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ලබා දුන් දායකත්වය මෙතෙක් ලාංකේය සමාජයේ අවධානයට ලක් නොවීම මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත් වී ඇත. ඒ අනුව පර්යේෂණ අරමුණු හරහා ඉසෙඩ් වික්‍රමසිංහ මහතාගේ ජීවන තොරතුරු හා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඔහුගෙන් ලැබුණු දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සිදුවේ. දත්ත රැස් කිරීම ප්‍රධාන වශයෙන් ලිඛිත මූලාශ්‍රය හා ක්ෂේත්‍ර ගවේෂණය යටතේ සිදුවිය.

පර්යේෂණයේ දී මෙතුමාගේ ජීවන තොරතුරු පිළිබඳ මෙතෙක් අනාවරණය නොවූ පෞද්ගලික තොරතුරු අනාවරණය විය. ඉංග්‍රීසි, සංස්කෘත, ජර්මන්, තෙලිඟු, දමිළ, පාලි ආදී භාෂා විශාරදයෙකු වූ මෙතුමා තනතුරු කිහිපයක් දැරුව ද එතුමාගේ වෘත්තීය ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත් වූයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ වීමයි. එහිදී සෙල්ලිපි කියවා අර්ථ දැක්වීමට වඩා සෙල්ලිපි කාලනිර්ණය කිරීම, අක්ෂර හඳුනා ගැනීම, ඓතිහාසික කරුණු ඉස්මතු කිරීම හා නව ශාස්ත්‍රීය මත ඉදිරිපත් කිරීම තුළින් මෙතුමා අභිලේඛන ක්ෂේත්‍රය තුළ ඉදිරි පියවරක් තබන්නට වූයේය. ඒ හරහා බිහිවූ "එපිග්‍රැපියා සෙලනිකා" ග්‍රන්ථය එතුමාගේ අභිලේඛන දැනුමෙහි සාරය කැටිකොට ගත් උපරිම ඵලය විය. මෙය නවීන පර්යේෂණ පිළිබඳ පුහුණුව නොලත් අයට නව කරුණු මගින් ඉතිහාසය නැවත ගොඩනංවාගැනීමට කදිම මාර්ගයක් වන බව නිසැකය. එතුමාගේ ලක්දිව පැරණි ලියවිලි සඟරාවද සාමාන්‍ය ජනයා වෙත අභිලේඛන දැනුම බෙදාහැරීමත්, පසුකාලීනව සිංහල භාෂාවෙන් රචිත සෙල්ලිපි ග්‍රන්ථ බිහි වීමටත් මූල බීජය වූ බව හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *වික්‍රමසිංහ, අභිලේඛන, භාෂාව, කාලනිර්ණය*

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, **chethanaamali03@gmail.com**

# ඌව පළාතේ පැරණි ලෝහ තාක්ෂණය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**ආර්. එම්. ඒ. එම්. කේ. රත්නායක**[1]

සීගිරිය අලිගල, අලකොළවැව, අනුරාධපුර ඇතුල්නුවර, රිදීගම, සමනළවැව වැනි ප්‍රදේශවල කරන ලද පර්යේෂණ මගින් හමුවූ යකඩ නිෂ්පාදනාගාර පිළිබඳ තොරතුරු මගින් ශ්‍රී ලංකාවේ අතීත යුගයේ වාසය කළ මානවයාට ලෝහ තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබූ බවට තොරතුරු හමු වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ "ලෝහ තාක්ෂණය" සම්බන්ධ පර්යේෂණවල දී අවධානයට ලක් නොවූ ප්‍රදේශයක් ලෙස ඌව පළාත හඳුනාගැනීමට හැකි විය. එබැවින් ඌව පළාතේ භාවිත සාම්ප්‍රදායික යකඩ කර්මාන්තයේ විශේෂතාවක් තිබේද යන ගැටලුවට පිළිතුරු ලබාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ඌව පළාතේ පැරණි ලෝහ තාක්ෂණය භාවිත කර ඇති ප්‍රදේශ හඳුනාගැනීම සහ පැරණි ශිල්ප ශ්‍රේණි හා ඔවුන්ගේ සමාජ පසුබිම හඳුනා ගැනීම ඊට සමගාමීව සිදු කෙරුණි.

දත්ත රැස්කිරීම් දී ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා හා විද්‍යාගාර පරීක්ෂණ මගින් මෙන්ම සාහිත්‍ය මූලාශ්‍රය, ජනප්‍රවාද, අභිලේඛන, අන්තර්ජාල තොරතුරු යන මූලාශ්‍රය ඔස්සේ ද තොරතුරු අධ්‍යයනය කරන ලදි.

මෙම පර්යේෂණයේ දී හඳුනාගත් වැදගත්ම ප්‍රතිඵලය වන්නේ, ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ඌව පළාතේ ස්ථාන පහකින් හඳුනාගත් යපස්/යබොර නියදි වේ. හල්දුම්මුල්ල-වැළිජිය, හල්දුම්මුල්ල-අඹගහවේල්ල, බුත්තල කුකුරම්පොල, බල්ලකෙටුව, හාලිඇල කැටවල යන ස්ථානවලින් එම නියැදි හමුවිය. එම නියැදි විද්‍යාගාර පරීක්ෂණවලට යොමු කිරීමෙන් එහි අන්තර්ගත රසායනික සංයුතිය පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකි විය. ඌව පළාත තුළ වර්තමානයේ දී ලෝහ කර්මාන්තවලට සම්බන්ධ නිෂ්පාදන මූලවල ව්‍යාප්තිය පිළිබඳව ද තොරතුරු ක්ෂේත්‍ර අධ්‍යයන මගින් හඳුනා ගැනීමට හැකිවිය.

ඌව පළාතේ අතිත යකඩ කර්මාන්තය ආශ්‍රිතව භාවිතයට ගත් සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රමශිල්ප දිවයිනේ වෙනත් ප්‍රදේශවල භාවිත සම්ප්‍රදායික තාක්ෂණයට සාපේක්ෂව සුවිශේෂිතාවක් ගෙන තිබුණේ නැති බව මෙම පර්යේෂණයේ දී අනාවරණය විය. ක්ෂේත්‍ර අධ්‍යයන මගින් හඳුනාගත් සාධකවලට අමතරව පුරාවිද්‍යාඥයන්ගේ ඇසට හසු නොවූ සාධක වැලලී ගොස් ඇති බව තහවුරු වූ අතර ඌව පළාතේ තිබෙන එවැනි පැරණි පුරාවිද්‍යා සාධක අනාගතයේ දී විධිමත් පර්යේෂණයන්ට යොමුවිය යුතු බවද සඳහන් කළ යුතුය.

***ප්‍රමුඛ පදඃ*** *ලෝහ තාක්ෂණය, යකඩ, ඌව පළාත, පුරාවිද්‍යා සාධක*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, anupamarathnayaka22@gmail.com**

# අභයගිරිය හා ජේතවනාරාමය යන විහාරාරාමයන් තුළ ජල කළමනාකරණය සඳහා පොකුණු භාවිතය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**බී. වී. ඒ. මධුවන්ති**[1]

අනුරාධපුරය පුරාණ රජරට ශිෂ්ටාචාර සමයට අයත් වැදගත් අගනගරයකි. බුදුදහම හඳුන්වාදීමත් සමග අනුරාධපුර රාජකීය ඇතුළු නුවර වටා රාජ්‍ය අනුග්‍රහය ඇතිව මහාවිහාර සම්ප්‍රදායට අයත් විහාරාරාම නිර්මාණය විය. මහාවිහාරය, අභයගිරිය, ජේතවනාරාමය ඒ අතර ප්‍රධාන වේ. දේවානම්පියතිස්ස රජු විසින් (ක්‍රි. පූ. 250-210) ඉදිකරන ලද පළමු විහාරාරාමය වන්නේ මහාවිහාරයයි. අනතුරුව වට්ටගාමණී අභය රජතුමා විසින් (ක්‍රි. පූ. 89-77) අභයගිරි විහාරය ද මහසෙන් රජු විසින් (ක්‍රි. ව. 276-303) ජේතවන විහාරය ද කරවන ලද්දේය. පසුකාලීනව එම විහාරාරාම විවිධ රජවරුන්ගේ අනුග්‍රහය යටතේ දියුණුවට පත් විය. එහි දී බෝධිඝර, පටිමාඝර, උපෝසථාගර හා දානශාලා වැනි විවිධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ මෙන් ම පොකුණු ද නිර්මාණය විය.

අනුරාධපුර රාජධානි සමයේ මිනිසා සිය ජල අවශ්‍යතාව සපුරා ගැනීමට පොකුණු නිර්මාණය කිරීමේ දී ජල කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වා තිබේ. එම අංශයන් අධ්‍යයනය සඳහා අභයගිරිය හා ජේතවනය යන විහාරාරාම පරිශ්‍රවලින් පොකුණු කිහිපයක් තෝරාගන්නා ලදී. ලිඛිත මූලාශ්‍රයන් හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් පොකුණුවල කාර්යභාරය හා නිර්මාණය කිරීම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදය ද විමසා බැලීම පර්යේෂණ අරමුණු අතර වේ.

විහාරාරාමවල පොකුණු නිර්මාණය වීමට ප්‍රධානතම හේතුව වූයේ භික්ෂූන්ගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමය. මීට අමතරව ස්නානය කිරීම ආදී වෙනත් අවශ්‍යතා සඳහාත්, අධික උෂ්ණත්වය පාලනය කර පරිසරය සිසිල් කර ගැනීම මෙන්ම අපතේ යන ජලය රඳවා තබා ගැනීම ආදී විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහාත් පොකුණු නිර්මාණය විය. පිහිටීම ගැන අවබෝධයෙන් යුක්තව භූමියේ බෑස්ම හඳුනාගෙන ජලය උස් භූමියේ සිට ක්‍රමයෙන් රැගෙන ගොස් පොකුණු නිර්මාණය කරන ලදී. පොකුණු නිර්මාණය කිරීමේදී භූමිය තෝරාගැනීම, ස්වාභාවික සම්පත් පරිහරණය, වෑද්දුම් ශිල්පය හා මිණුම් ක්‍රම ආදී තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත කර ඇති බව පර්යේෂණයේ දී හඳුනා ගැනීමට හැකිය. එමෙන්ම පොකුණු විවිධ හැඩයෙන් හා විවිධ ප්‍රමාණයන්ගෙන් ද, ගැඹුරු හා නොගැඹුරු ලෙසින් ද නිර්මාණය කර තිබුණි. තව ද පිටතින් අතිරේක ජලය ගෙන ඒම සහ වැඩි ජලය පිට කිරීමට ක්‍රමවේදයන් මෙන් ම, ජල ප්‍රේරක ක්‍රම ද පොකුණු තුළට පහසුවෙන් බැසීමට අවශ්‍ය පසුබිම ද සලකාබලා පොකුණු නිර්මාණය සිදු කර තිබෙන බව අධ්‍යයනය තුළින් පැහැදිලි විය.

***ප්‍රමුඛ පද:*** *අභයගිරිය, ජේතවනය, පොකුණු, අවශ්‍යතාව, තාක්ෂණික*

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, **anushkamadu@gmail.com**

# ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

**බී. එස්. එච්. සේනාරත්න**[1]

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ ඇරඹෙන යටත් විජිත යුගය යුරෝපා අධිරාජ්‍යවාදී බලවේගත්‍රයක් මගින් පාලනය වූ වූවකි. වර්ෂ 1505 සිට 1948 දක්වා වූ මෙම කාල පරිච්ඡේදය තුළ පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යන බලවේග තත්කාලීන ව පැවැති දේශපාලන, ආර්ථික, ආගමික, සමාජ හා සංස්කෘතික යන සෑම අංශයක ම දිශානතිය වෙනස් කරන්නට විය. කාලානුරූපී ව මෙරට සමාජයේ මුල් බැසගෙන තිබූ ආයුර්වේදය ක්‍රමයෙන් යටපත් කරමින් බටහිර වෛද්‍ය ක්‍රම එකී ස්ථානයේ තබමින් මෙරට බටහිර වෛද්‍ය ක්‍රමය සංස්ථාපනය කරන්නට යුරෝපීයයෝ උත්සාහ කළ හ. එලෙසින් පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යන ජාතීන් මෙරටට හඳුන්වා දුන් වෛද්‍ය ක්‍රම, ඔවුන්ගේ ප්‍රතිපත්ති හඳුනා ගනිමින් ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනීය අවස්ථාවන් හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

ඉහත දැක් වූ අරමුණු සාධනය කර ගනු වස් යොදා ගත් ශිල්පීය ක්‍රමවේද කීපයකි. එහිදී පුස්තකාල අධ්‍යයනයක් මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදුකරන ලදී.

බ්‍රිතාන්‍යයන් විසින් බටහිර වෛද්‍ය විද්‍යාවෙන් ලංකාවට හඳුන්වා දෙනු ලැබූ වෛද්‍ය ක්‍රම හා ප්‍රතිපත්ති පෘතුගීසි හා ලන්දේසීන්ගේ අවධීන්ට සාපේක්ෂ ව ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා දායක වී ඇති බව මෙයින් ගම්‍ය වූ එක් ප්‍රධාන කරුණක් වන්නේ ය. මෙම කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ බලය අත්පත් කර ගත් යුරෝපා ජාතීන්ගේ වෛද්‍යමය කාර්යයන්හි එක් එක් අවධීන්හි විෂමතාවන් පෙන්නුම් කෙරේ. මෙකී විෂමතාවන්ට ඔවුන්ගේ මව් රාජ්‍යයේ වෛද්‍යමය ක්‍රියා පටිපාටිය සාකල්‍යයෙන් ම ඉවහල් වූ බව පර්යේෂණයේ දී අනාවරණය විය. සමස්තයක් වශයෙන් අනාවරණය වූ තොරතුරු අනුව නිගමනය කළ හැකි වන්නේ ඕනෑම රටක ඕනෑම අවධියක දී පොදු ජනතාව උදෙසා සෞඛ්‍යමය කටයුතු ක්‍රමවත් ව හා විධිමත් ව ලබා දීමට නම් තත්කාලීන ව රටේ ව්‍යාප්ත ව පවතින ආගම් හා පවතින පාලන තන්ත්‍රයේ ස්ථාමය ඍජු දායකත්වය පැවතිය යුතු බවය.

***ප්‍රමුඛ පදඃ*** *සංස්ථාපනය, ආයුර්වේදය, ප්‍රතිපත්ති, ප්‍රගමනය, ස්ථාමය*

---

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, mohanchathuranga0505@gmail.com**

# මහනුවර යුගයේ විහාර සිතුවම් තුළින් පිළිබිඹුවන දේශීය ඇඳුම් නිර්මාණ

**ආර්. ඩී. සුභාෂිණී ප්‍රියංගිකා**[1]

ශ්‍රී ලාංකේය අවසාන රාජධානි සමය වූ මහනුවර යුගය මෙරට පෙරළිකාර යුගයක් ලෙස සඳහන් කළ හැකිය. පෘතුගීසි, ලන්දේසි, හා ඉංග්‍රීසි ආදී බටහිර ජාතීන්ගේ පමණක් නොව මුස්ලිම්, බර්ගර්, මැලේ වැනි විවිධ සුළු ජාතිකයින් පවා මෙරට සමග සමීප සබඳතා පවත්වා ගත්හ. මහනුවර රාජධානියේ අවසාන පාලකයා බවට පත්වන්නේ ද භාරතයේ නායක්කර් වංශිකයෙක් ය. මහනුරව රාජධානිය තුළ සැබැවින් ම රජකළේ ශ්‍රී ලාංකිකයන් නොව විදේශීය ජනයා යැයි සඳහන් කිරීම නිවැරදි ය. මේ සියලු ජාතීන්ගෙන් මිශ්‍ර වීමෙන් සකස් වූ නව සංස්කෘතියක් 18 - 19 වන සියවස් තුළදී ලංකාව තුළ හැඩගැසී පැවතිනි. එනිසා ම ශ්‍රී ලාංකිකයන් බටහිරකරණයට ලක්වීමට ගත වූයේ සුළු කාලයකි. එහි ප්‍රතිඵලය වූයේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, ආගම, භාෂාව පමණක් නොව මෙරට වැසියන්ගේ සිතුම් පැතුම් පවා වෙනස්වීමට භාජනය වීමයි. එකී වෙනස බාහිරව දැකිය හැකි ලක්ෂණයක් වූයේ ඇඳුමයි. සියලු ජාතීන්ගේ සංස්කෘතිකාංගවලින් යුක්ත ඇඳුම් කලාවක් මහනුවර යුගයේදී ඇතැම් දේශීය කොටස් විසින් අනුකරණය කරන්නට විය. එය විලාසිතාවකට වඩා අන්‍ය ජාතීන් කෙරෙහි ගැති බව ප්‍රකට කරන්නක් විය.

මෙවැනි පසුබිමක නිර්මාණය වන මහනුවර සිතුවම් කලාව එකල සමජ පසුබිම ජීවමානව ප්‍රකට කරන්නට කරන්නකි. මේ නිසා ම බෞද්ධ සිතුවම් කලාව විසින් යටපත්ව තිබූ බෞද්ධ සංස්කෘතිය නැවත නගා සිටුවන්නට උත්සාහ කළහ. බුදු දහමින් පෝෂණය වී තිබූ සිංහල සභ්‍යත්වය බටහිර ජාතීන් විසින් නිහඬ කළ ද බෞද්ධ සිතුවම් කලාව විසින් නැවතත් දේශීයත්වය ගොඩනැගීමට උත්සාහ කළේ එම සිතුවම් නිර්මාණයේ දී දේශීය ඇඳුම් නිර්මාණ එක් කිරීමෙනි. මෙහි පර්යේෂණ ක්‍රම වේදය වනුයේ මහනුවර යුගයෙහි නිර්මාණය කරන ලද බෞද්ධ සිතුවම් නිර්මාණය කොට ඇති විහාරස්ථාන අධ්‍යයනයයි. පර්යේෂණ ගැටලුව වනුයේ මෙම සිතුවම් නිර්මාණයට යොදා ගනු ලැබ ඇත්තේ ජාතක කතා, බුද්ධ චරිතයෙහි විවිධ අවස්ථාවන් ය. ඒවා ඉන්දියානු පරිසරයක් තුළ සකස් වූ ඒවා ය. නමුත් චිත්‍ර ශිල්පීන් ඒවා නිර්මාණය කිරීමේදී දේශීය ඇඳුම් යොදා ගනු ලැබුවේ ඇයි ද යන්නයි.

මහනුවර චිත්‍ර සම්ප්‍රදායට අයත් විහාර සිතුවම්හි වස්තු විෂය ඉන්දියානු සමාජ පරිසරයක් තුළ නිර්මාණය වූ ජාතක කතා වුවත්, දේශීය චිත්‍ර ශිල්පීන් සිතුවම් නිර්මාණය කිරීමේදී දේශීය ඇඳුම් ද භාවිත කරගෙන චිත්‍ර නිර්මාණය කොට ඇති බව නිගමනය කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** *මහනුවර යුගය, සිතුවම්, විහාර, දේශීය, සංස්කෘතිය*

[1] **පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, vurdsjp@gmail.com**

# තෝරාගත් මූලාශ්‍රය ඇසුරින් සීතාවක ඓතිහාසිකත්වය පිළිබඳ අධ්‍යයනයක්

**එම්. හර්ෂි ප්‍රේෂලා**[1]

සබරගමු බස්නාහිර පළාත්වලට මැදිව, අවිස්සාවේල්ල නගරයට ආසන්නයෙන් සීතාවක ගං නිම්නයේ පිහිටි මෙම සීතාවක රාජ්‍ය ලංකා ඉතිහාසයේ වැදගත් කාලපරාසයකි. මෙම පර්යේෂණය හරහා තෝරාගත් සාහිත්‍යය මූලාශ්‍රය මඟින් හෙළිවන සීතාවක ඓතිහාසිකත්වය පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. ජනප්‍රවාද අනුව රාවණා රජ දවස තෙක් මෙහි ඉතිහාසය දිවයන අතර මෙම සීතාවක ප්‍රදේශය ලංකා ඉතිහාසයේ වැදගත් තැනක් හිමි කර ගනු ලබන්නේ ක්‍රි. ව. 1521 සිදු වූ විජයබා කොල්ලයත් සමඟය. එම සිදුවීමත් සමඟ නිර්මාණය වූ සීතාවක රාජධානිය මායාදුන්නේ හා රාජසිංහ යන පිය පුතු දෙදෙනා විසින් ඉමහත් දියුණුවකට පත් කරන ලදි.

මෙම පර්යේෂණයට අදාළ තොරතුරු සාහිත්‍යය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනය කිරීම තුළින් රැස්කෙරුණි. මෙහිදී තෝරාගත් සාහිත්‍යය මූලාශ්‍රය ආශ්‍රය කොට ගෙන ප්‍රධාන වශයෙන් තොරතුරු අනාවරණය කරගත් අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය ආදිය භාවිත කරමින් ද තොරතුරු ලබා ගන්නා ලදි.

සීතාවක රාජ්‍ය ආරම්භයත් එහි විවිධ අවස්ථාවන්හි බලය වර්ධනය කරගත් ආකාරයත් අවසන් කාලයේ මෙම සීතාවක රාජ්‍යට එල්ල වූ අභියෝගයන් සමඟ නිර්මාණය වූ යුධමය වාතාවරණය මැද සීතාවක රාජ්‍යයේ ආර්ථිකය, සමාජය හා ආගම නිර්මාණය වූ ආකාරය පිළිබඳවත් මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. සීතාවක රාජ්‍ය පරංගින් සහමුලින්ම මෙරටින් පන්නා දමා ලංකාව එක්සත් කර ගැනීම අරමුණු කොට ගෙන තම දිවි නොතකා සටන් වැදුණු අභිමානවත් සිංහල රාජ්‍යයකි. පළමුවන රාජසිංහයන් තම දිවියම මෙම සටන්වලට යොමු කරනු ලැබුහ. රාජසිංහ රජු පෘතුගීසීන්ට මෙන් ම තමාට එරෙහි වූ ඕනෑම අයෙකුට දඬුවම් දීමට දැඩිව ක්‍රියාත්මක විය. මෙම ක්‍රියාවන් පදනම් කරගෙන සීතාවකට එල්ල කරනු ලබන ඇතැම් චෝදනාවන් පදනම් විරහිත බව පෙනේ.

මෙම පර්යේෂණය හරහා එළඹිය හැකි නිගමනය වන්නේ රාජසිංහ රජු ශිව ආගම වැළඳගත් පමණින් මෙම රාජ්‍ය බුදුදහම විනාශ කිරීමට උරනොදුන් බවයි. තවද සීතාවක රාජ්‍ය ලංකා ඉතිහාසයේ අතිශ්‍ය ව්‍යාකූල දේශපාලන වටපිටාවක් පැවති සමයක නැගී සිටි අභිමානවත් රාජ්‍යයක් බවයි.

***ප්‍රමුඛ පදඃ*** *සීතාවක රාජ්‍යය, මායාදුන්න, පළමුවන රාජසිංහ, ශිව ආගම*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, nishaniroshan12345@gmail.com**

# යුරෝපීයන් යටතේ ශ්‍රී ලංකාවේ භාවිත ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ පිළිබඳ අධ්‍යයනයක් (කළුතර දිස්ත්‍රික්කය ඇසුරින්)

**ජේ. සී. පී. ජයවීර**[1]

ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණයන්හි ඉතිහාසය මිනිස් ඉතිහාසය තරම් ඈතට දිව යන්නක් වේ. ගෘහ සහ ජීවනෝපාය කාර්යයන් සඳහා උපකාරි වූ මෙවලම් ගෘහ උපකරණ නම් වේ. පෙර අපර දෙදිග සෑම රටකම පාහේ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ නිෂ්පාදනය අතීතයේ සිටම පැවතී තිබේ. ශ්‍රී ලංකාවේ ද දේශීය සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ ගැබ් වී ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ කලාවක් පැවතී ඇත. මෙලෙස පැවති දේශීය කලාව යුරෝපීයන් මෙරට යටත්කර ගැනීමත් සමඟ විවිධ වෙනස්කම්වලට භාජනය විය.

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් යුරෝපීයන් යටතේ ශ්‍රී ලංකාවේ භාවිත ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ මොනවාද යන්න සහ භාවිත අමුද්‍රව්‍ය, තාක්ෂණය, උපයෝගීතාව හා සුවිශේෂ ලක්ෂණ කවරේ ද යන්න කළුතර දිස්ත්‍රික්කය ඇසුරින් අධ්‍යයනයට භාජනය වුණි. පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් යොදාගත් අතර ක්ෂේත්‍ර අධ්‍යයනය කළුතර දිස්ත්‍රික්කයේ දක්නට යුරෝපීය පාලන සමයට අයත් වලව්, විහාරස්ථාන හා ක්‍රිස්තියානි දේවස්ථාන ඇසුරින් සිදුකරන ලදි. වර්තමානයේ ඉතා අඩු වලව් ප්‍රමාණයක් හා ගෘහ භාණ්ඩ ප්‍රමාණයක් පැවතීම අධ්‍යයනය සීමා වන්නට හේතු වීය.

එහිදී යුරෝපීය ගෘහ භාණ්ඩ හා උපකරණ බහුලව හමුවූයේ වලව්වලිනි. භාවිත අමුද්‍රව්‍ය මොනවාද යන්න අවධානය යොමු කිරීමේදී කාබනික අමුද්‍රව්‍ය ලෙස විවිධ ශාකවල ලී වර්ග, වේවැල්, රෙදි ද, අකාබනික අමුද්‍රව්‍ය ලෙස තඹ, රිදී, යකඩ, පිත්තල ආදි ද්‍රව්‍ය භාවිත කර ඇත. එමෙන්ම එම ගෘහ භාණ්ඩ හා උපකරණ විවිධ උපයෝගීතාවන් සඳහා භාවිත කර තිබෙන අයුරු නිරීක්ෂණය විය. නිර්මාණ තාක්ෂණය කෙබඳු ද යන්න විමසා බැලීමේ දී ගෘහ භාණ්ඩ නිර්මාණයේ දී මානව මිතිය අනුව නිර්මාණය කර තිබේ. සෑම ගෘහ භාණ්ඩයක් ම අලංකාර කැටයමින් යුක්ත වේ. මල්කම්, ලියකම්, ලාංඡන, සත්ව රූප කැටයම් අතර වේ. මේවායේ කකුල් විවිධ ප්‍රමාණයෙන් සහ විවිධ හැඩයෙන් යුක්ත වේ. කොටස් එකිනෙක සම්බන්ධ කිරීමට ලී ඇණ බහුලව භාවිතකර ඇත. තබන භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා අලංකාර, විවිධ කැටයම් සහිත යතුරු තහඩු, සරනේරු දක්නට ලැබේ. ගෘහ උපකරණ සඳහා ද විවිධ නිර්මාණ ක්‍රමවේද යොදාගෙන ඇති බව ද අනාවරණය කරගත හැකිවිය.

**ප්‍රමුඛ පද:** *යුරෝපීයන්, ගෘහ උපකරණ, ගෘහ භාණ්ඩ, තාක්ෂණය, කැටයම්*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, piyojayaweera@gmail.com**

# උඩරට දුම්රිය ගමන් මාර්ගයේ කාර්මික පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක් (පොල්ගහවෙල සිට බදුල්ල දක්වා)

**ඩබ්. එම්. අයි. මධුවන්ති**[1]

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ වතු වගාවන් පහසු කර ගැනීම සඳහා හඳුන්වා දුන් දුම්රිය තාක්ෂණය නිසා ශ්‍රී ලංකාවට කාර්මික උරුමයන් රැසක් දායාද විය. ඒ අනුව උඩරට දුම්රිය මාර්ග පද්ධතියේ පොල්ගහවෙල සිට බදුල්ල දක්වා වූ කොටස තුළ දක්නට ලැබෙන කාර්මික පුරාවිද්‍යාවට අයත් අංග පිළිබඳව මූලික අධ්‍යයනයක් මෙහිදී සිදුකෙරුණි. කාර්මික උරුමයන් සම්බන්ධව අධ්‍යයනය මෙරට වැඩි වශයෙන් සිදුනොවීම තුළ උඩරට දුම්රිය මාර්ගය හා බැඳුණු ඉතිහාසය අනාගතයට උරුම කිරීම ගැටලු සහගත තත්ත්වයකි. මෙම පර්යේෂණයෙන් ඉහත ගැටලු මඟහරවා උරුමය ආරක්ෂා කර ගැනීමට අදාළ පසුබිම සැකසීම අරමුණ වීය.

මෙහි දී දත්ත එක් රැස් කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් තොරතුරු ලබා ගැනීම සිදුකරන ලදී. එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය සඳහා සිතියම්, ඡායාරූප, සැළසුම් ආදිය ද භාවිත කරන ලදී.

උඩරට දුම්රිය ගමන් මාර්ගයේ පොල්ගහවෙල සිට බදුල්ල දක්වා ගමන් මාර්ගය අධ්‍යයනය කිරීමේ දී එම දුම්රිය මාර්ගය දෙපසින් කාර්මික උරුමයන් රැසක් අධ්‍යයනය කිරීමට හැකිවිණි. එහිදී වාස්තු විද්‍යාව, සිවිල් ඉංජිනේරු පුරාවිද්‍යාව, සන්නිවේදනය, යාන්ත්‍රික උරුමයන් යන අංශ යටතේ අධ්‍යයනය කිරීම සිදුවිය. වාස්තු විද්‍යාව යටතේ දුම්රිය නැවතුම්පොළ, ධාවනාගාර, සංඥාකුටි, බඩු ගබඩා සහ නිළ නිවාස පිළිබඳව අධ්‍යයනය කළ අතර ඒවා තවමත් වර්තමාන ජන ජීවිතය හා මුසුව ක්‍රියාකාරී මට්ටමේ පවතින උරුමයන් බවට තහවුරු කර ගත හැකිවිය. සිවිල් ඉංජිනේරු පුරාවිද්‍යාව යටතේ එකල පැවති ප්‍රාථමික තාක්ෂණය උපයෝගි කර ගනිමින් කන්ද උඩරට මාර්ගයේ පැවති භූ විෂමතාව ජය ගැනීම උදෙසා බිම්ගෙවල් හා පාලම් ඉදිකිරීමේ දී එකල අනුගමනය කළ ක්‍රියාවලිය පිළිබඳව හා සන්නිවේදනය යටතේ ටැබ්ලට් සංඥා ක්‍රමය, සෙම්ෆෝ සංඥා ක්‍රමය නූතනයේ උඩරට මාර්ගයේ භාවිත කරන බව අවබෝධ කරගත හැකිවිය.

එහෙත් මෙම උරුමයන්ගේ පුරාවිද්‍යාත්මක අගය විධිමත් ආකාරයෙන් හඳුනා නොගැනීම නිසා විනාශයට පත් වෙමින් පවතී. ඒ පිළිබඳව බලධාරීන්ගේ නිසි අවධානය යොමු වීමෙන් අනාගතය සඳහා එම ස්මාරක ආරක්ෂා කර ගැනීමට හැකිවනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *උඩරට, දුම්රිය මාර්ගය, කාර්මික පුරාවිද්‍යාව*

---

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, **iresha9277madu@gmail.com**

# බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකිරීම් පිළිබඳ වාස්තු විද්‍යාත්මක අධ්‍යයනයක් (නුවරඑළිය දිස්ත්‍රික්කයේ තෝරාගත් ගොඩනැගිලි කිහිපයක් ඇසුරින්)

**ජේ. එම්. ලියනගේ**[1]

බ්‍රිතාන්‍යයන් මෙරට බලය පිහිටුවා ගැනීමෙන් පසු වතුවගාවේ ඇති වූ දියුණුවත් සමග වැවිලිකරුවන්ගේ හා බ්‍රිතාන්‍ය පාලකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ විවිධ ඉදිකිරීම් සිදුකරන ලදි. එම වාස්තු විද්‍යාත්මක නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ තිබේ ද යන්නත් සමකාලීනව බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවේ සෙසු ප්‍රදේශවල ඉදිකරන ලද ගොඩනැගිලිවලට වඩා එම ඉදිකිරීම්වල සුවිශේෂත්වයක් දිස්වන්නේ ද යන්නත් ගැටලුව ලෙස ගොඩනගා ගෙන පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණය සිදු කරගෙන යාමේ දී ක්ෂේත්‍ර ගවේෂණයක් හා ක්ෂේත්‍ර නොවන ගවේෂණයක් සිදු කරන ලදී. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ගවේෂණය කරමින් අධ්‍යයනය කළ අතර ක්ෂේත්‍ර නොවන ගවේෂණය යටතේ පුස්තකාල පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. පර්යේෂණය සිදුකර ගෙන යාමේ දී එය පියවර දෙකක් යටතේ සිදු කළ අතර පළමු පියවර යටතේ බ්‍රිතාන්‍යය අවධියේ ගොඩනැගිලි පිළිබඳව අධ්‍යයනයක් හා දෙවන පියවර යටතේ එහි වාස්තු විද්‍යා ලක්ෂණ පිළිබඳවත් අධ්‍යයනය කළේ ය.

වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එක් එක් ගොඩනැගිලි ඉදිකිරීමේ දී අවකාශය භාවිත කිරීම ආගමික, වාණිජමය, පෞද්ගලික ආදී ඉදිකිරීම් කෙසේ සිදුකර ඇත්දැයි හා එහි භාවිත කරන ලද එකිනෙකට වෙනස් ගෘහ නිර්මාණ ලක්ෂණයන් මොනවාද යන්න අධ්‍යයනයට ලක් කරන ලදී.

පොදුවේ එම ගොඩනැගිලිවල වාස්තු විද්‍යා ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ගොතික් වාස්තු විද්‍යා ශෛලිය, පුනරුද යුගයේ වාස්තු විද්‍යා ශෛලිය, ටියුඩර් වාස්තු විද්‍යා ශෛලිය යන බ්‍රිතාන්‍යය වාස්තු විද්‍යා ශෛලීන් භාවිත බව අනාවරණය විය. අලංකරණ රටාවන්වල දී නිරන්තරව ගොතික් ශෛලියේ දෙව්මැදුරුවල භාවිත වූ මෝස්තර හා කැටයම් රටාවන් හා ගොඩනැගිලි ඉදිකිරීමේ දී සම්ප්‍රදායයක් වශයෙන් එංගලන්තයේ ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා භාවිත කර ඇති අමුද්‍රව්‍යයන් ම භාවිත කර තිබුණි. නුවරඑළිය ජනාධිපති මන්දිරය, හැටන් නැෂනල් බැංකුව, පොලිස් අධිකාරී කාර්යාලය යන ගොඩනැගිලිවල මෙම වාස්තු විද්‍යා ලක්ෂණ ඉතා හොඳින් දක්නට ලැබුණි. ආගමික ඉදිකිරීම්වල දී බ්‍රිතාන්‍යයන් එරට භාවිත කරන ලද සැළසුම් හා ගෘහ නිර්මාණ ලක්ෂණයන් ඒ ආකාරයෙන් ම භාවිත කරමින් නිර්මාණය කර තිබුණු අතර අනෙකුත් ඉදිකිරීම්වල දී එම ලක්ෂණ ආභාසයට ගෙන දේශීය වශයෙන් වූ දේශගුණික, කාලගුණික හා භූ භෞතික තත්ත්වයන්ට ගැළපෙන ආකාරයෙන් එය නිර්මාණය කර තිබුණි.

***ප්‍රමුඛ පද:*** *නුවරඑළිය, වාස්තු විද්‍යාව, බ්‍රිතාන්‍ය යුගය, ඉදිකිරීම් ශෛලිය*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, jeewa91liyanage@gmail.com**

# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුගයේ නිර්මාණය කරන ලද ආරුක්කු පාලම් පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්. කේ. ටී. ලක්මාලි**[1]

ලංකාව බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත්වීමෙන් අනතුරුව වතු වගාව දියුණු වීමත් සමඟ මෙරටට ක්‍රමවත් මාර්ග පද්ධතියක් අවශ්‍යතාව මතු විය. එහිදී කොළඹ සිට කන්ද උඩරට කේන්ද්‍රගත වු ප්‍රථම මහාමාර්ගය නිර්මාණයේ දී හමුවන ජලදුර්ග, ගිරිදුර්ග තරණය කිරීමට පාලම් නිර්මාණය කිරීම බ්‍රිතාන්‍ය පාලකයින්ගේ සතු ප්‍රධාන කාර්යභාරයක් විය. ඒ අනුව නව ආරකින් යුත් ආරුක්කු පාලම් ආකෘතිය මෙරටට දායාද විය.

රළු භූ විෂමතා ලක්ෂණ හමුවේ මුල්කාලීනව මහමාර්ග නිර්මාණයේ දී ද අනතුරුව දුම්රිය මාර්ග නිර්මාණයේ දී ද දැකිය හැකි ආරුක්කු පාලම් විශේෂය වූයේ උළුවම් ආරුක්කු පාලම්ය. මෙම පාලම් බහුතරය මහාමාර්ගයන්හි හමුවේ. වර්තමානය වන විට ආරුක්කු පාලම් දුර්වල වීම හා ප්‍රතිසංස්කරණයට ලක් වීම හේතුවෙන් මුල් ප්‍රමාණයන් හා සැලසුම් පැහැදිලි නොවුණ ද මෙවැනි පාලම් 145 කට ආසන්න ප්‍රමාණයක් මහාමාර්ග පද්ධතියේ පවතින බවට අනාවරණය කර ගෙන තිබේ. විදේශීය සභ්‍යත්වයක් හරහා මෙරට ඉදි වූ මෙම පාලම් අතර මාවනැල්ල ආරුක්කු පාලම, නානුඔය පාලම, දෙමෝදර ආරුක්කු පාලම ආදි පාලම් බටහිර ඉංජිනේරු තාක්ෂණය අධ්‍යයනයට වැදගත් මූලාශ්‍රයෝ වෙති. බ්‍රිතාන්‍යයන් යටතේ නිර්මාණය වු සුවිශාල නිර්මාණාංග අතර ප්‍රධාන තැනක් ආරුක්කු පාලම්වලට ද හිමි වුවද වර්තමානයේදී ඒ පිළිබඳ අවධානය අඩු ය. එබැවින් බ්‍රිතාන්‍යය සමය තුළ ලංකාවේ ඉදි කරන ලද ආරුක්කු පාලම් හඳුනා ගනිමින් එහි වු ඉදි කිරීම් තාක්ෂණික ලක්ෂණ තුළින් එහි පවතිත වැදගත්කම පෙන්වා දීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

මෙහිදී සාහිත්‍ය මූලාශ්‍රය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ආදී ක්‍රමවේද භාවිත කරමින් ආරුක්කු පාලම් පිළිබඳ තොරතුරු රැස් කරනු ලැබීය. මේ අනුව ලංකවේ පවතින රළු භූගෝලීය ලක්ෂණයන් පවතින ස්ථාන කෙරෙහි පමණක් ප්‍රමුඛ අවධානය යොමු කර අවශ්‍යතාවට අනුරූපව මනා කළමානකාරිත්වයකින් යුතුව කාලානුරූපව විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් පාලම් නිර්මාණයට බ්‍රිතාන්‍ය ඉංජිනේරුවන් උත්සුක වූ ආකාරයක් හඳුනා ගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** *බ්‍රිතාන්‍යය, ආරුක්කු පාලම්, තාක්ෂණය, දෙමෝදර*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, whtlakmali@gmail.com**

# පුරාවස්තු සංරක්‍ෂණ ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනයක්

**ජී. පී. යමසිංහ**[1]

වර්තමානය වන විට පුරාවිද්‍යාව යනු ශාස්ත්‍රීය අධ්‍යයනයක්ය යන මතයෙන් දුරස්ථ වෙමින් එය බහු විෂයාත්මක පදනමක් ඇති විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයක් ය යන අදහසට බොහෝ උගත්තු එළඹෙමින් සිටිති. මෙම මතවාදය සැබෑ කරමින් පුරාවිද්‍යාවේ බොහෝ කාර්යයන් සඳහා ශාස්ත්‍රීය විෂයයන්ගේ මෙන්ම විද්‍යා විෂයයන්ගේද සහාය ලබා ගන්නා අතර පුරාවිද්‍යාත්මක සංරක්‍ෂණය එවැනි එක් අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. "සංරක්‍ෂණය" පුරාවිද්‍යාවේ විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අතරම ඉන් පුරාවස්තු සංරක්‍ෂණය ප්‍රධාන තැනක් ගනී.

පුරාවස්තු සංරක්ෂණයේ දී පුරාවස්තුන් දිරාපත්වීම අවමකර, එහි ආයුකාලය වැඩිකර ඒ තුළින් එකී උරුමය අනාගත පරපුරට උරුමකර දීම සඳහා අවශ්‍ය වටපිටාව සකසා දීමක් කරනු ලබයි. මෙම භාරදූර කර්තව්‍යය පැවරී ඇති පුද්ගලයා සංරක්ෂකයා වන අතර ඔහු පුරාවස්තුව පිළිබඳ හොඳින් අධ්‍යයනය කර බලා ඊට ගැලපෙන ප්‍රතිකර්මය සිදුකරයි.

පුරාවස්තු පවතින පරිසරයේ ස්වභාවය හා එය නිර්මිත අමුද්‍රව්‍ය මෙන්ම පුරාවස්තුවේ ව්‍යුහාත්මක ස්වරූපය මත පුරාවස්තුන් සංරක්‍ෂණය කරනු ලබන ආකාරය එකිනෙකට වෙනස් වන අතර මෙම පර්යේෂණය තුළින් පුරාවස්තු සංරක්‍ෂණයට අදාළව යොදා ගන්නා සංරක්‍ෂණ ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරීම කරනු ලබයි. විශේෂයෙන්ම ගොඩබිම පවතින පුරාවස්තු සංරක්ෂණය කරනු ලබන ආකාරයට වඩා වෙනස් ක්‍රමවේද දියයට පවතින පුරාවස්තු සංරක්ෂණය කිරීමේ දී යොදා ගනියි. දිය යට පවතින පුරාවස්තුන් අතර මුහුදු පුරාවස්තුන් විශේෂිතයි. මෙහි දී ගොඩබිම හා මුහුදු පරිසරයේ තිබී හමුවන පුරාවස්තුන් අතරින් තෝරාගත් පුරාවස්තු කිහිපයක් ආශ්‍රයෙන් සංරක්‍ෂණයට අදාළව සංරක්‍ෂකයින් විසින් භාවිත කරනු ලබන සංරක්‍ෂණ ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනය කිරීම කරන ලදී. මෙහි දී පුරාවස්තු සංරක්ෂණයේ ඉතිහාසය, පුරාවිද්‍යාවේ විද්‍යාත්මක පදනම පිළිබඳව, පුරා සංරක්‍ෂණයට අදාළ තොරතුරු මෙන්ම පුරාවස්තුන්ගේ හායනයට බලපාන හායන කාරක හා ඒවා පාලනයට අදාළව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ද අවධානය යොමු විය.

ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාල පරිශීලනය, සම්මුඛ සාකච්ඡා, විද්‍යාගාර පරීක්ෂණ අධ්‍යයනය මඟින් මේ සම්බන්ධ තොරතුරු ලබා ගන්නා ලදී. පුරාවස්තු සංරක්ෂණය යන්න විද්‍යාත්මක කාර්යයක් වන බවත් එය ඉතාමත් ඉවසීමෙන් ප්‍රගුණ කළ යුතු දෙයක් බවත්, පුරාවස්තු සංරක්‍ෂණයේ වාසි මෙන්ම අවාසිද පවතින බව නිගමන යටතේ හඳුනාගත හැකිවිය.

***ප්‍රමුඛ පද:*** *සංරක්‍ෂණය, පුරාවිද්‍යාව, පුරාවස්තු, ක්‍රමශිල්ප*

---

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, gayagayani74@gmail.com**

# භූමියේ අස්ථායීතාවට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක් (හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

**එච්. එම්. ඩී. මධුමාලි[1]**


ගෝලීය වශයෙන් මානව ක්‍රියාකාරකම් බිහිවූ දා සිටම ලෝකයේ විවධ භූ අස්ථාවර තත්වයන් ඇති වී තිබෙන බව හඳුනාගත හැකිය. දකුණු ආසියානු කලාපයේ රටවල් බොහෝමයක් මේ තත්ත්වයන්ට මුහුණ දී ඇති අතර ශ්‍රී ලංකාව ගත් විට ලංකාවේ කඳුකර ප්‍රදේශ ආශ්‍රිත කලාප රැසක් මේ තත්ත්වයන්ට ගොදුරුවී තිබේ. ශ්‍රී ලංකාවේ භූ අස්ථාවර තත්ත්වයන් සිදුවන දිස්ත්‍රික්ක කිහිපයක් හඳුනාගෙන ඇති අතර මේ අතරින් බදුල්ල දිස්ත්‍රික්කය විශේෂ වේ. බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් භූමියේ අස්ථායිතාව නිසා වැඩි බලපෑමක් ඇති වී තිබෙන ප්‍රදේශයක් ලෙස හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හපුවලකුඹුර ප්‍රදේශය දැක්විය හැකිය.

ප්‍රදේශයේ භූමියේ අස්ථාවරත්වයට බලපාන සාධක අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වූ අතර භූමියේ අස්ථාවරත්ව ස්වභාවයන් හඳුනාගැනීම, ඒවාට බලපාන සාධක විමසා බැලීම සහ ඒවා අවම කිරීමට ගෙන ඇති උපායමාර්ග හඳුනා ගැනීම මෙහි සෙසු අරමුණු වූයේය.

ක්‍රමවේදයේදී හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් අතරින් භූමියේ අස්ථාවරබව පවතින වසම් අතරින් එකක් වන හපුවලකුඹුර වසම තෝරා ගන්නා ලදී. එහි මුලු පවුල් 640න් පවුල් 51ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. මේ සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික හා ද්විතීයික යන ක්‍රම දෙකට අනුව දත්ත රැස් කිරීම සිදු විය. රැස් කරගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක ක්‍රමයට හා ගුණාත්මක ක්‍රමයට විශ්ලේෂණය කර තිබේ. එසේ විශ්ලේෂණය කිරීමේදී සිතියම්, ප්‍රස්තාර, දත්ත වගු සහ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ආධාරයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

මෙහි අවසාන ප්‍රතිඵල වශයෙන් හඳුනාගත හැකි වූයේ මෙම ප්‍රදේශයේ භූමිය අස්ථායි වීමට වර්ෂාපතනය, භූ විෂමතාව, පස යන භෞතික සාධක ද අවිධිමත් ඉදිකිරීම් හා බෝග වගාව, කෘත්‍රිම පිපිරවීම්, වන විනාශය වැනි මානව ක්‍රියා ද හඳුනාගත හැකි විය. මේවා අවම කර ගැනීම සඳහා ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන උපායමාර්ග අනුගමනය කර ඇති අතර එහිදී බෑවුම්වල අස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු ආරක්ෂක බැම් යෙදීම, පඩිපෙළාකාර ලෙස කණ්ඩි කැපීම, බෑවුම්වල ජලය බැස යෑම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් සැකසීම, ස්වාභාවික ජලවහන රටාවන් අවහිර නොකිරීම, පරිසරාත්මක පාලනයක් සිදු කිරීම, ජනතාව දැනුවත් කිරීම සහ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කර ඇති ආකාරය හඳුනා ගන්නා ලදී.


***ප්‍රමුඛ පදඃ*** *භූමියේ අස්ථායිතාව, මානව, භෞතික, සාධක, ප්‍රදේශය*

---

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, dilaniherath1@gmail.com**

# යාල සංචාරක කලාපය ආශ්‍රිත පාරිසරික සංචාරක කර්මාන්තයේ උපනතීන් ගැටලු හා සංරෝධක

ඩබ්. පී. ඩී. සිල්වා[1]

ගෝලීය නව්‍යකරණයත් සමග විකල්ප සංචාරක කර්මාන්තය තුළ පරිසර සංරක්ෂණය, නැවුම් පාරිසරික සංචාරක ගමනාන්ත හඳුන්වාදීම වැනි උපනතීන් මෙන්ම සංචාරක කලාප ආශ්‍රයෙන් මානව මූලික මෙන්ම පාරිසරික ගැටලු වැනි ගැටලුකාරී තත්ත්වයන් ද නිර්මාණය වී තිබේ. නීතිරීති මගින් පාලනය කළ නො හැකි අභියෝගකාරී සංරෝධකයන් ද මේ ආශ්‍රිතව හඳුනාගත හැකි අතර නූතන සන්නිවේදන තාක්ෂණය ප්‍රබලතම සංරෝධක මෙවලමක් වී තිබේ. මෙවැනි පසුබිමක් තුළ යාල සංචාරක කලාපය පදනම් කරගත් විකල්ප සංචාරක කර්මාන්තය ආර්ථික සහ ප්‍රාදේශීය සංවර්ධනයට දක්වන සංවර්ධන විභවතාව හේතුවෙන් මෙම පර්යේෂණය පර්යේෂණාත්මකව සහ ගුණාත්මක වශයෙන් ඉහළ වැදගත්කමක් හිමිකර ගනු ලබයි.

මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ වී ඇත්තේ යාල සංචාරක කලාපය පාදක කරගනිමින් පාරිසරික සංචාරක කර්මාන්තයේ උපනතීන්, ගැටලු සහ සංරෝධකයන් අධ්‍යයනය කිරීමයි. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විකල්ප සංචාරක කර්මාන්තය ප්‍රචලිතව ඇති ග්‍රාම නිළධාරි වසම් 04ක් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබීය. සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ප්‍රජාව හා සංචාරකයින් ඇතුළත්ව 70 නියැදියක් අධ්‍යයනයට යොදාගනිමින් ප්‍රශ්නාවලි,සම්මුඛ සාකච්ඡා සහ ද්විතීයික මූලාශ්‍රය ඔස්සේ රැස්කරගත් දත්ත ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමශිල්ප ඔස්සේ විශ්ලේෂණය කර ඇත.

විශ්ලේෂිත දත්ත ඇසුරින් යාල වනෝද්‍යානයට සංචාරකයින්ගේ පැමිණීම 2010 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය වනවිට 55%කින් වර්ධනය වී තිබේ. සංචාරකයින්ගෙන් 70%ක් සංචාරක ගමනාන්තයක් වශයෙන් යාල වනෝද්‍යානය තෝරාගනුයේ දිවියන් නැරඹීමේ අභිරුචියෙනි. නියැදි දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව යාල ආශ්‍රිත පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රශස්ත ලෙස නංවාලීමට ප්‍රදේශයේ අනෙකුත් සංචාරක කලාප ප්‍රවර්ධනය කිරීම, වනෝද්‍යානයට ඇතුළුවීමේ විකල්ප ප්‍රවේශ දොරටු ස්ථාපිත කිරීම ඇතුළත්ව ප්‍රතිපත්තිමය වශයෙන් ගතයුතු පියවර මෙන්ම ආකල්පමය වශයෙන් පුරුදු කළයුතු යෝජනාවන් රැසක් පර්යේෂණය තුළින් ඉදිරිපත් කර ඇත.

***ප්‍රමුඛ පද:*** *පාරිසරික සංචාරක කර්මාන්තය, උපනතීන්, ගැටලු, සංරෝධක, යාල වනෝද්‍යානය*

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, poorni.shaani@gmail.com**

# කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඍතුමය පානීය ජල ගැටලුව කළමනාකරණය කිරීමෙහිලා ප්‍රජාමූලික ක්‍රමෝපායන්හි උපයෝගීතාව

**ඒ. සී. එන්. ජයසිංහ[1] සහ පින්නවල සංඝසුමන හිමි[2]**

ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් කලින් කලට උද්ගතවන පානීය ජල ඌනතාව හේතුවෙන් කිසියම් ප්‍රජාවක් මුහුණපාන විවිධ ආකාරයේ අර්බුද සහ අවදානම් තත්ත්වයන් ඍතුමය ජල ගැටලුව ලෙස හැඳින්විය හැකිය. එබඳු තත්තවයන් වඩාත් පීඩාකාරී පුළුල් තත්තවයක් දක්වා වර්ධනය වීමෙන් ආපදාවක් බවට පත් වෙයි. කළුතර දිස්ත්‍රික්කයේ ඍතුමය වශයෙන් වර්ෂාපතනය හිඟ කාලයේදී පානීය නල ජලයේ ලවණ සාන්ද්‍රණය අධික වීමෙන් අධික ජනතාවක් දීර්ඝ කාලයක් තිස්සේ මුහුණ දෙමින් සිටින ආපදා තත්ත්වයක් මෙම අධ්‍යයනය සඳහා පාදක වී තිබේ. තවමත් ස්ථිර විසඳුමක් ලබාගත නොහැකි වූ එම ආපදාව කළමනාකරණය කිරීමේදී පුද්ගලික සහ ප්‍රජා මට්ටමින් අනුගමනය කරන ක්‍රමෝපායන් හඳුනා ගැනීමත්, ඒවා කොතෙක් දුරට ඵලදායී වී තිබේදැයි විග්‍රහ කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණ වේ. අධ්‍යයනයේ ක්‍රමවේදය ගුණාත්මක දත්ත මත ගොඩනැගුණු එකකි.  නියැදිය වශයෙන් නළ ජලය භාවිත කරන කුටුම්භ 73 කගෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කොට ප්‍රතිඵල විග්‍රහ කර ඇත. ඒ අනුව 2002-2017 දක්වා වසර පහළොවක කාලය තුළ වර්ෂ අටකදී අවස්ථා නවයක් මෙම ආපදාවට ජනතාව මුහුණ පා ඇත. ඒ හේතුවෙන් උද්ගත වී ඇති අර්බුද අතුරෙන් ආර්ථික හා සමාජීය ගැටලු වඩාත් ප්‍රබල ය. වර්ෂාපතනය හිඟවීම, ගංගාවේ ජල භාරය ක්‍රමයෙන් අඩුවීම හා වඩදිය ඇතිවීම යන ස්වාභාවික සංසිද්ධීන් මෙම ගැටලුවට මූලික වශයෙන් හේතුවී ඇති නමුදු, අධික ලෙස වැලි ගොඩ දැමීම හා නළ ජලය අරපිරිමැස්මෙන් තොරව භාවිත කිරීම යන මානව සාධක ගැටලුව වඩාත් උග්‍ර කිරීමට හේතු වී තිබේ. මෙම ආපදා තත්ත්වයට මුහුණ දෙනු වස් අනුගමනය කර ඇති ප්‍රජාමූලික ක්‍රමෝපායන් අතර දුරින් පිහිටි ළිං වලින් සහ නළ ළිං මඟින් ජල අවශ්‍යතා සපුරා ගැනීම ප්‍රධානතම පියවර වේ. ආපදාවට පත් බහුතරයක් ආයතනික සහාය පමණක් අපේක්ෂා කරන බැවින් ප්‍රජා මූලික ක්‍රමෝපායන් සාර්ථක මට්ටමක නොපවතින බව නිගමනය කළ හැකිය. වර්තමානයේ දැඩි වෙමින් පවත්නා මෙම ආපදා තත්ත්වය නිසිලෙස කළමනාකරණය කිරීමේදී ප්‍රජාමූලික හා ආයතනික ක්‍රමෝපායන්හි ඒකාබද්ධතාවයෙන් ගොඩනැගිය යුතු කල්පවත්නා යාන්ත්‍රණයක් මෙම අධ්‍යයනය මඟින් යෝජනා කර ඇත.

***ප්‍රමුඛ පද:*** *ඍතුමය ජල හිඟය, ආපදා කළමනාකරණය, ප්‍රජාමූලික ක්‍රමෝපායන්, කළුගංගා ද්‍රෝණිය*

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, Chanakajayasinghe92@gmail.com**
[2] **ආචාර්ය, ජ්‍යෙ. කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

# සාඵල්‍යතාවයේ අවකාශීය විෂමතා පිළිබඳ අධ්‍යයනයක් (ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය හා වතු අංශය ඇසුරිනි)

**එම්. ඒ. එන්. පී. එම්. ආරච්චි**[1]

සාඵල්‍යතාව යනුවෙන් හඳුන්වන්නේ දරුවන් බිහිකිරීමේ ස්වාභාවික හැකියාවයි. මෙම පර්යේෂණයේ ග්‍රාමීය හා වතු අංශයේ සාඵල්‍යතාවයේ විෂමතා හඳුනා ගැනීම, ග්‍රාමීය හා වතු අංශයේ සාඵල්‍යතා විෂමතා කෙරෙහි බලපාන සාධක සොයා බැලීම, ග්‍රාමීය හා වතු අංශයේ සාඵල්‍යතා විෂමතා අවම කිරීමට ගතයුතු යෝජනා සොයා බැලීම යනාදිය අරමුණු වේ.

අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගනු ලැබුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අකරැල්ල ග්‍රාම නිලධාරී වසම වේ. අධ්‍යයනයට පවුල් 60ක නියඳියක් ලබා ගැනීම සිදුකරන ලදී. ග්‍රාමීය පවුල් 46ක්ද, වතු පවුල් 14ක්ද නියඳියට යොදාගැනුණි. ග්‍රාමීය හා වතු දෙඅංශයම මෙම වසමෙහි පදිංචිව සිටියි. පවුල් සෞඛ්‍ය නිලධාරිනියගේ නිරීක්ෂණ දත්තවලට අනුව වතු පවුල්වල දරුවන් 3 ට වැඩි ප්‍රමාණයක් සිටින නමුත් ග්‍රාමීය ප්‍රදේශවල දරුවන් සංඛ්‍යාව 3 ඉක්මවා යාමක් බොහෝ පවුල්වල දැකිය නොහැකිය. මේ අනුව සාඵල්‍යතා විෂමතා අධ්‍යයනය කිරීමට අකරැල්ල ග්‍රාම නිලධාරී වසම යෝග්‍ය වේ. සාඵල්‍යතාව තීරණය කරන බොහෝ සාධක පැවතුනද පළමු විවාහයට එළඹෙන වයස, පවුලක සිටින දරුවන් සංඛ්‍යාව, අධ්‍යාපනය, ආදායම, සෞඛ්‍ය, උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම යන සාධක ඔස්සේ සාඵල්‍යතා විෂමතා අධ්‍යයනය කෙරුණි. පළමු විවාහයට එළඹෙන වයස ගත්විට පාසල් අවධියේම වතු දරුවන් පළමු විවාහයට පත්වුවත් වර්තමානයේදී ග්‍රාමීය දරුවන් තරුණවිය ඉක්මවීමෙන් විවාහයට පත්වීමක් දැකගත හැකිය.  පවුලක සිටින දරුවන් සංඛ්‍යාව ගත්විට ග්‍රාමීය ප්‍රදේශවල වයස අවුරුදු 5ට අඩු දරුවන් සංඛ්‍යාව අඩු අතර වතු ප්‍රදේශවල කැපී පෙනෙන අඩුවක් නැත. අධ්‍යාපනය ගත්විට වතු දරුවන් බොහොමයක් වතු පාසලේ ඉගෙනුම ලබන අතර ඔවුන්ගේ අධ්‍යාපන ඉලක්කද අවමය. ග්‍රාමීය දරුවන් වැඩි පිරිසක් විභාග සමත්වීමෙන් ඉහළ අධ්‍යාපනයක් ලැබීම දක්නට ලැබුණි. ආදායම ගත්විට ග්‍රාමීය ජනතාව ලබාගන්නා ආදායම ක්‍රමානුකූලව වියදම් කරයි. එමෙන්ම රජයේ රැකියා කරන්නන්ගේ ප්‍රතිශතය වැඩිවීමෙන්ද ඔවුන්ගේ ආදායම ඉහළගොස් ඇත. වතු ප්‍රදේශවලට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය, උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම ඉහළය. මේ සාධක හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල සාඵල්‍යතාව වතු අංශයට සාපේක්ෂව අඩුබව නිගමනය කළ හැකිය. පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම, අමතර අධ්‍යාපනය ලබාගත හැකි ආයතන පිහිටුවීම, දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම යනාදී ක්‍රියාමාර්ග ගැනීමෙන් මෙම අවකාශීය විෂමතාව අවම කරගත හැකිය.

***ප්‍රමුඛ පද:*** *සාඵල්‍යතාව, අධ්‍යාපනය, විෂමතාව, ග්‍රාමීය*

[1] **භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, nilmini199111@gmail.com**

# වාර්ගික සංහිඳියාව බිඳවැටීම කෙරෙහි බලපාන සාධක (බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් සිදුකරන දේශපාලන භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්)

තිළිණි තුෂාරි[1] සහ පින්නවල සංඝසුමන හිමි[2]

මිනිස් පාරිසරික සබඳතා තුළින් නිර්මාණය වන රටා සහ ක්‍රියාවලීන් කාලයටත්, අවකාශයටත් අනුව වෙනස් වීමෙහිලා බලපාන සාධක අතුරින් පසුජාත (Post-birth) මානව ලක්ෂණ ද තීරණාත්මක ලෙස බලපායි. වාර්ගිකත්වය හා තදනුබද්ධ සංරචක හා ක්‍රියාවලීන් මානව අන්තර් සම්බන්ධතාවයේ වාස්තවික හා මනෝභාවාත්මක යථාර්ථයන් (Subjective and Objective realities) විශ්ලේෂණය කිරීමට උත්තේජකයක් වේ. තිස් වසරකට අධික කාලයක් පුරා පැවති යුද්ධයෙන් පීඩිත ව සිටි ශ්‍රී ලංකාවේ කලින් කලට විවිධ ප්‍රදේශවලින් මතුවන වාර්ගික ගැටුම් කෙරෙහි බලපා ඇති භූ දේශපාලනික සාධක මොනවාද? පශ්චාත් යුධ ගැටුම් සමය තුළ ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුම් නිවාරණය කිරීමෙහිලා වාර්ගික සංහිඳියාව ඇති කිරීමේ ක්‍රමෝපායන් මොනවාද? යන්න අවධානය යොමු කරමින් පර්යේෂණ ගැටලුව ගොඩනගා තිබේ. අධ්‍යයනයේ නියැදි ප්‍රදේශය වශයෙන් වරින් වර වාර්ගික ගැටුම් වාර්තා වී ඇති බේරුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ධර්ගානගරය හා තදාශ්‍රිත කලාපය නියැදි ප්‍රදේශය වශයෙන් තෝරාගන්නා ලදි. ජනවාර්ගික සංහිඳියාව බිඳවැටීම කෙරෙහි බලපානු ලබන සාධක විශ්ලේෂණය කර ප්‍රාදේශීය මට්ටමින් ජනවාර්ගික සුහදතාව ගොඩනැගීම සඳහා යෝග්‍ය ක්‍රමෝපායන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ක්‍රමවේදය මූලික වශයෙන් ගුණාත්මක ප්‍රවේශයක් මත පදනම් වී ඇති අතර, පොකුරු නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලද කුටුම්භ 120 ක් පදනම් කරගෙන සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන හා කෙටි ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස්කරන ලදි. අධ්‍යයනය මගින් හෙළිකරගත් කරුණු අතර, ප්‍රදේශයේ ජනවාර්ගික සංහිඳියාව බිඳවැටීම කෙරෙහි ප්‍රබල වශයෙන් ආගමික හේතු බලපා ඇති අතර ඒවා තීව්‍ර වීම කෙරෙහි අවස්ථාවාදී දේශපාලනික මැදිහත්වීම් ඍජු ලෙස දායක වී ඇත. ප්‍රතිචාරකයන්ගෙන් සාතිශය බහුතරයක් සිංහල සහ මුස්ලිම් ජනතාව සමගිව කටයුතු කිරීමේ වාසි රැසක් අවධාරණය කරයි. නමුත් ජනවාර්ගික සංහිඳියාව පවත්වාගෙන යාමෙහිලා මෙතෙක් අනුගමනය කර ඇති ආයතනික හා ප්‍රජා මූලික ක්‍රමෝපායන් පවතින්නේ ඉතා දුර්වල මට්ටමක ය. විසංගමන පොකුරු ආශ්‍රිතව ජාතීන් අතර සංහිඳියාව ඇති කිරිමෙහිලා පවතින ආකල්පමය බාධා කැපී පෙනෙතත් මිශ්‍ර කලාපවල සාධනීය ලක්ෂණ රැසක් පවතී. එම සාධනීය ලක්ෂණ වඩාත් ශක්තිමත් කර ජනවාර්ගික සංහිඳියාව ගොඩනැගීමෙහිලා යථාර්ථවාදී ප්‍රවේශයක් අනුගමනය කිරීමේ ශක්‍යතාව මෙම අධ්‍යයනය මගින් අවධාරණය කර ඇත.

***ප්‍රමුඛ පද:*** *වාර්ගික ගැටුම්, ජාතිය හා ආගම, සංහිඳියාව, ගැටුම් නිරාකරණය, භූ දේශපාලනය*

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, **thilinithushar@gmail.com**

[2] ආචාර්ය, ජ්‍යෙ. කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

# වෙරළාශ්‍රිත ක්ෂුද්‍ර භූරූප පිළිබඳව භෞතික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩී. කේ. එස්. දිනානි[1]

අනෙකුත් බාදන වර්ග හා සසඳන කල වෙරළ ව්‍යවහාරික මෙන්ම විද්‍යාත්මක වටිනාකම්වලින් ද, විචිත්‍රතාවයෙන් ද යුත් භූරූප කලාපයක් වන අතර භූරූප විද්‍යාත්මකව එයටම ආවේණික භූරූපවලින් යුක්තය. වෙරළ තීරය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ක්ෂුද්‍ර භූරූප පිළිබඳව භෞතික භූගෝල විද්‍යාත්මක වශයෙන් සොයා බැලීම විෂයානුකූල වශයෙනුත්, පර්යේෂණාත්මක වශයෙනුත්, ජාතිකමය වශයෙනුත් වැදගත් වේ. මෙහිදී හම්බන්තොට වෙරළ තීරයේ වෙරළාශ්‍රිත ක්ෂුද්‍ර භූරූප පිළිබඳ භෞතික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර ඇති අතර ඒ සඳහා වෙරළ තීරය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ක්ෂුද්‍ර භූරූප හඳුනා ගැනීම තුළින් ඒවා වර්ගීකරණය හා කලාපනය කිරීම, නිර්මාණයට බලපෑ ඇති හේතු විමර්ශනය හා ක්ෂුද්‍ර භූරූප ආශ්‍රිත ශාක ප්‍රජාව පිළිබඳව ද සැලකිලිමත් වී ඇත. මෙම පර්යේෂණයේ දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් හම්බන්තොට වෙරළ තීරය තෝරා ගත් අතර සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි ස්ථාන පහකින් කිලෝමීටරයක් බැගින් වූ කලාපයක් අධ්‍යයනය කරනු ලැබීය. මෙහිදී දත්ත විශ්ලේෂණ ක්‍රමවේද වශයෙන් ප්‍රාථමික දත්ත අතරින් නිරීක්ෂණ, මිනුම්, ජායාරූප, විද්‍යාගාර පරීක්ෂණ යනාදියත්, ද්විතීයික දත්ත අතරින් ආයතනික ලේඛන, පොත්පත්, සගරා, පුවත්පත්, අන්තර්ජාල, සිතියම් හා ගුවන් ජායාරූප ආදිය භාවිත කරනු ලැබීය.

මෙම පර්යේෂණයේ දී හම්බන්තොට වෙරළ තීරයේ ඒ ඒ කලාපවලින් විවිධත්වයෙන් යුතු ක්ෂුද්‍ර භූරූප හඳුනාගත හැකි විය. ඒ අනුව වලවේ ගං මෝය හා කිරිඳි ඔය මෝය ආසන්න වෙරළ තීරයන් වලදී අනෙක් ප්‍රදේශ වලට සාපේක්ෂව පාෂාණ ආශ්‍රිත බාදිත භූරූප වැඩි වශයෙන් ද සිසිලසගම, හම්බන්තොට නගර සීමාව හා බූන්දල යන වෙරළ තීරයන්ගේ වැලි ආශ්‍රිත නිධි සාධිත භූරූප වැඩි වශයෙන් ද පවතින බවක් හඳුනාගත හැකිවිය. මේ සඳහා ප්‍රදේශයේ සුළං රටාව හා පිහිටීම හේතු වී ඇත. ක්ෂුද්‍ර භූරූප ආශ්‍රිත ශාක ප්‍රජාව භූරූප වර්ධනයට හා ආරක්ෂාවට වැදගත් වී ඇත. සමස්තයක් ලෙස ගත්කල හම්බන්තොට වෙරළ තීරයේ ක්ෂුද්‍ර භූරූප සම්බන්ධයෙන් සලකා බැලීමේ දී වැලි ආශ්‍රිත භූරූපයන් නිර්මාණය වීම ප්‍රමුඛ වී ඇති බව පැහැදිලි විය. ප්‍රදේශයේ ගානට් වැලි වර්ගය සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණ ද ඒ පිළිබඳ ව පුළුල් ව අධ්‍යයනයට අවස්ථාව නො වීය. කෙසේ නමුත් මෙම ගානට් වැලි ආර්ථික වශයෙන් භාවිතය හා වෙරළ ක්ෂුද්‍ර භූරූප ආශ්‍රිතව තිරසරාත්මක වශයෙන් පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රදේශයට ආර්ථිකමය වශයෙන් වැදගත් වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *වෙරළ කලාපය, වෙරළ ක්ෂුද්‍ර භූරූප, බාදිත භූරූප, නිධි සාධිත භූරූප, වෙරළ ශාක*

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, **dinanidisanayake@gmail.com**

# ගාලු කොටුව ආශ්‍රිත යටත් විජිත භූදර්ශනයේ මෑත කාලීන වෙනස්වීම්

ශානිකා සුරංගනී[1] සහ පින්නවල සංඝසුමන හිමි[2]

පෘථිවිතලය මත ඇති භෞතික භූදර්ශනය මානව අවශ්‍යතා උදෙසා වෙනස් කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලය සංස්කෘතික භූ දර්ශනය ලෙස සැලකෙයි. මානව මැදිහත් වීමේ ස්වරූපය හා භූගෝලීය ප්‍රපංචයන් හා සංසිද්ධීන් හි බලපෑම අනුව එකී භූදර්ශනය නන් අයුරින් අර්ථකථනය වෙයි. යටත් විජිත භූ දර්ශනය වූ කලී අධිරාජ්‍යවාදී ආක්‍රමණයේ ප්‍රතිඵලයක් වශයෙන් භෞතික හා සංස්කෘතික ප්‍රපංචයන් වෙනස් වීම තුළින් දේශීය අවකාශයක් තුළ ඇති වූ සමස්ත රූපවිද්‍යාත්මක ප්‍රකාශනය යි. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යටත් විජිතයක් ලෙස පැවති ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ යටත් විජිත භූදර්ශනයේ වර්තමාන ස්වරූපය කෙබඳු ද? එකී භූදර්ශනයේ සිදු වී ඇති වෙනස්කම් මොනවාද? එයට බලපා ඇති සාධක මොනවාද? භූදර්ශනයේ සිදු වෙමින් පවත්නා වෙනස් වීම් හේතුවෙන් උද්ගත වී ඇති ගැටලු මොනවාද? යන කේන්ද්‍රීය ප්‍රශ්න පදනම් කර ගනිමින් පර්යේෂණ ගැටලුව ගොඩ නගා ඇත. මෙම අධ්‍යයනයේ නියැදි භූදර්ශනය ලෙස ගාලු කොටුව තෝරා ගන්නා ලද අතර එහි යටත් විජිත භූදර්ශනයේ වර්තමාන ස්වභාවය හඳුනා ගැනීමත් එහි කාලීන වෙනස්වීම් හා එයට බලපා ඇති හේතු සාධක විශ්ලේෂණය කිරීමත් අධ්‍යයනයේ අරමුණ විය. 2009 දී ගාලු උරුමය පදනම මගින් ප්‍රකාශිත වාර්තාවේ දැක්වෙන කලාප පදනම් කරගනිමින් පොකුරු නියැදි ක්‍රමය යටතේ සමස්ත ප්‍රදේශය ස්තර 15 කට බෙදා, එම එක් එක් කලාපයෙහි ඇති ගොඩනැගිලි නේවාසික, වාණිජ, ද්විත්ව, ආගමික, රාජ්‍ය, පෞද්ගලික සහ වෙනත් කාර්යයන් වශයෙන් ස්තර හතක් යටතේ වර්ගීකරණය කරන ලදි. ඒ අනුව සරල සසම්භාවී නියදි ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත රැස්කරන ලද අතර ඒවා විස්තරාත්මක සංඛ්‍යානමය හා සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප ඔස්සේ විග්‍රහ කර ඇත. මෙම අධ්‍යයනයේ එක් ප්‍රධාන සොයාගැනීමක් වන්නේ වර්තමානය වන විට ගාලු කොටුව යටත් විජිත භූදර්ශනයේ පවතින්නේ එහි මූලික ස්වභාවයෙන් සියයට තිස් පහක පමණ ප්‍රමාණයකි. එහි වෙනස් වීමේ ශීඝ්‍රතාව නිදහසින් පසු දශක තුනක් පමණ යන තෙක් ඉහළ මට්ටමක් පෙන්වන අතර, පසුගිය දශකය තුළ එම භූ දර්ශනයේ වෙනස්වීමේ ශීඝ්‍රතාව අවම මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ආර්ථික හා විදේශීය ප්‍රතිපත්ති, පුරාවිද්‍යාත්මක සංරක්ෂණ ක්‍රමෝපායන් මෙන්ම නව යටත් විජිත වාදී ආකල්ප සහිත සංචාරක කර්මාන්තය ද ගාලු කොටුව ආශ්‍රිත භූදර්ශනයේ වෙනස් වීම් කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධකයෝ ය. අනෙක් වැදගත් ම කරුණ වන්නේ ඉහත කී වෙනස්කම් සෑම අංශයකම සමාන ලෙස සිදු වී නොමැති වීමයි. ගෘහනිර්මාණ ඇතුළු රූප විද්‍යාත්මක ලක්ෂණවලට සාපේක්ෂව, ආර්ථික හා සමාජ කාර්යයන්හි පුළුල් වෙනසක් සිදු වෙමින් තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි.

***ප්‍රමුඛ පද:*** *සංස්කෘතික භූදර්ශනය, යටත් විජිතවාදය, ගාලු කොටුව, කාලීන වෙනස්වීම්*

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, shanikaprajapaksha@gmail.com**

[2] **ආචාර්ය, ජ්‍යෙ. කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

# භූමි පරිභෝගය භෞතික පරිසරයට සිදුකරන බලපෑම් පිළිබඳව අධ්‍යයනයක් (තවලම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ජී. ජී. එම්. දිමාලි[1]

පෘථිවිය මතුපිට භූමි ප්‍රදේශය භූමිය ලෙස හැඳින්විය හැකිය. භූමිය එක ලෙස නොපවතින අතර එය ගතික වූ සාධකයකි. භූමිය මත සිදුකරනු ලබන විවිධ කාර්යභාරයන් භූමි පරිභෝගය ලෙස හැඳින්විය හැකිය. ප්‍රදේශයෙන් ප්‍රදේශයට භූමි පරිභෝගය වෙනස් වීම සිදුවේ. ලෝකයේ කලාප අනුව ගත්විට භූමි පරිභෝගය වෙනස් වීම සිදුවේ. භූමි පරිභෝගය නිර්මාණය වීමට දේශගුණික, භෞතික සාධක, මානව ක්‍රියාකාරකම් බලපානු ලැබේ. භූමි පරිභෝගය භෞතික පරිසරයට සිදුකරන ලබන බලපෑම් අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වන අතර භූමියට සිදුවන බලපෑම්, වනාන්තරවලට සිදුවන බලපෑම් හඳුනා ගැනීම හා එම බලපෑම් වළක්වා ගැනීමට හා අවම කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග හඳුනා ගැනීම යනාදිය අරමුණු වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගන්නා ලද්දේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕපාත බටහිර හා ඇළඉහළ යන ග්‍රාම නිලධාරී වසම් වේ. මෙහිදී ඕපාත බටහිර ග්‍රාම නිලධාරී වසමෙහි මුළු කුටුම්භ සංඛ්‍යාව 196 ක්ද ඇළ ඉහළ ග්‍රාම නිලධාරී වසමෙහි මුළු කුටුම්භ සංඛ්‍යාව 496 ක් වූ අතර සමානුපාතික ස්තරීභූත නියැදි ක්‍රමය භාවිතයෙන් නියැදිය සඳහා ඕපාත බටහිර වසමෙහි කුටුම්භ 13 ක්ද, ඇළඉහළ ග්‍රාම නිලධාරී වසමෙහි කුටුම්භ 40 ක්ද බැගින් කුටුම්භ 53 ක් අධ්‍යයනයට ගන්නා ලදි. අධ්‍යයන ප්‍රදේශයේ බහුලව දැකිය හැකි භූමි පරිභෝගයන් ලෙස තේ වගාව, වී වගාව හා රබර් වගාව වන අතර ගම්මිරිස්, කුරුඳු සහ පොල් වගාවද දැකිය හැකිය. අධ්‍යයන ප්‍රදේශය අධික බෑවුම් සහිත ප්‍රදේශයක් වූ හෙයින් තේ වගාව ප්‍රධාන වශයෙන් සිදු කෙරේ. ප්‍රදේශයේ බෑවුම් කලාප අධික වීම මත කෘෂිකාර්මික භූමි ප්‍රදේශ සුලු වශයෙන් දැකිය හැකිවේ. මෙම බෝග වගාවන් හේතුවෙන් භෞතික පරිසරයට සිදු වන බලපෑම් දෙස බැලීමේදී පාංශු ඛාදනය, නායයෑම, ලවණ තත්ත්වයන් වර්ධනය වීම හා ගංවතුර තර්ජන දැකිය හැකිවේ. ප්‍රදේශයේ පාංශු ඛාදනය වැඩි වීමට බලපානු ලබන්නේ තේ වගාව වේ. ඒ සඳහා භාවිත කරනු ලබන රසායනික පොහොර හේතුවෙන් පාංශු අංශු අතර ඒකාබද්ධතාව අහිමි වීම මත සිදුවේ. වනාන්තර විනාශ කිරීමද සිදුවේ. මෙම බලපෑම් අවම කිරීමට ගිනිසීරියා වැනි ශාක සිටුවීම, බෑවුම් කලාප එළිපෙහෙළි නොකිරීම, කානු පද්ධති ඇති කිරීම පෙන්වාදිය හැකි අතර, එමගින් පරිසරයට වන බලපෑම් අවම කිරීමට හැකි බව නිගමනය කළ හැකිය

***ප්‍රමුඛ පද:*** *භූමිය, භූමි පරිභෝගය, පාංශු ඛාදනය, පරිසරය*

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, **maleesha7dimali@gmail.com**

# වියළි කලාපීය ජල ගැටලුව විසඳීම සඳහා වැසිදිය පොකුණු භාවිතයේ යෝග්‍යතාව (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

**ඒ. සී. එන්. ජයසිංහ[1] සහ ජී. සී. දිසානායක[2]**

ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශය තුළ බහුලව ඇතිවන්නා වූ නියං තත්වයන් හේතුවෙන් ජලය පිළිබඳ ගැටලු එම ප්‍රදේශයන්හි දැකගත හැකිය. යල කන්නයේදී බහුලව ම ජල ගැටලුව වාර්තා වේ. වියළි කලාපයට අයත් අනුරාධපුර, හම්බන්තොට, මොනරාගල, පොලොන්නරුව, වව්නියාව ආදී දිස්ත්‍රික්ක බහුලව ම නියඟයට මෙන්ම එමගින් ඇති වන්නා වූ ජල ගැටලුවට මුහුණදෙනු දැකිය හැකිය. මෙම ප්‍රදේශවලට මහා පරිමාණ වාරිමාර්ග යෝජනාක්‍රම මගින් ජලය සැපයීම සිදු කරනු ලබයි. මොනරාගල දිස්ත්‍රික්කය තුළ මහා පරිමාණ ජල සම්පාදනයන් දැකිය නො හැකි අතර ජල ගැටලුවට මුහුනදෙන ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය. මේ හේතුවෙන් ඔවුන් ජල හිඟයට මෙන්ම ජලයේ ගුණාත්මක බව අඩුකම යන ගැටලුවට ප්‍රබලව මුහුණදෙනු ලබයි.

මෙම ප්‍රදේශයෙහි එම ජල ගැටලුවට විසඳුමක් වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයක් වන වර්ල්ඩ් විෂන් ආයතනය විසින් "වැසිදිය පොකුණු" නම් සුවිශේෂී ක්‍රමෝපාය අනුගමනය කර තිබෙනු දැකිය හැකිය. මෙම ප්‍රදේශය මුහුණදෙන ජල ගැටලුව විසඳීම සඳහා මෙම ක්‍රමෝපාය කෙතරම්දුරට යෝග්‍ය වී ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ සිදු කරනු ලැබීය. මොනරාගල දිස්ත්‍රික්කයට අයත් තණමල්විල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගත් අතර දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, ව්‍යුහගත හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා, සහ නිරීක්ෂණය යන ක්‍රමෝපායන් භාවිත කරන ලදි. ස්තරිභූති නියදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද ග්‍රාම නිළධාරී වසම්වලින් තම ඉඩම තුළ වැසිදිය පොකුණු ඇති සහ වැසිදිය පොකුණු නො මැති කුටුම්බ මගින් ලබාගත් තොරතුරු විග්‍රහ කොට දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. වැසිදිය පොකුණු නොමැති පවුල් නියඟයේදී ප්‍රබල ජල හිඟයකට මුහුණදෙන අතරම සහ ජලය අධික කිවුල් බවකින් ද ළිංවල ජල මට්ටම ද සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතී. වැසිදිය පොකුණු ඇති ඉඩම්වල භූගත ජල මට්ටම ඉහළ මට්ටමක පවතින අතර ළිංවල ජලය ද නියං කාලයේදී වැඩි කලක් නොසිඳී තිබේ. එබැවින් ඔවුන් නියං කාලයේදි සාපේක්ෂව එතරම් ජල හිඟයකට ලක් නොවේ. වැසිදිය පොකුණු පිහිටි භූමියන්හි පාංශු තෙතමනය ද ප්‍රසස්ත මට්ටමක පවතිනු දැකිය හැක. පොකුණුවල එකතුකර ගනු ලබන ජලය මගින් ගෙවතු වගාව, වී වගාව ආදී කෘෂිකාර්මික කටයුතු සිදුකර පවුලේ ආර්ථිකය ද ඉහළ නංවාගනු දැකිය හැකිය. වියළි කලාපීය ප්‍රදේශ මුහුණ දෙනු ලබන ජල ගැටලුව විසඳීම සඳහා වැසිදිය පොකුණු ඇති කිරීමේ ක්‍රමෝපාය බෙහෙවින්ම උචිත බව ය.

***ප්‍රමුඛ පදඃ*** *වැසිදිය පොකුණ, නියඟය, භූගත ජලය, ජලයේ ගුණාත්මකබව, වියළි කලාපය*

---

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, Chanakajayasinghe92@gmail.com**
[2] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, dissanayaka1120@gmail.com**

# සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී සිදු වන අවතැන්වීම් හා නැවත පදිංචි කිරීම් මඟින් ජීවන තත්ත්වයට කරන බලපෑම පිලිබඳ අධ්‍යයනයඃ දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ඇසුරින්

**එල්. එල්. දිනූෂි නිමා ධීරසිංහ**[1]

සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේ දී අදාළ ප්‍රදේශය ආශ්‍රිත ව ජීවත්වන ජනතාවගේ අවතැන්වීම් හා නැවත පදිංචි කිරීම් යන්න බහුලව සාකච්ඡාවට බඳුන් වන මාතෘකාවකි. මෙසේ සිදුවන අවතැන්වීම් හා නැවත පදිංචි කිරීම් හරහා එම ජනතාවගේ ජීවන තත්ත්වයට ඇති කරන බලපෑම පිළිබඳ ව ලෝකය පුරා ක්‍රියාත්මක වූ විවිධ සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිතව විවිධ පර්යේෂකයන් විසින් අධ්‍යයන ගණනාවක් සිදුකර තිබේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ විශාලතම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය වන දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගල අවතැන්වීම් හා නැවත පදිංචි කිරීම් රාශියක් සිදු වී ඇති බව සංඛ්‍යා දත්ත තුළින් ගම්‍ය වේ. කෙසේ නමුත් මෙම අවතැන් වීම් හා අදාළ නැවත පදිංචි කිරීම් හරහා එම ජනතාවගේ ජීවන තත්ත්වයට කවර බලපෑමක් සිදු වුණි ද යන්න කිසිවකුගේ අධ්‍යයනයට භාජනය නොවූ ගැටලුවකි. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ දී සිදු වූ පුද්ගල අවතැන් වීම් හා නැවත පදිංචි කිරීම් හේතුවෙන් එම ජනතාවගේ ජීවන තත්ත්වයට ඇති වී ඇති බලපෑම විමර්ශනය කර තිබේ. මේ සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය හා බද්දේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නැවත පදිංචි කිරීම් සිදු කළ ප්‍රදේශ තෝරා ගත් අතර සසම්භාවීව තෝරා ගත් පවුල් 150 ක නියැදියකින් ප්‍රමාණවත් හා ගුණාත්මක දත්ත එක් රැස් කරන ලදී. එම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය හා ආර්ථිකමිතික විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගෙන ඇත. විස්තරාත්මක විශ්ලේෂණයේ දී පර්යේෂණ අරමුණ සාක්ෂාත් වන ආකාරය සලකා බලන අතර ආර්ථිකමිතික විශ්ලේෂණයේ දී මූලික සාධකවල වැදගත්කම හා බලපෑම පිළිබඳ පරීක්ෂා කර ඇත.

මෙම අධ්‍යයනයෙන් ලබා ගත් ප්‍රතිඵලවලට අනුව ස්වායත්ත විචල්‍යයන් ලෙස යොදා ගත් ආර්ථික, දේශපාලන, සමාජීය හා පාරිසරික සාධක නැවත පදිංචි කිරීමෙන් පසු ජීවන තත්ත්වය තීරණය වීමට ඍජු බලපෑමක් සිදු කර ඇති බව හඳුනා ගත හැකි විය. එහි දී ආර්ථික, සමාජීය හා පාරිසරික යන සාධක ත්‍රිත්වය වැඩි බලපෑමක් කර ඇති බවත් දේශපාලනික වශයෙන් වැඩි බලපෑමක් සිදු වී නොමැති බවත් ගම්‍යමාන විය. ආර්ථික, සමාජීය හා පාරිසරික වශයෙන් පුද්ගල ජීවන තත්ත්වයේ පහළ යාමක් සිදු වී ඇති බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *අධිවේගී මාර්ග, අවතැන්වීම, ජීවන තත්ත්වය, නැවත පදිංචි කිරීම, සංවර්ධන ව්‍යාපෘති*

[1] **ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, dinushidheerasinghe@yahoo.com**

# වයඹ සංස්කෘතික චතුරස්‍රයට උරුම කළමනාකරණ සැලැස්මක් සැකසීම.

**ඒ. එම්. එම්. එස්. සේනාරත්න**[1]

"යම් කිසි සමාජයක් සතු පුරාණ ස්මාරක හා ගොඩනැගිලි ඇතුළු චංචල, නිශ්චල සංස්කෘතික දේපල මතුකරගෙන උපරිම කාලයක් විනාශ නොවී පවත්වා ගැනීමට හා සම්පත් වඩාත් කාර්යක්ෂම හා සඵලදායි ලෙස යොදා ගනිමින් සිදුකිරීමේ ක්‍රියාවලිය පුරාවිද්‍යා උරුම කළමනාකරණය වේ." වයඹ පළාතේ පිහිටි සුවිශේෂි උරුමයන් පිහිටි යාපහුව, දඹදෙණිය, පඬුවස්නුවර හා කුරුණෑගල යන රාජධානීන් හතරට අදාළව ව්‍යාපෘතීන් හතරක් ආරම්භ කොට වයඹ සංස්කෘතික චතුරස්‍රය වශයෙන් නම්කර ඇත. මෙම ස්ථානයන්හි ඇති සුවිශේෂී වූ උරුමයන් ආරක්ෂා කිරීමේ වෙනුවෙන් උරුම කළමනාකරණ සැලැස්මක් යෝජනා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

වයඹ සංස්කෘතික චතුරස්‍රය ආරම්භ වී දැනට සය වසරක් ගතවුවද මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී සකස්කර ඇති සළැසුම පවා මේ වන විටත් ක්‍රියාත්මක නොවේ. එම නිසා මෙම ව්‍යාපෘතී පසුගිය වසර ගණනාව තුළ සැළකිය යුතු සංවර්ධනයක් ළඟාකරගෙන නොමැත. එම ගැටලුවලට විසඳුම් උරුම කළමනාකරණ සැලැස්මක් සැකසීම මගින් සොයා ගැනීමට පිළිවන. තවද එමගින් මෙහි ඇති සුවිශේෂි වූ උරුමයන් ආරක්ෂා කිරීම මෙන්ම, වර්තමානයේ පවතිනවාට වඩා අනාගතයේදී මෙම ස්ථානයන් සංවර්ධනයට යොමු කිරීම ද සිදුකළ හැකිය.

මෙම පර්යේෂණය සිදුකිරීමේදී ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයෙන් දත්ත එක්රැස්කිරීම සිදු කර ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී වයඹ සංස්කෘතික චතුරස්‍රයේ පිහිටි ස්ථාන හතරට ගොස් එහි වර්තමාන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම මෙන්ම ක්ෂෙත්‍රයේ දැන උගත් විද්වතුන් සමඟ සාකච්ඡා කරන ලදි. පුස්තකාල අධ්‍යයනයෙන් හා අන්තර්ජාල ඔස්සේ දිවෙමින් ක්ෂේත්‍ර නොවන තොරතුරු එක්රැස් කොට මෙම පර්යේෂණය සඳහා දායක කරගනු ලැබීය.

ඉහත දැක්වූ පර්යේෂණ ගැටලුවට විසඳුම් ලබා දෙමින් අරමුණු ඉටුකරලීම සඳහා සකස් කරන මෙම යෝජනාවලිය සාර්ථක කරගැනීමට පියවර 5කින් යුත් කළමනාකරණ සැලැස්මක් සැකසීම සිදුකරනු ලැබේ. එහිදී මූලික වශයෙන් නිසි පරිදි අගයන් හඳුනාගෙන එම අගයන් ආරක්ෂා කිරීමට ප්‍රතිපත්ති සකසා, එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම වෙනුවෙන් උපක්‍රමයන් හඳුනාගෙන පසුව එම උපක්‍රමයන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී මෙයට අදාළ වන නීති රීතීන් නිසි පරිදි හඳුනා ගැනීම සිදු කරනු ලැබේ. තවද එම උපක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේ දී මෙහි සත්‍යතාවයන්ට හානි නොවන ආකරයෙන් ක්‍රියාත්මක කිරීමද සිදු කළ යුතුය. මෙවැනි සැලැස්මක් සැකසීමෙන් වයඹ සංස්කෘතික චතුරස්‍රයේ ඇති උරුමයන් රැක ගැනීම හා එකී ස්ථානයන් සංවර්ධනය කරා රැගෙන යාමට පිළිවන.

***ප්‍රමුඛ පද:*** *උරුම කළමනාකරණය, අගයන්, සුවිශේෂී, උපක්‍රමයන්*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, sagarisenarathna1992@gmail.com**

# කළුතර දිස්ත්‍රික්කයේ තෝරාගත් පැරණි විහාරස්ථාන කිහිපයක විහාර මන්දිරවල ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්. ඒ. යූ. වී. වීරසූරිය**[1]

බෞද්ධ විහාර මන්දිරවල ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරන විට බොහෝ පර්යේෂකයන් අතින් ගිලිහුණු දිස්ත්‍රික්කයක් ලෙස කළුතර දිස්ත්‍රික්කය පෙන්වා දිය හැකිය. මෙම දිස්ත්‍රික්කය තුළ පැරණි යුගවලට අයත් විහාර මන්දිර, විවිධ සම්ප්‍රදායන්ට අනුව නිර්මාණය වූ විහාර මන්දිර, විදේශිය ආභාසය සහිතව නිර්මාණය වූ විහාර මන්දිර, විශේෂ ගෘහනිර්මාණ ලක්ෂණ අනුව නිර්මාණය වූ විහාර මන්දිර රාශියක් දැකිය හැකි වේ. එම විහාර මන්දිරවල ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා හොරණ රජමහා විහාරය, පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය, පතහවත්ත පුෂ්කරාරාම විහාරය, පරගස්තොට ශ්‍රී සුදර්ශනාරාමය, ලෙනවර රජමහා විහාරය, පානදුර රන්කොත් විහාරය, වරකාගොඩ ගල්ලෙන රජමහා විහාරය, අගලවත්ත කැකුළන්දොළ රජමහා විහාරය අධ්‍යයනයට පාදක කරගන්නා ලදි.

යුග අනුව ගත් විට දඹදෙණි හෝ ගම්පොල යුගයේ සිට නූතන යුගය දක්වා ඉදිවූ විහාර මන්දිර කළුතර දිස්ත්‍රික්කයේ දැකගත හැකිය. පුරාවිද්‍යාත්මක සාධක මගින් මේ බව සනාථ කොට ගෙන තිබේ. විවිධ විහාර සම්ප්‍රදායන්ට අයත් විහාර මන්දිර පිළිබඳ කරුණු දක්වන විට ගන්ධකුටි ආකාර විහාර මන්දිර, මන්දිරාකාර විහාර මන්දිර, ලෙන් විහාර හා ටැම්පිට විහාර මෙම දිස්ත්‍රික්කයේ දැකගත හැකිය. විහාර මන්දිර සඳහා විදේශිය ආභාසය ලැබී තිබීම පිළිබඳ සඳහන් කරන විට බහුල වශයෙන් හමුවන්නේ බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ලක්ෂණ සහිත විහාර මන්දිර වේ. ඇතැම් විට ඕලන්ද ගෘහනිර්මාණ ලක්ෂණ ද මේවායේ ඇතුලත් වේ. විශේෂ ගෘහනිර්මාණ ලක්ෂණ සහිතව නිර්මාණය වූ විහාර මන්දිර අතර පැරණි ඒවා මෙන්ම නූතන යුගයේ ඉදිවූ විහාර මන්දිර ද රාශියක් දැකගත හැකිය. මෙම විහාර මන්දිර ඉදිකිරීමේ දී ඇතුලත් කර ඇති වාස්තු විද්‍යාත්මක ලක්ෂණ බොහෝමයක් විහාර මන්දිර නිර්මාණය කිරීමේ දී භාවිත කරනු ලබන, ඒවාටම සුවිශේෂී වූ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වේ.

එමෙන්ම මේවා නිර්මාණයේ දී යොදාගනු ලබන තාක්ෂණය ඒ ඒ' විහාරමන්දිර සම්ප්‍රදාය අනුව, භූමියේ පිහිටීම අනුව, අදාළ ප්‍රදේශයේ දේශගුණය අනුව, නිර්මාණය වූ සමයේ භාවිත වූ විශේෂ ක්‍රමවේද අනුව වෙනස් වේ. විදේශිය ආභාසය සහිත විහාර මන්දිර ද මෙම දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් දැක ගත හැක. මේ සඳහා බලපා තිබෙන්නේ මෙම ප්‍රදේශය බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට බොහෝ කලක් නතුවී තිබීමයි. මේ අනුව සලකා බලන විට පුරාවිද්‍යාත්මක වශයෙන් හෝ ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ අතින් වැදගත්වන විහාර මන්දිර රාශියක් කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති බවයි.

***ප්‍රමුඛ පදඃ*** *විහාර මන්දිරය, ගෘහනිර්මාණ, වාස්තු විද්‍යාව, කළුතර දිස්ත්‍රික්කය*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, uvindu44vw@gmail.com**

# කරගම්පිටිය ශ්‍රී සුබෝධාරාම පුරාණ විහාරස්ථානයේ සිතුවම් මගින් හෙළිවන තත් කාලීන සමාජය

කේ. හසිතා ලක්නි[1]

කොළඹ, දෙහිවල, 'කරගම්පිටිය ශ්‍රී සුබෝධාරාම පුරාණ විහාරස්ථානය' දහනවවන සියවසේ මුල් භාගයට අයත් වූවකි. මහනුවර යුගයේ පහතරට ශෛලියට අයත් සිතුවම් විශාල ප්‍රමාණයක් මෙහි නිරූපිත ය. ජාතක කථා, බුද්ධ චරිතය හා සම්බන්ධ සිදුවීම් මෙන් ම අපාය දර්ශන හා දිව්‍ය විමාන ආදිය එකී සිතුවම් අතර වේ. සුබෝධාරාම විහාරස්ථානයේ ඇති මෙම සිතුවම් මගින් හෙළි වන තත් කාලීන සමාජය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

මෙහිලා ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය අධ්‍යයනය කෙරුණු අතර, නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය දත්ත රැස් කිරීම සිදුවිය. සුබෝධාරාමයේ සිතුවම් මගින් තත් කාලීන සමාජයේ පැවති සමාජීය ලක්ෂණ රැසක් හඳුනාගත හැකිය. 18, 19 සියවස් අතර කාලයේ මෙරට ක්‍රියාත්මක වූ යටත් විජිත පාලනය ඒ සඳහා ප්‍රබල ලෙස බලපා ඇත. විශේෂයෙන් ම එම සමාජයෙහි ඒ වන විට ක්‍රියාත්මක වූ බ්‍රිතාන්‍ය පාලන රටාව, පැවති සිංහල දේශීය ජනජීවන රටාව බටහිර බලපෑම් සමග ක්‍රමයෙන් වෙනස් වීම, මෙම සිතුවම් මගින් සියුම් ලෙස නිරූපණය වේ. සමකාලීන බෞද්ධ සංස්කෘතියේ මුහුණුවර වෙනස් වීම, දුරාචාරය සමස්ත සමාජය පුරා පැතිර යාම, මෙන් ම එකල සිදුවූ වෙහෙර විහාර විනාශය ද මෙහි නිරූපිත ය. සමස්ත ශ්‍රී ලාංකික රාජ්‍ය හා සමාජය බ්‍රිතාන්‍ය රැජිනට යටත්ව පැවති අතර විහාර මන්දිරයේ ඇති රැජිනගේ රුවින් පෙනී යන්නේ සමස්ත සමාජයේ පැවති පරගැති මානසිකත්වයයි. යටත් විජිතවාදී බලපෑම හේතුකොටගෙන ශ්‍රී ලාංකික සංස්කෘතියේ එන ඇඳුම් පැළඳුම්, ගෘහ නිර්මාණ ශිල්පය, ගෘහ භාණ්ඩ ආදිය බටහිර ආකෘතියට නැඹුරු වූ බවක් මෙම සිතුවම් මගින් පෙනේ. මෙහි ඇති සිතුවම්වල දක්නට ලැබෙන්නේ ද බටහිර ශෛලියකි. 18, 19 සියවස්වල මෙරට ක්‍රියාත්මක වූ බටහිර යටත් විජිත පාලනයේ බලපෑම විසින් ගොඩනැගුණු සමාජයේ පැතිකඩක් සුබෝධාරාම බිතුසිතුවම් තුළින් නිරූපිත බව පැවසීම යුක්ති යුක්ත ය.

**ප්‍රමුඛ පදඃ** *බිතුසිතුවම්, යටත්විජිතවාදය, මහනුවර, පහතරට, බ්‍රිතාන්‍යය*

[1] භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, hasithalakni@gmail.com

# A Geological Study on the Diversity of Micro Karst Landforms of a Limestone Cave (With Special Reference to Waulpane Cave in Ratnapura District)

**A. A. R. Thamodi[1]**

Karsts are truly ‘living landscapes’ as they are the outcome of complex interplay between geology, climate, hydrology and biological factors over long time scales. It is a collection of surface and subterranean landforms, formed through the dissolution of soluble bedrocks mainly limestone. The dissolution process produces surface landforms and network of cavities while the depositional process of $CaCo_3$ produces secondary mineral deposits inside the caves known as speleothems. Karst habitats have a tremendous range of importance in Geology, Geomorphology, Speleology, Hydrology, Paleontology, Biology, Archaeology and Physical Anthropology. Sri Lanka also consists of several limestone caves mainly in Sabaragamuwa, Uva and Central provinces. Waulpane limestone cave in Pallebedda, Ratnapura District is important due to its geological importance and geo-diversity.

Therefore, the main objective of this study was to identify the diversity of micro karst landforms of a limestone cave and also to identify the distribution, types of the micro karst landforms inside the cave. According to the nature of this research the entire Waulpane limestone cave was taken in to consideration. Water and rock samples were collected randomly and landforms were measured and photographed to identify the nature of the landforms while respondents, officers and scholars were interviewed to get further information.

As the outcome, it could be identified that the cave is consisted of speleothems such as stalactites, stalagmites, shield and drapery like features and karren on the walls, ceilings and ground. All these are varying in size and morphologically. Some stalactites seem like bulbs, cones, leaves and pillars while some resemble pencils, wall lamps, rounded arches, sand clocks and flower petals. Most of the features have scattered in the middle of the cave due to favorable conditions. The main factors for these formations are the calcium carbonate laden spring, climate, topography, vegetation cover, hydrological pattern and limestone distribution.

***Key words:*** *Karst, Dissolution process, Limestone cave, Depositional process, Micro karst landforms*

[1] **Department of Geography, aarthamodi@gmail.com**

# Identification of Land Use Changes in Sri Jayewardenepua Kotte Municipal Council From 1975 to 2016.

**H.P.H.S. Premarathna[1] & Prof. R.M.K. Rathnayake [2]**

Rapid urbanization has been the main theme of urban studies in developing countries since the explosion of rates of growth in 1960's and 1970's in very large cities. Like other anthropogenic environment interactions, urban land use changes respond to social, economical, political, cultural, demographical, and environmental conditions, largely characterized by a concentration of humans. Associated with the rapid expansion of urbanization, a lot of land has been converted from rural to urban. Understanding, and quantifying the spatio- temporal dynamics of urban land use changes and its driving factors is essential to put forward the right policies and planning the mechanisms on urban growth for decision making. The objective of this study was to analyze the land use changes in Sri Jayewardenepura kotte Municipal Council, by applying geospatial Technologies. In order to achieve this, satellite data of Landsat5 1975, 1985, 1995 and 2005 have been obtained and preprocessed using Arc GIS. By referring the Google maps compare the changes for each decade and digitized the Google maps and calculate the areas to identify the losses or Gains of the selected land uses. Residential and Commercial areas comparatively take much on the lands. Residential development has the highest land use, 54.8% of the total area. A substantial decrease of 179 Ha of wetland. This is a decrease of 10.5% in relation to the total land use. Consequently there is an increase of 25.6 Hectares in the waterlogged areas (water spread) by land filling for development, a tendency which should be immediately checked. Generally, the results of this study have shown that there was an increased expansion of built up areas in the last 35 years by reducing the agricultural and wetland areas. It is better to use high resolution images for the future researches.

***Key words:*** *Urbanization, Sri Jayewardenepura Kotte , Land use, GIS,RS*

[1] **Department of Geography, sandanapremarathna@gmail.com**

[2] **Department of Geography, University of Sri Jayewardenepura, rathnayaka@sjp.ac.lk**

# Issues and Challenges of Post Landslide management in Haldummulla Divisional Secretariat Division (Special reference to Meeriyabedda landslide in 2014)

**M.L.S. Dissanayaka[1] & Rev. Pinnawala Sangasumana[2]**

Landslide is a geophysical event that has become one of the most calamitous natural hazards in Sri Lanka. Approximately, over 50 000 people have been directly affected by landslide during the last five years and thousands of people are living at risk situation today in the areas such as Badulla, Ratnapura, Kegalle, Galle, Matara, Kandy, Kalutara etc. Since many unexpected adversities are emerged during and after the landslides, it is very important to have a proper mechanism of post disaster management in order to address the resettlement and rehabilitation phases. The study aims to identify the failures of post landslide management while proposing new strategies to overcome existing issues and challenges. By considering the catastrophic landslide hazard occurred in *Meeriabedda* of Badulla District in 2014, 92 families who lived in temporary camps and the vicinity of the damaged area was selected as the study area in this research. Both quantitative and qualitative methods which enabe data collection through questionnaires, structural interviews, semi structural interviews and case studies are used. A mix method of descriptive and analytical was applied along with cartographic techniques for data analysis and discussion. The results revealed that, among the three phases of post landslide management such as immediate response and relief, short term recovery and rehabilitation and long term reconstruction and development, most of the issues and challenges can be identified in the phase of long term reconstruction and development. Institutional arrangements that need to be directed to identify and resolve the emerging issues particularly in the process of resettlement, have not properly functioned due to internal and external factors. Therefore, it is recommended that, a proper institutional coordination and commitment must be in the scene until are reached the durable solutions in the phase of rehabilitation and reconstruction.

***Key words:*** *Landslide, Post-Landslide Management, Issues and Challenges, Badulla District*

[1] **Department of Geography, maheshikausjp@gmail.com**
[2] **Department of Geography, University of Sri Jayewardenepura, pssumana@gmail.com**

# A Study on Dynamics of Agricultural Land Use (Special Reference to Akmeemana Divisional Secretariat Division, Galle District)

**N. D. Kaggodaarachchi** [1]

Agricultural land use is one of the types of land use which affects dynamics to change of agricultural land use in Sri Lanka. This study attempts to study dynamics of agricultural land use (crop type) during the period from 1956 to 2016, based on Akmeemana divisional secretariat division in Galle district. There were visible changes in the study area, such as southern expressway, tsunami rehabilitation program, land sales, abandoned paddy cultivation, and intercrops cultivation and Akmeemana Divisional Secretariat is one of the DSD's which highly affected dynamics of agricultural land use due to the data of Akmeemana DSD. This study aimed to identify areas that mostly affected to dynamics, most influential factors on dynamics of agricultural land use, unchanged agricultural land use and the reasons behind them. Data were gathered from, aerial photographs, GIS, maps, discussions, and observation. Collected data was analysed using GIS and simple statistics methods.

Considering the result of the study, in 1956 rubber cultivation and paddy cultivation were the most prominent agricultural land use. In 2008 tea cultivation has increased considerably than last years and sparsely used cropland and mixed croplands have newly achieved the area. In 2016, oil palm has newly achieved the area. Accordingly, there were paddy, rubber, tea, home garden, coconut, mixed crop, seasonal crop arise in the area. Home garden has taken place at a considerable level. Due to the selected criteria, Southern Expressway and flat land of the area, development activities, and land fragmentation have affected the dynamics of agricultural land use. Year 1985 was the year in which most affected dynamics in agricultural land use were taken place. Some agricultural land uses have unchanged, and attitudes of the people were the main reason for that.

Due to future predictions of the villagers of the area, dynamics of agricultural land uses of the study area will decrease more and village also will develop. The study recommends, encourages the people to cultivation, identifyies improper land use and introduced proper land use methods and related authorities should pay attention for sustainable agricultural land use in Sri Lanka.

***Key words:*** *Dynamics, Land use, Agricultural land use, Dynamics of agricultural land use*

[1] **Department of Geography, nadeeshadilnet@gmail.com**

# Issues and Challenges of Urban Flood Hazard Management in North Colombo Region (Special Reference to 2016 Flood Affected Kolonnawa Urban Council)

**M. L. S. Dissanayaka[1] & Rev. Pinnawala Sangasumana[2]**

Floods are one of the meteorological events that is often recorded as a severe catastrophic natural hazard in the world. Flooding ranks as the most damaging forms of natural disaster in Sri Lanka. Since most of the populated urban spaces are being subjected to the flood hazard, urban flood hazard management has come to the fore in the field of disaster management. Many urban areas of the Western Province in Sri Lanka, especially North Colombo Region were severely affected due to the flood hazard 2016. Therefore, the main objective of the study is to identify the issues and challenges of urban flood hazard management process and introduce the appropriate framework for enhancing the existing flood hazard roadmap. The methodology of the research focuses to select one Urban Council in the region: Kolonnawa. In the methodology, 10% of the total households in two GN divisions were selected by using snowball sampling method for primary data collection respectively. Collected Likert scale type of data according to the conceptual framework were analysed by using one sample t-test and proved that there are more than 60% of impact of selected variables on issues and challenges of urban flood hazard management. The research findings shows that the post-disaster management mechanism in relation to 2016 flood hazard was only successful in short run. Several issues and challenges are still evident in terms of finding long-term solutions. Several constrains related to the existing regulations, institutional cooperation, availability of resources, political involvement and the attitude of the people are evident particularly in the phases of emergency and response. Therefore this paper has recommended implementing long-sighted policies for overcoming such issues and challenges

***Key words:*** *Urban Flood Hazard, Disaster Management, Issues and Challenges, Colombo District*

[1] **Department of Geography, mlsdissanayaka@gmail.com**
[2] **Senior Lecturer, Department of Geography, University of Sri Jayewardenepura**

# A Study on Fluvial Landforms and Land-Use in the River Mouth Area of Maha Oaya River for Last 60 Years (1956 – 2016)

**N. S. Rodrigo[1]**

Rivers are considered as a dynamic system on the earth surface. On one hand they are the most active agent of changing surface land over time. In fact a river mouth area is the most visible area of different dynamic features like fluvial landforms and land use on the surface. Physical landforms along a river can be simply defined as fluvial landforms and the way the man has used the land is the meaning for land use. Sri Lanka is a country with 103 rivers and each of its103 river mouths is thus very sensitive for changes. Out of these 103 river mouths the river mouth area of Maha Oya River is unique for this study as this area has been rapidly changing and having a low attention from researchers and not having quantified its changes. Thus this research tries to reveal those changes with the objective of studying the dynamics of fluvial landforms and land-use in this river mouth area for last 60 years. The changes were quantified through area calculation for observable fluvial landforms and 10 land use categories of derived digitized maps of aerial photographs (1956,1981) and satellite image of 2016 using GIS technology and the least squares method was used to predict data for next 20 years. It is visible that there is a huge dynamic happened in this area within past 60 years. Many fluvial landforms were changed by their shape and extent and disappeared during this period. Rapid sea erosion and human improper land use were major reasons for these changes. The situation of land use changes are also the same. During this time the sea has come nearly 190m inland at the river mouth as a result of sea erosion. Residential areas have been grown by 40% and built up areas by 103% and open spaces by 187% during past 60 years. Coconut, paddy and shrub areas have degraded respectively by 57%, 100% and 46%. The main reasons for these land use changes were increased population density and attitudinal changes of people over time and these changes will be expected in the next 20 years also.

***Key words:*** *River Mouth area, Dynamic, Fluvial Landforms, Land Use*

[1] **Department of Geography, nishshankasrodrigo@gmail.com**

# The locational Decision on Micro Enterprises: Kochchikade GN Division of Western Province of Sri Lanka.

**N.S. Rodrigo[1] & M.L.S. Dissanayaka[2] & D.P. Chaturanga[3]**

Today, in the economic world the role of industries and their locations, behaviors, patterns and dynamics are playing a significant role irrespectively wherever in the world. It is evident that the main industrial locations of the world have been shifted from one region to another from past to present. To explain the location and behavior of a particular industry many scientists have introduced different theories and approaches from the time of 1950s. Even today, although many models and theories are presented, deciding the actual locational factors and behavior of an industry are problematic as different models and theories have different perspectives. Especially, the situation of micro level enterprises is unsteady in this regard. Thus, this study tries to understand and examine whether such theories and models can explain the actual industrial locational behaviours and causes for their locational decisions. In this regard this study focused on three micro enterprises in the village vicinity as case studies to examine economic factors such as raw material, availability of power, market, transport availability, agglomeration of economies for their site location. Further, the study focuses to examine whether the behavioral factors such as availability of information, ability to use those information, entrepreneur's talents and skills, proximity to home and addiction to the present environment have affected for site selection of their enterprises. Three micro enterprises in Kochchikade GN division were selected according to the purposive sampling technique for the convenience of the study. Data were collected from observations and informal discussions. Data were analyzed qualitatively by applying to the selected locational models such as Webber's theory of industrial location, Smith's spatial margin of profitability and Pred's behavioural matrix. The outcome of this study revealed that these micro enterprises didn't concern about such big concepts like labour cost, availability of raw material, transportation, profit maximization etc. But their locational decision mostly combined with behavioural factors as Allen Pred explained in his model. Thus ultimately it could be concluded that behavioural aspect is more useful and practicable in understanding micro level enterprises' locational decision comparatively than Webber's and Smith's ideas.

***Key words:*** *Industry, Locational Decision, Micro Enterprises*

[1] **Department of Geography, University of Sri Jayewardenepura**
[2] **Department of Geography, University of Sri Jayewardenepura**
[3] **Department of Geography, prabhashdc@gmail.com**

# Socio - Economic and environmental Impact of Electricity Generation Using Gliricidia Sepium: with Special Reference to Silver Mills Power Plant, Mirigama

**P. D. Wijesekara[1]**

The world is now gradually moving towards renewable energy sources which are less harmful to the nature and which naturally replenished as a circle. Most renewable energy directly or indirectly comes from the sun and the organic matter that makes up plants is known as biomass. First ever proposal in Sri Lanka to generate electricity by cultivating biomass came to a discussion by Dr. Ray Wijewardene in July 1985. Harvesting and converting Gliricidia wood into electricity and supplying to the national grid can reduce the cost for fossil fuel. Therefore, the study focussed; to examine the socio economic impact to the cultivators and suppliers of the Gliricidia crop, to examine the environmental impacts of Gliricidia electricity generation process and to identify the problems faced by the cultivators, supplies and the management and to suggest the suitable solutions for the identified constrains and issues. Using the purposive sampling method, 25 farmers and 50 suppliers were selected considering the supply chains of the Gliricidia to the power plant located in Mirigama DSD. The data collection is based on the response of the questionnaire, which has been distributed among the farmers and suppliers and the case studies undertaken.

The research ascertained that most of farmers who engaged in Gliricidia farming are traditional farmers. Out of total 48% farmers cultivate Gliricidia as an intercrop with coconut plantations, 24% cultivate as a mono crop and 18% gather Gliricidia woods from their home garden by maintaining live fences and setting as shades for garden crops. Approximately 78% of farmers were preferred to increase the crop in the same land while 56% of suppliers were preferred to cultivate the crop. Cultivation of Gliricidia gives socio economic effects by increasing the income, savings and covering expenditure of the both sample groups. The research has highlighted that the 88% farmers have increased their income after moving to sell the Gliricidia, as the crop is naturally growing and naturally protective from the pests and hazards than the other economic crops. Suppliers of the Gliricidia wood also received socio –economic benefits and the research indicated that 72% of suppliers of fuel wood engage as an extra income source while 28% practice it as a main source of income. Limited experience, lack of technical expertise locally, lack of access to financial resources and information on technical options were identified as the most common barriers in biomass utilization.

***Key words:*** *Renewable energy, Electricity generation, Socio economic impact, Environmental sustainability*

---

[1] **Department of Geography, wijesekarapiyoda@gmail.com**

# Crime Society and Human Behaviour

# බෞද්ධ දණ්ඩන ක්‍රමවේදයන්හි අද්‍යතන උපයෝගීතාව

**ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ**[1]

සිවිල් නීතිය හෝ සමාජ නීතිය කඩ කරන්නා සමාජ ද්‍රෝහියෙකු යැයි පිළිගනු ලබන අතර සමාජයේ යහපැවැත්ම විෂයයෙහි ඔහුට දඬුවම් දිය යුතු යැයි පිළිගත් සම්මතයක් වේ. මරණීය දණ්ඩනය වැනි ඉතා දැඩි දඬුවම් ක්‍රම සමාජය තුළ ක්‍රියාත්මක වුවද දිනෙන් දින සිදුවන අපරාධවල අඩුවීමක් දක්නට නොමැත. වර්තමානයේ එක්වරක් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු යළිත් වරක් වරදකරුවෙකු ලෙස දඬුවම් ලබන අවස්ථා දැකිය හැකි ය. එමගින් ප්‍රත්‍යක්ෂ වන්නේ පවත්නා දඬුවම් ක්‍රමවල ගැටලු සහගත තත්වයන් පවතින බව ය.  නමුත් වසර දෙදහස් පන්සීයකටත් එහා ගිය අතීතයේ දී බුදුරජාණන් වහන්සේ විසින් අනුදත් බෞද්ධ දණ්ඩන ක්‍රමවේදයන් නූතන දණ්ඩන ක්‍රමවේදයන්ට වඩා විධිමත් වූවකි. විනය පිටකයේ චුල්ලවග්ගපාලියේ කම්මක්ඛන්ධකයෙහි බෞද්ධ දඬුවම් විග්‍රහ වේ. ඒ අනුව බුදු දහමේ අන්තර්ගත දණ්ඩන ක්‍රමවේදයන් නූතන දඬුවම් විෂයෙහි යොදා ගත හැකි ද යන්න විමර්ෂණය කිරීම මෙහි මූලික අරමුණ වේ.

ප්‍රජාව වරදින් මුදවාලීම ට දඬුවම බුදු දහමින් අනුමත කර ඇත.  නමුත් පුද්ගලයා වරදින් මුදවා ගැනීමේ එකම ක්‍රමවේදය දඬුවම් දීම පමණක් ම යැයි බුදු දහම නො පිළිගනී. දඬුවමට වඩා වැදගත් කොට බුදුන්වහන්සේ සලකා ඇත්තේ කළ වරද පිළිගෙන ආයති සංවරයේ පිහිටීමයි. වර්තමානයේ ක්‍රියාත්මක වන නීතියට අනුව බරපතල අපරාධයක් කළ විට පමුණුවන ඉහළ ම දඬුවම වන්නේ චූදිතයා මරණයට පත් කිරීමය. එහෙත් කෙතරම් බරපතල අපරාධයක දී වුවද එබඳු දඬුවමක් බුදුසමය අනුමත නොකරයි.  බුදු දහමෙහි ඉගැන්වෙන පරිදි දඬුවම් කිරීමේ මූලික පරමාර්ථය වන්නේ වරදකරුවා නිවැරදි කිරීම ය. වරදකරුවෙකු වුවද ඝාතනය කර දැමීම ඔහුගේ ජීවත් වීමේ අයිතිය පැහැර ගැනීමකි. පුද්ගලයා කුමන ආකාරයේ වරදක් කළ අයෙකු වුවත් නියම චරිත සංවර්ධන ක්‍රමයක් භාවිත කරන්නේ නම් ඔහු නිවැරදිකරුවෙක් බවට පත් කළ හැකි ය. ඇතැම් සමාජවල පවත්නා දඬුවම් කෲර, අමානුෂික හා අශීලාචාර ඒවාය. එවැනි දඬුවම් ක්‍රම මගින් වරදකරුවා පුනරුත්ථාපනයට ලක් නො වන අතර තව තවත් සමාජය තුළ අපරාධ වර්ධනය වීමට එවැනි දඬුවම් හේතු පාදක වේ. එබැවින් නූතනයේ ක්‍රියාත්මක වන දඬුවම් ක්‍රම විෂයෙහි බුදු දහමේ උපයුක්ත දණ්ඩන ක්‍රමවේදයන් කෙතෙක් දුරට උපයෝගී කොට ගත හැකි දැයි යන්න අධ්‍යයනය කිරීම කාලෝචිත යැයි පෙනී යයි.

***ප්‍රමුඛ පද:*** *දණ්ඩනය, බුදු දහම, නූතන, අපරාධ, වරදකරුවන්*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **isanka.dw@gmail.com**

# වැඩිහිටි වියේ විශාදය සඳහා බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

**ආර්. එන්. එස්. ඉඳුනිල් [1]**

විශාදය, මානසික රෝග අතර සෙම්ප්‍රතිශ්‍යාව ලෙස හැඳින්වේ. මෙම මානසික රෝගයෙන් පුද්ගල ඵලදායිතාව, සාමාජික දිවි පෙවෙත, නිර්මාණශීලීබව, නිරවුල් චින්තනය යන සාධකයන් විකෘතියට පත් කරයි. විශාදය යන මානසික රෝගය කුමන වයස් මට්ටමක දී වුව වැළඳිය හැකිය. මෙහිදී අධ්‍යයනයට ලක් කරන ලද්දේ අවුරුදු හැටට වැඩි වැඩිහිටියන්ගේ විශාදමය තත්වයන් ය. වැඩිහිටි වියේ විශාද රෝගීන් හඳුනා ගැනීම හා වැඩිහිටි වියේ විශාද රෝගය වර්ධනය වන ආකාරය හඳුනා ගැනීම මෙහි මුඛ්‍ය පරමාර්ථයන් ය. වැඩිහිටි වියේ විශාදය සඳහා බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ පවුලේ අය දැනුවත් කිරීම හා වැඩිහිටියන්ට ඇති වන විශාදය අවම කර ගත හැකි ක්‍රම හඳුනා ගැනීම මෙහි උප පරමාර්ථයන් ය. බොහෝ මිනිසුන් වයසට යාම, වැඩිහිටි විය සම්බන්ධයෙන් ඇත්තේ සෘණාත්මක අදහසකි. වයසට යාමත් සමග වැඩිහිටියන් කායික මානසික වශයෙන් රෝගී තත්ත්වයට පත් වීමේ ප්‍රවණතාව වැඩිය. මෙහිදී මාගේ අධ්‍යයනයට ලක් වූයේ ආමි සැල්වේෂන් වැඩිහිටි නිවාසය හා අබේසේකර වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් ය. මෙම වැඩිහිටියන් තුළ බහුල වශයෙන් දැකගත හැකි වූ මානසික රෝගී තත්ත්වයන් වූයේ ඉච්ඡාභංගත්වය, හුදකලාභාවය, දුක, කලකිරීම හා කායික රෝගී තත්ත්වයන් ය. එමෙන් ම සමාජීය සාධක අතර අන්තර් සම්බන්ධතාව අඩුවීම හා විවාහ වීම තුළ ඇති වූ ගැටුම් මෙන්ම විවාහ නො වීම නිසා ඇති වී තිබෙන තත්ත්වයන් හේතු කොට ගෙන මෙම වැඩිහිටියන් මානසික වික්ෂිප්ත භාවයට පත්ව ඇත.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය සඳහා Excel වගු ප්‍රස්තාර උපකාරී විය. මෙම වැඩිහිටියන් වැඩි වශයෙන් හුදකලා ජීවිතයට ප්‍රිය කරන අතර ජීවිතයේ කිසිදු බලාපොරොත්තුවක් නො මැති බව ඔවුන් ප්‍රකාශ කළ කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි විය. මෙම අධ්‍යයනයේ දී හෙළි වූයේ සමාජීය සාධකවලට වඩා මානසික සාධක හේතු කරගෙන මොවුන් විශාදයට පත්ව ඇති බවයි. එයට මූලික වී ඇත්තේ සමාජ පසුබිමයි. පර්යේෂණය සඳහා කාලය අවම වීම හා අවුරුදු හැටට වැඩි වැඩිහිටියන් නිසා ඔවුන්ගේ මතකය සම්බන්ධ දෝෂ පැවතීම පර්යේෂණයේ ඇති වූ බාධා විය. වැඩිහිටියන් තුළ ඇතිවන විශාදමය මනෝභාවය අවම කිරීමට නම් ඔවුන්ගේ දුක, කලකිරුණු, හුදකලාභාවය නැති කොට ඔවුන්ගේ ජීවිත බලාපොරොත්තු ඇති කිරීමට උපස්ථම්භනය කරන්නේ නම් වැඩිහිටි වියේ විශාදය අවම කරගත හැකිය.

***ප්‍රමුඛ පද:*** *විශාදය, වැඩිහිටි, වයසටයාම, අධ්‍යයනය, මානසික*

[1] **පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, msindunilsjp@gmail.com**

# මුහුණුපොත මගින් සිදුවන අපරාධ හා එයට බලපාන හේතු පිළිබඳ අධ්‍යයනය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය සිසුන් ඇසුරිනි)

**ඩබ්ලිව්. ජී. නෙළුම්**[1]

සමාජ ජාලා වෙබ් අඩවි ජනප්‍රිය මාධ්‍යයක් බවට පත්වීම අන්තර්ජාල තාක්‍ෂණයේ මෑතකාලීන ප්‍රවණතාවකි. මුහුණුපොත (face book) ඒ අතරින් සුවිශේෂී වේ. මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස මුහුණුපොත කේන්ද්‍ර කර ගනිමින් සිදුවන තාක්ෂණික අපරාධ කාලීනව සුලභ වී ඇත. මුහුණුපොත හරහා තරුණ ප්‍රජාව අපරාධ වලට ගොදුරු වන ආකාරය සහ එයට බලපාන හේතු සාධක විශ්වවිද්‍යාලීය තරුණ ප්‍රජාව ආශ්‍රය කරගනිමින් අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ විය. පරිගණක හිරිහැර, කාමෝද්දීපනය, අනන්‍යතා සොරකම, හැක් කිරීම, අවමාන තර්ජනය යන අපරාධ අතරින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සිදුවූ බලපෑම තුළින් වින්දිතභාවයට පත්වීම පිළිබඳවත්, එයට බලපෑ හේතු පිළිබඳවත් තරුණ ප්‍රජාව තුළ පවතින දැනුවත්භාවය පිළිබඳ පිරික්සා බැලීම ද මෙම පර්යේෂණයෙන් සිදුවිණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ හා අධ්‍යයන වසර හතරම නියෝජනය කරමින් ශිෂ්‍යයන් 100 කුගෙන් යුත් නියදියක් සරල සසම්භාවී නියැදීම යටතේ මෙම අධ්‍යයන සඳහා යොදා ගන්නා ලදී. ප්‍රශ්නාවලීය දත්ත එක්රැස් කිරීමට භාවිතයට ගත් අතර විස්තරාත්මක ක්‍රමවේදය හරහා විශ්ලේෂණයට ලක් කරන ලදී. තෝරාගත් ඉහත ප්‍රධාන අපරාධ අතරින් අවමාන තර්ජනය 32% කි. සාපේක්ෂව අනෙකුත් අපරාධ අවම මට්ටමක පවතී. මෙකී අපරාධ සඳහා බලපා ඇති ප්‍රධාන හේතු සාධක වන්නේ නාඳුනන අයගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම, ඔවුන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම, ගිණුමේ ජංගම දුරකතන අංකය සඳහන් කිරීම ආදියයි. එසේම අපරාධවලට ගොදුරු වූ පසු ගතහැකි නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ ඔවුන් තුළ පවතින දැනුම අවම අගයක් ගනී.

මේ අනුව මුහුණුපොත තුළින් සිදුවන අපරාධ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්හි අවධානය යොමුවිය යුතු අංශ සම්බන්ධව කාලීන යොමු කරවීමත් නව පර්යේෂණ සඳහා දිශානතීන් පෙන්වා දීමත් සඳහා මෙම අධ්‍යයනය මහගු ලෙස උපකාරී වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *මුහුණුපොත, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, අපරාධ, වින්දිතභාවය, නීති*

[1] **අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, nelunishakya@gmail.com**

# කොළඹ දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධයන්හි වර්ධනය පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් (තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

**විදූ අලංකිකා විවදිෂ්නි ද සිල්වා**[1]

පුද්ගලයා සහ සමාජයේ යහපැවැත්ම කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල කරන මානව චර්යාවක් ලෙස මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ අනිකුත් දිස්ත්‍රික්ක හා සංසන්දනය කිරීමේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ වැඩි වශයෙන් වර්ධනය වී ඇත්තේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය තුළ ය. කොළඹ දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ වර්ධනය වන්නේ ඇයි? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වූ අතර, ප්‍රධාන අරමුණ වූයේ එසේ වර්ධනය වීමට හේතු සහ එහි උපනතීන් අධ්‍යයනය කිරීමයි.

මෙම සමීක්ෂණය තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොරැල්ල හා දෙමටගොඩ පොලිස් බල ප්‍රදේශ ආශ්‍රිතව සිදු වූ අතර, අසම්භාවිතාමය නියැදි ක්‍රමය යටතේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් 15 සහ පොලිස් නිලධාරීන් 15 බැගින් දත්ත දායකයින් 30ක් තෝරාගත් අතර, මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් තෝරාගැනීමේදී අවම වයස් මට්ටම අවුරුදු 15ට වැඩි පුරුෂයින් පමණක් තෝරාගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණය ඔස්සේ දත්ත රැස්කිරීම සිදු විය. සමීක්ෂණය තුළින් ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ වර්ධනය වීම සඳහා මූලිකම හේතුව වශයෙන් මුඩුක්කු සහ පැල්පත් නිවාස බහුල වීම හඳුනාගත හැකි විය. අඩු ආදායම්ලාභී පවුල් වල, ප්‍රාථමික අධ්‍යාපනයක් ලද, පහළ ශ්‍රේණියේ රැකියා වල නියුතු, දෛනිකව වැටුප් ලබන, වයස අවුරුදු 36- 50 අතර වයස් කාණ්ඩය හෙරොයින් සහ ගංජා සඳහා අවදානම් සහිත වයස් මට්ටම ලෙස හඳුනාගත හැකි විය. බහුතරය අවුරුදු 16-20 අතර හෙරොයින් සහ ගංජා සඳහා පළමු අත්දැකීම ලැබී ඇති බැවින් මෙම කාණ්ඩය අවදානම් කාණ්ඩය ලෙස දැක්විය හැකි බවද මෙහිදී අනාවරණය විය. ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය හේතුවෙන් අපරාධ රැසක් සිදුවන බව අනාවරණය වූ අතර, වනාතමුල්ල, මැගසින් පාර, සහස්පුර, දෙමටගොඩ රේල් පාර අවට ප්‍රදේශ මත්ද්‍රව්‍ය වැරදි බහුල ප්‍රදේශ වශයෙන් හඳුනාගත හැකි විය. ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි මර්දනය සඳහා විරැකියාවෙන් යුතු පුද්ගලයින්ට වෘත්තිය පුහුණුව ලබා දීම, සංවර්ධන ව්‍යාපෘති, පාසල් අධ්‍යාපනය විධිමත් කිරීම, නව නීති සැකසීම, නීති සංශෝධනය සහ ගුවනින් සහ මුහුදින් රට තුළට ආනයනය වන මත්ද්‍රව්‍ය පාලනය හා නිවාරණයට කඩිනම් වැඩපිළිවෙලක් දියත් කිරීම මෙහි ලා යෝජනා වශයෙන් දැක්විය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *මත්ද්‍රව්‍ය, අපරාධ, වර්ධනය, වැරදි, හෙරොයින්*

[1] **අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, vidudesilva77@gmail.com**

# ශ්‍රී ලාංකේය මලල ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ක්‍රීඩිකාවන් ලිංගික අතවරයන්ට ගොදුරුවීම පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ජී. ඒ. අයි. එස්. දයානන්ද**[1]

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගනිමින් කාන්තාවන් බොහෝවිට පුරුෂයන් හමුවේ විවිධ ප්‍රචණ්ඩත්වයන්ට ලක්වේ. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන් අතර ලිංගික හිරිහැර ප්‍රධාන සංසිද්ධියක් වන අතරම මෙවැනි හිරිහැර සමාජයේ සෑම ක්ෂේත්‍රයකදීම සිදුවිය හැකිය. මලල ක්‍රීඩා ක්ෂේත්‍රය යන සුවිශේෂී සමාජ සංස්ථාවට අදාළව මෙම ගැටලුව පිළිබඳව විදේශ පර්යේෂකයින් විසින් ඒ ඒ රටවලට සමගාමීව විවිධ පර්යේෂණ සිදුකර තිබේ. ඔවුන් ලිංගික අතවර පිළිබඳ සංකල්පීය රාමුවක් පවා ගොඩනගා ඇත. නමුත් ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් ඒ පිළිබඳව වන අවධානය නිලීනය.

එම රික්තකය පුරවනු වස් ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩිකාවන් 45 දෙනෙකුගෙන් යුත් නියැඳියක් තුළින් ප්‍රශ්නාවලීයක් හරහා ලබාගත් දත්තයන්ට අනුව ක්‍රීඩිකාවන් ලිංගික අතවර නිසා ක්ෂේත්‍රය තුළ වින්දිතභාවයට පත්වීම පිළිබඳව ද ඒ සඳහා බලපෑ හේතු පිළිබඳව ද එවැනි අතවර සිදුකරනු ලබන පුද්ගලයින් පිළිබඳව මෙන්ම ඒවාට දැක්වූ ප්‍රතිචාර සහ ගැටලු පිළිබඳව මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කරනු ලැබීය. ඒ අනුව ක්‍රීඩිකාවන්ට සිදුවන හිරිහැරඃ වාචික හිරිහැර, අනවශ්‍ය ලිංගික අවධානය හා ලිංගික හිරිහැර යන ප්‍රධාන කාණ්ඩ 3 යටතේ අධ්‍යයනය කරනු ලැබිණ. මේ අතරින් ක්‍රීඩිකාවන් බහුතරයක් වින්දිතභාවයට පත් වී ඇත්තේ වාචික හිරිහැර නිසාවෙන්ය. ක්‍රීඩිකාවන්ගෙන් 78%ක්ම එක්වරක් හෝ ඉහත කවර හෝ හිරිහැරයකට ලක්වී ඇති බව ප්‍රත්‍යක්ෂ විය. ඒ අතරින් ද බොහෝ දෙනෙක් නැවත නැවත හිරිහැරයන්ට පාත්‍ර වී තිබුණි. මෙවැනි හිරිහැර සිදුවීම සඳහා ප්‍රධානම හේතුසාධක වන්නේ ක්‍රීඩිකාවන් හුදකලා වීමත් රහසිගතව පැමිණිලි කිරීමේ ක්‍රමයක් නොපැවතීමත්, පළමුවරට සිදුවන හිරිහැරය ඉවසා සිටීමත්ය. ක්‍රීඩිකාවන් බොහෝවිට හිරිහැරයන්ට පාත්‍ර වී ඇත්තේ පුහුණුවීම් අතරතුර, ක්‍රීඩා පිටියේ දී, උදෑසන කාලයේදී බව අනාවරණය විය. ක්‍රීඩිකාවන්ගෙන් 24%ක්ම හිරිහැරයන්ට ලක් වී ඇත්තේ ක්‍රීඩකයන්ගෙනි. බොහෝ ක්‍රීඩිකාවන් මෙවැනි අවස්ථාවල දී ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇති නමුත් ඔවුන් කායික හා මානසික වශයෙන් අපහසුතාවන් රාශියකටම මුහුණ දී ඇත.

මෙම පර්යේෂණය අනුව ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ සැඟව පවතින මෙම ගැටලුව පිළිබඳව රජයේත් වගකිව යුත්තන්ගේත් අවධානය යොමුවිය යුතු බව පෙනී ගියේය. ක්‍රීඩකයින් ද මෙවැනි අතවරයන්ට ලක්විය හැකි බැවින් ඒ පිළිබඳව ද පර්යේෂණ පවත්වා ගැඹුරින් අධ්‍යයනය කළ යුතුය. ඒ ඔස්සේ මෙවැනි අතවර වළක්වාගැනීම සඳහා සවිමත් යන්ත්‍රණයක් සැකසීමට අවශ්‍ය නිර්ණායක පිළිබඳව දැනුමක් ලබාගත හැකි බවත් පැවසිය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික හිරිහැර, මලල ක්‍රීඩා ක්ෂේත්‍රය, ක්‍රීඩිකාවන්*

[1] **අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ishunithunya@gmail.com**

# මැද පෙරදිග ගෘහ සේවයේ නියුතු කාන්තාවන්ගේ දරුවන් අපයෝජනයට ලක්වීමේ ප්‍රවණතා පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

යූ. ජී. ඩී. චන්ද්‍රසිරි[1]

වර්තමාන සමාජ ප්‍රවාහය තුළ දක්නට ලැබෙනා සමාජ ගැටලු අතර ළමා අපයෝජනය යන්න ප්‍රමුඛ තේමාවක් බවට පත් වී තිබේ. එහි දී ආර්ථිකමය දුෂ්කරතා හෝ අන්‍ය සාධකයන් පදනම් කොටගෙන ගෘහ සේවය සඳහා මැද පෙරදිග රටවලට ගොස් ඇති කාන්තාවන්ගේ දරුවන් ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශවයටම අදාළව නොසලකා හැරීම, කායික, මානසික හෝ ලිංගික යන කවර හෝ අපයෝජනයක ගොදුරක් බවට පත් වීමේ අවදානමක් පවතින්නේ ද යන්න හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

මව විදේශගත වීම හා ඔවුන්ගේ දරුවන් ළමා අපයෝජනයට ගොදුරු වීම අතර සහසම්බන්ධතාවක් පවතින්නේ ද යන්න විමසා බැලීම පර්යේෂණයේ ගැටලුව විය. එහි දී ගෘහ සේවය සඳහා මැද පෙරදිග රටවලට ගොස් සිටිනා කාන්තාවන්ගේ දරුවන් අපයෝජනවලට ගොදුරු වීම පිළිබඳ පවත්නා තත්ත්වය විග්‍රහ කිරීම, එකී දරුවන් මුහුණ දෙනු ලබන කායික, මානසික හා සමාජීය ගැටලු හඳුනාගැනීම මෙන්ම වින්දිතයා හා අපරාධකරු අතර ඇති සබඳතාව හඳුනා ගැනීම යන අරමුණු සාධනය කර ගැනීමට ක්‍රියා කරන ලදී. ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව ගොනු නියැදියට අනුව විදේශගත කාන්නාවනගේ නියැඳියක් තෝරාගෙන එම නියැදිය තුළින් අපයෝජනයට ලක් වූ දරුවන් 25 දෙනෙකුගේ නියැඳියක් තෝරා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා උපලේඛන හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් පර්යේෂණයට අදාළ දත්ත ලබා ගැනීම සිදුකරන ලදී.

නියැඳියට අනුව වතුකරය ආශ්‍රිත පිරිමි දරුවන් බහුලවම අපයෝජනයට ලක්වී ඇත. දරුවන් වැඩි දෙනෙකු තම නිවස තුළ දී අපයෝජනයට ලක්වී ඇති අතර එය 50% ක ප්‍රතිශතයකි. අවුරුදු 10-15 අතර වයසේ පසුවන දරුවන් වැඩි වශයෙන් අපයෝජනයට ගොදුරු වී ඇති අතර එය 56% ප්‍රතිශතයක් වේ. පවුලේ සමීපත ම ඥාතීන් කෙරෙන් මෙම දරුවන් වැඩි වශයෙන් අපයෝජනයට ලක් වී ඇති අතර නොසලකා හැරීම, කායික, මානසික හෝ ලිංගික යන අතවරයන්ගෙන් එකකට හෝ කීපයකට එක් අවස්ථාවක දී අවස්ථා කීපයක දී මෙම දරුවන් මුහුණ දී ඇත. ඒ හේතුවෙන් ඔවුන් කායික, මානසික හා විවිධ සමාජීය ගැටලුවලට මුහුණ දී ඇති අතර අධ්‍යාපනය අඩාල වීම ඒ අතර ප්‍රමුඛ වී තිබේ. මව විදේශගත වීම හා ළමා අපයෝජනය අතර පැහැදිලි සබඳතාවක් පවතින බව මෙහි දී අනාවරණය විය. අපයෝජන වැඩි ගණනක් නිලීන අපරාධ වශයෙන් පැවති බැවින් රජය විසින් ළමා අපයෝජනය තුරන් කිරීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගතයුතු බව මෙහිලා අවධාරණය කළ යුතු ය.

***ප්‍රමුඛ පද:*** *ළමයා, දරුවා, ළමා අපයෝජනය, මව, විදේශගත වීම, ගෘහ සේවය*

[1] අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, **dilaniusjp92@gmail.com**

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

**කේ. ඩී. මිෂාන් සඳරුවන්**[1]

මානව සමාජයේ පැවැත්ම තහවුරු කරන ප්‍රධානතම සාධකයක් වූ ස්ත්‍රී පුරුෂ විභේදනය මත ගොඩනැගුණු ස්ත්‍රී පුරුෂ සමාජභාවය වූ කලී ජීව විද්‍යාත්මක තත්ත්වයක් නො වන අතර සමාජානුයෝජනයේ ප්‍රතිඵලයක් වශයෙන් පුරුෂයාට හා ස්ත්‍රියට වෙන් වූ කාර්යභාරයන් හිමි වීම යි. පවුල නැමැති සමාජයේ මූලික තැනුම් ඒකකයේ සාමාජිකයන් වන මොවුහු විවාහ වීම තුළින් අන්‍යෝන්‍ය වශයෙන් එකම ඒකකයකට වී කටයුතු කළ ද ඔවුනොවුන් තුළ හට ගනු ලබන මනෝ කායික හේතු සාධක මත ප්‍රචණ්ඩත්වය එකිනෙකාට යොමු කරති. අද්‍යතනයේ එලෙස ගෘහයක් තුළ ඇති වන ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ට වැඩි වශයෙන් සිදුවන බවට අවධානය යොමු වී තිබුණ ද ඊට සමානවම පුරුෂයන් ද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත්වන බවට බටහිර රටවල් විසින් සිදු කරන ලද පර්යේෂණ මගින් අනාවරණය වී තිබේ. තුන් වන ලෝකයේ රටක් වන ශ්‍රී ලංකාව තුළ මෙවැනි තත්ත්වයක් පැවතිය ද එය නිලීනව පවතින හෙයින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි. සමාජය තුළ එය කතිකාවකට බඳුන් නොවීමට හේතු මොනවාද, එම ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරන ලදි. එම අධ්‍යයනය සිදුකිරීමේ දී මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේවා වසම් 60න් ග්‍රාම නිලධාරි වසම් දෙකක් සම්භාවිතා නො වන ක්‍රමය යටතේ එන කොටස් නියදීමේ ක්‍රමය මගින් තෝරාගෙන එම වසම් දෙකෙන් පවුල් 60 ක් සසම්භාවී ලෙස තෝරා ගන්නා ලදි. එම පවුල්වල කලත්‍රයන් 60 ක් වන සේ නියඳිය තෝරා ගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේ දී පුරුෂයන් 68% ක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත් වන බව හෙළි වූ අතර ඉන් වැඩි පිරිසක් තම බිරිඳගෙන් ප්‍රචණ්ඩත්වයට පත් වන්නන් ය. කායික හිංසනය වඩා මානසික හිංසනයට පත් වන අතර එය 82%ක ප්‍රතිශතයක් බව අනාවරණය විය. පුරුෂයන්ගේ මත් ද්‍රව්‍ය භාවිතය සහ පවුලේ පවතින ආර්ථික ගැටලු ප්‍රධාන වශයෙන් මෙම තත්ත්වයට ගොදුරු වීමට බලපෑ හේතු සාධක ලෙස පර්යේෂණයෙන් අනාවරණය විය. මෙම පර්යේෂණය අනාගතයේ දී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී පුරුෂයන්ට සිදු වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට උපයුක්ත කර ගත හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ප්‍රචණ්ඩත්වය, පුරුෂාධිපත්‍ය, හිංසනය*

[1] අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, **mishankahawala@gmail.com**

# බාලාපරාධවල නිරත වූ ළමයින් සඳහා ක්‍රියාත්මක වන ආයතනගත පුනරුත්ථාපන වැඩසටහන් හා ඒවායෙහි ඵලදායිතාව (මාකොළ සහ රම්මුතුගල සහතික කළ පාසල් ඇසුරින්)

**ඩබ්. එම්. තර්ෂිකා මදුෂානි රත්නසිරි**[1]

ශ්‍රී ලංකා නීතිය යටතේ වයස අවුරුදු 18ට පෙර වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙක්ම ළමයෙකු වශයෙන් හඳුනා ගත හැකිය. බාලාපරාධ යන්න විමසා බැලීමේදී ස්ථාපිත සංස්ථාගත ප්‍රතිමානයන්ට නිරතුරුව එරෙහිව යන්න වූද වැඩිහිටි තත්ත්වයට නොපැමිණියා වූද අයගේ සුවිශේෂී චර්යා ප්‍රකාරයකි. ළමයින් පුනරුත්ථාපනය කිරීම සහ නැවත සමාජ ගත කිරීමේ ක්‍රියාවලිය වූ කලී වඩාත් සංකීර්ණ වූවකි. සමස්ත පුනරුත්ථාපන ක්‍රියාවලියේදී උද්ගත වන ගැටලු මෙම පර්යේෂණයේ මූලික පර්යේෂණ ගැටලුව විය. බාලාපරාධවලට යොමු වූ ළමයින් සඳහා ක්‍රියාත්මක වන පුනරුත්ථාපන වැඩසටහන්වල ඵලදායිතාවය විමසා බැලීමත් එහිදී උද්ගත වන ගැටලු විමසා බැලීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රයන් වශයෙන් තෝරාගනු ලැබුවේ බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සහතික කළ පාසල් ද්විත්වයකි. එනම්, මාකොළ සහතික කළ පාසල සහ රම්මුතුගල සහතික කළ පාසල වේ. මෙහිදී සම්මුඛ සාකච්ඡා උපලේඛන ඇසුරින් බාලාපරාධවලට යොමු වූ ළමයින් පාදක කරගනිමින් සහ නිලධාරීන් ඇසුරින් දත්ත සම්පාදනය කරන්නට විය. ඒ අනුව සසම්භාව්‍යය නියැදි ක්‍රමය යටතේ ආයතන ද්විත්වය තුළින් ළමයින් 10 දෙනා බැගින් ළමයින් 20 ක්ද , නිළධාරීන් 10ක්ද දත්තදායකයෝ වූහ.

සහතික කළ පාසල් තුළ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ක්‍රියාවන්හි ඵලදායිතාව 50% ක පමණ ප්‍රතිශතයක් ගනු ලබයි. එහිදී ආයතනික වශයෙන් ක්‍රියාත්මක වීමක් හඳුනා ගත හැකි වුවත් බාලවයස්කරුවන් සමාජගත කිරීමෙන් අනතුරුව පූර්ණ ඵලදායිතාවක් සිදු වීම හඳුනා ගත නොහැකි ය. පසු විපරම් ක්‍රියාවලිය ඵලදායි හා කාර්යක්ෂම බවින් ඌන වීම නිසා පුනර් අපරාධකරුවන් බිහිවීමට හේතු වී තිබේ. ළමයින් බාලපරාධවලට යොමු වීම කෙරෙහි බලපාන හේතු සාධක විමසා බලා ඒ සඳහා නෛතික මැදිහත් වීම් පුළුල් කිරීම, ප්‍රමාණවත් නිළධාරීන් සංඛ්‍යාව සෑම සහතික කළ පාසලකටම පත් කිරීම, පුනරුත්ථාපන වැඩසටහන් නව්‍යකරණය කිරීම ආදිය යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *බාල අපරාධ, පුනරුත්ථාපනය, සහතික කළ පාසල්, සමාජගත කිරීම*

[1] අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, **wmtharshika@gmail.com**

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජ සංවර්ධනය කිරීමේදී ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය යොදා ගැනීමේ ඵලදායීතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්. (ඇපලදෙණිය ග්‍රාම නිළධාරී කොට්ඨාසයෙහි සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ඇසුරින්)

**එච්. ඒ. ඩී. මධුහංසි[1]**

තුන්වන ලෝකයේ රටවල සමාජ සන්දර්භයෙහි මුඛ්‍යතම පරමාර්ථය වන සංවර්ධනය ළඟා කරගනු පිණිස ඉදිරිපත් කර ඇති සංවර්ධන ප්‍රයත්නය වනුයේ ග්‍රාමීය සංවර්ධනයයි. එකී ග්‍රාමීය සංවර්ධන ප්‍රයත්නයෙහි නූතන මුහුණුවරට අදාළ මූලික දර්ශනය සහභාගීත්ව සංවර්ධනය වන අතර, ජනතා සහභාගීත්වය හා පුරෝගාමීත්වය හේතුවෙන් එය අන් ප්‍රවේශයන්ගෙන් සුවිශේෂී වේ. මේ යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් සංඛ්‍යාව ප්‍රමාණාත්මක වශයෙන් වැඩි අගයකින් යුක්ත වූව ද, ග්‍රාමීය සංවර්ධනයේ පෘථුල විෂමතාවන් තවදුරටත් ව්‍යාප්තව පැවතීම ගැටලුවකි. මෙම අධ්‍යයනය දිවෙන්නේ එකී ගැටලුව ඔස්සේයි.

සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියෙහි සාර්ථකත්වය රඳා පවතිනුයේ ප්‍රජාවගේ දායකත්වයෙහි ප්‍රමාණය මත බැවින් එය ඉලක්ක කරගෙන ග්‍රාමීය සමාජයන්හි ක්‍රියාත්මක වන සහභාගීත්ව සංවර්ධන වැඩසටහන්හි ඵලදායීතාව ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. එමෙන්ම සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් කිහිපයක් පෘථුල සමාජ විද්‍යාත්මක හරයකින් අධ්‍යයනයත්, ග්‍රාමීය ජනතාවට සිදුකර ඇති බලපෑම හඳුනාගැනීමත් සුවිශේෂී අරමුණු අතර වේ. මෙහි අධ්‍යයන ක්ෂේත්‍රය වූ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇපලදෙණිය ග්‍රාම නිළධාරී වසම තුළින් ප්‍රජා සංවිධාන සාමාජික පවුල් 40ක නියැදියක් කුටුම්භ 160 කින් යුත් නියැදි රාමුව තුළින් ක්‍රමවත් සසම්භාවී නියැදි ක්‍රමය යටතේ තෝරා ගැනුණි. ද්විතීයික දත්ත සඳහා ආයතනික හා ආයතනික නොවන මූලාශ්‍රයද, ප්‍රාථමික දත්ත සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා මෙන්ම නිරීක්ෂණය ද විය.

ප්‍රතිඵල විශ්ලේෂණයේදී අනාවරණය වූයේ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හරහා ගොඩනැගෙන ශක්තිමත් ප්‍රජාමූල සංවිධාන මෙම ප්‍රවේශයෙහි ඵලදායීත්වයට ප්‍රධාන හේතුව වී ඇති බවයි. ඒ හරහා ප්‍රජාවගේ සංවර්ධන විඥානය ගොඩනංවමින් ප්‍රමාණාත්මක සංවර්ධනයකින් ඔබ්බට ගියා වූ ගුණාත්මක සංවර්ධනයකට මඟපාදයි. ඒ අනුව මෙම අධ්‍යයනය කාලීන සංවර්ධන ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මනා පිටුබලයක් සපයන බව පර්යේෂිකාවගේ අදහසයි. මෙම ප්‍රවේශයෙන් සිදුවන යටිතල පහසුකම් සංවර්ධනය පමණක් නොව ආර්ථික සංවර්ධනය පිළිබඳව අධ්‍යයනයන් සිදු කිරීම ද කාලීන අවශ්‍යතාවක් වේ.

***ප්‍රමුඛ පද:*** *ග්‍රාම සංවර්ධනය, සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය, සංවර්ධන ප්‍රයත්නය, සංවර්ධනය*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **dilushikamaduhansi5@gmail.com**

# රූපවාහිනියේ විකාශය වන විවිධ වැඩසටහන් තුළ පවත්නා වූ ප්‍රචණ්ඩත්වය පුද්ගල චර්යාවට බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.

**එච්. ඩබ්. ඒ. සේනාරත්න** [1]

මෙම පර්යේෂණය රූපවාහිනී වැඩසටහන් තුළ අන්තර්ගත වන්නා වූ ප්‍රචණ්ඩත්වය පුද්ගල චර්යාව කෙරෙහි බලපෑමක් කරනවාද යන ගැටලුව පදනම් කරගත්තකි. රූපවාහිනී වැඩසටහන්හි අන්තර්ගත ස්වභාවය හා ප්‍රචණ්ඩත්වය එහි පුද්ගල බලපෑම හා ඒ සම්බන්ධිත සංකල්පීය හා න්‍යායාත්මක ප්‍රතිඵල ගවේෂණය කෙරෙහි මෙහිදී සුවිශේෂී අවධානය යොමුවිය. ජාතික, ස්වාධීන, ස්වර්ණවාහිනී, දෙරණ, හිරු, ශක්ති, යන ප්‍රධාන රාජ්‍ය හා රාජ්‍ය නොවන නාළිකා කිහිපයක තෝරාගත් වැඩසටහන් කිහිපයක් මූලික කර ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලස්මුල්ල නාගරික ප්‍රේක්ෂකයන් 84ක්ද, පල්ලෙකන්ද ග්‍රාමීය ප්‍රේක්ෂකයන් 60ක්ද වශයෙන් ප්‍රදේශයන්හි ග්‍රාහක ප්‍රතිචාර සමග සංසන්දනාත්මකව ගැටලුවට පිළිතුරු සොයන ලදී. පළමුව ගැටලුවට අදාළ විෂය ක්ෂේත්‍රයන්හි නිර්වචන අධ්‍යයනය, රූපවාහිනියේ විකාශනය, ප්‍රචණ්ඩත්වය අර්ථකථනය, රූපවාහිනී නාළිකාවන්හි අන්තර්ගතයන් යනාදී මූලික කරුණු පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය තුළින් විෂය පථය පිළිබඳව පුළුල් ලෙස විග්‍රහකර ඇත.

ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්තිය පිළිබඳ මූලික පසුබිම සැකසූ රූපවාහිනී විවිධ වැඩසටහන් තුළ වූ සිද්ධි 4ක් අධ්‍යයනය තුළින් ප්‍රායෝගික හා න්‍යායාත්මක වශයෙන් විචල්‍යන් අතර සම්බන්ධතාව හදුනා ගැනීමට හැකිවිය. දෙරණ, හිරු, ස්වර්ණවාහිනී, සිරස වැනි නාළිකා තුළින් වැඩි ඉඩප්‍රස්තාවක් ලබා දෙන දේශීය හා විදේශීය මෙගා ටෙලිනාට්‍ය මෙන්ම ඉහත නාළිකාවන් හා රාජ්‍ය නාළිකාවක් වන ස්වාධීන රූපවාහිනී නාළිකාවන් තුළින් ගෙන එන ප්‍රවෘත්ති වැඩසටහන් ද මෙම රාජ්‍ය හා රාජ්‍ය නොවන නාළිකාවන් තුළින් ගෙන එන ළමා කාටූන්, චිත්‍රපටි ආදියෙහි අන්තර්ගතය විශ්ලේෂණය තුළින් පුද්ගල චර්යාවේ වෙනස්වීම සඳහා මෙම වැඩසටහන් හරහා ගෙනඑන ප්‍රචණ්ඩත්වයෙහි දායකත්වය විග්‍රහ වී තිබේ. ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ලබාගත් ප්‍රතිචාරය අනුව රූපවාහිනියේ බොහෝ වැඩසටහන් තුළට ප්‍රචණ්ඩත්වය ආරෝපණය කර ඇති ආකාරයත්, එය පුද්ගල චර්යාවට බලපෑම් සිදු කර ඇති ආකාරයත් හඳුනාගත හැකි විය. මෙහිදී මූලික වශයෙන් හඳුනාගත හැකිවූ වැදගත් කරුණක් වූයේ හුදු විනෝදාස්වාදය මූලික කරගනිමින් ප්‍රචණ්ඩකාරී රූපරාමු මත බොහෝ වැඩසටහන් නිෂ්පාදකවරු යැපෙන්නා වූ බවයි.

***ප්‍රමුඛ පද:*** *ප්‍රචණ්ඩත්වය, පුද්ගල හැසිරීම්, රූපවාහිනිය*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, Ayeshanisenarathna@gmail.com**

# පොලිස් පාරිසරික අංශය පොලිස් රාජකාරිවලට සිදු කරනු ලබන බලපෑම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**ඒ. බී. එම්. එච්. සී. අබේකෝන්[1]**

තාක්ෂණික දියුණුවත් සමග තුන්වන ලෝකයේ රටක් වන ලංකාව තුළ දෛනිකව වර්ධනය වන අපරාධ පාලනය හා නිවාරණය පොලිසියේ ප්‍රමුඛ කාර්යභාරය වේ. නූතන පොලිසිය තුළ පිහිටුවා ඇති පාරිසරික අංශය පොලිසියෙහි සෙසු රාජකාරිවලට සිදු කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනය තුළ කොළඹ හා තදාසන්න ප්‍රදේශ ලෙස පොලිසියෙහි රාජකාරීවලට සිදුකරනු ලබන බලපෑම නූතනයේ දැක ගත හැකිය. මෙම අංශය ස්ථාපිත කිරීම හා නීතිය ක්‍රියාත්මක කර අපරාධ පාලනය හා නිවාරණය වෙනුවට පොලිසිය සියලුම කටයුතු හරහා සුහසාධනවාදී ගැටලු විසඳීමේ මුහුණුවරකට විතැන් වී ඇත. එකී තත්ත්වය තුළ නූතනයේ ප්‍රබල අර්බුදකාරී තත්ත්වයක් බවට පත්ව ඇති කරුණක් වන්නේ ලංකාවේ පරිසරය සම්බන්ධ ගැටලුවය. එකී හේතුව මත පොලිසිය තුළින් නගන මැසිවිල්ලක් වනුයේ නීතිය ක්‍රියාත්මක කිරීම විෂයෙහි එය අහිතකර බලපෑමක් තර්ජනයක් වන  බවය. ඒ අනුව මේ පිළිබඳ  අධ්‍යයනයේ දී එය සැබවින්ම ගැටලුවක් ද එසේ නම් එය ගැටලුවක් වී ඇත්තේ ඇයි  එම අංශය කෙසේ පොලිසියත් සමග යහබද්ධ කළ යුතු ද යන්න අධ්‍යයනයේ  දී වැදගත් විය. ඒ අනුව නියදිය තෝරා ගත් පොලිස් ස්ථාන ඇසුරින් සරළ සසම්භාවිය නියදි ක්‍රමය යටතේ අහඹු ලෙස තොරා ගත් අතර  ප්‍රශ්නාවලි මගින් ලබා ගත් දත්ත මෙන්ම පසුබිම් සිද්ධි අධ්‍යයනය තුළින් ද නිගමනවලට එළඹිය. වසර කිහිපයකට පෙර පිහිටවූ මෙම අංශය සෑම නගරයකම පොලිස් ස්ථානයක් තුළම පිහිටුවා ඇති අතර කොළඹ හා බදුල්ල  දිස්ත්‍රික්කයන් තුළ මෙන්ම සෙසු නගරවල ද සක්‍රියව ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කළ ද එසේ ක්‍රියාත්මක වන බවත් දත්ත විශ්ලේෂණයේ දී දකගත නොහැකි විය. අධ්‍යයන ප්‍රදේශයෙන් ලබා ගත් දත්ත අනුව පාරිසරික අංශය පොලිසියෙහි රාජකාරිවලට සිදු කරනු ලබන බලපෑම ධනාත්මක බලපෑමකට සාපෙක්ෂව රාජකාරි විෂයෙහි  සෘණාත්මක බලපෑමක් කරන බව තොරා ගත් පොලිස් ස්ථාන අනුව නිගමනය විය. පාරිසරික වශයෙන් ඇති වන්නාවූ හා ඇති විය හැකි තත්ත්වයන් පිළිබඳව හා එම තත්ත්වයන් අවම කිරීම සඳහා ජනතාව නිරන්තර දැනුවත් කිරීම, මෙවැනි අංශයක් පිහිටුවීම තුළින් පමණක් පරිසර ආරක්ෂණය කළ නොහැකි අතර සෙසු අංශවල මෙන්ම ජනතාවගේ ද සක්‍රිය දායකත්වය ලබා ගැනීමට ක්‍රමවත් වැඩසටහන් ඇති කළ යුතුය. බහුවිධ රාජකාරිවල නියලිම අවම කිරීමට කටයුතු කිරීම, ආයතනික ගැටලු අවම කිරීම, මෙම අංශය පොලිසියෙන් වෙන් වූ ආයතනයක් ලෙස නොව සෙසු අංශයන්ගෙත් සහයෝගය ඇතිව ක්‍රියාත්මක වන්නාවූ අංශයක් ලෙස සෙසු අංශ සමග යහබද්ධ කළ යුතු අකර පරිසරය ආරක්ෂා කිරීම කාලීනව අත්‍යවශ්‍ය දෙයක් වන අතර නිසි පරිදි කළමනාකාරීත්වයෙන් යුතු වැඩ පිළිවලක් සකස් කිරීම තුළ මෙකී තත්ත්වය අවම කළ හැකි බව නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** *පොලිසිය, පාරිසරික, සෘණාත්මක බලපෑම*

[1] **අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, harshiabeykoon2@gmail.com**

# කාන්තා අඩු වයස් විවාහවීම් කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම

ටී. එම්. එස්. පී. තෙන්නකෝන්[1]

පිරිමියෙකු හා ගැහැනියක අතර සිදුවන පිළිගත් නීත්‍යානුකූල ලිංගික සබඳතාව විවාහය ලෙස සරලව හැඳින්විය හැකිය. ප්‍රජනන ක්‍රියාවලිය සඳහා කායික මානසික වශයෙන් සූදානමක් නොමැති වයසකදී යොවුන් දැරියන් බොහෝ සංඛ්‍යාවක් විවාහ ජීවිත ගත කරමින් මව්වරුන් බවට පත් වේ. රටක අනාගත පරපුර එසේ අර්බුදයන්ට ලක් වන අතරම මෙම දරුවන්ට ඔවුන්ගේ ළමා කාලය අහිමිව යයි. එය වර්තමානයේ පමණක් නොව අනාගතය කෙරෙහි සෘණාත්මක ලෙස බලපාමින් සමාජමය වශයෙන් ගැටලු රැසක් ඇති කරලීමට හේතු වී තිබේ.මෙම ගැටලුවලට විසඳුම් සෙවීමට පෙර මෙවැනි තත්ත්වයන් සමාජය තුළ වර්ධනය වීමට බලපෑනු ලබන සාධක මොනවාද යන්න විමසා බැලීමත් එම සාධක අවම කර ගැනීමට පියවර ගැනීමත් ඉතා වැදගත් වේ. ඒ අනුව කාන්තා අඩු වයස් විවාහයන් කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

කාන්තාවන් අඩු වයසින් විවාහ වීමට බලපාන ලද සාධක සෙවීම සඳහා අඩු වයස් විවාහක කාන්තාවන් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කිරීමට තීරණය කළ අතර ඒ සඳහා මූලික වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදි. ඊට අමතරව පොලිස් අධිකාරි කාර්යාලය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ලබා ගත් වාර්තා ආශ්‍රයෙන් ද්විතීයික දත්ත එක් රැස් කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තෝරා ගත් අතර මහවැව සහ නාත්තන්ඩිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ද්විත්වය තුළින් ග්‍රාමසේවා වසම් පහක් ඇසුරින් නියදිය තෝරා ගන්නා ලදි. ඒ අනුව හිමබෝල නියදි ක්‍රමය යටතේ අඩු වයස් විවාහක කාන්තාවන් 180 දෙනෙකුගෙන් යුත් නියදිය ආශ්‍රයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලදි.

රැස්කර ගන්නා ලද දත්ත වගු ප්‍රස්තාර මගින් විධිමත් ලෙස ඉදිරිපත් කළ අතර එම දත්ත විශ්ලේෂණය සඳහා මූලික වශයෙන් විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිත කරන ලදි. ඊට අමතරව විචල්‍යයන් අතර ස්වායත්තතාය පරීක්ෂා කිරීම සඳහා කෛවර්ග පරීක්ෂාව ද කාන්තාවන් අඩු වයසින් විවාහ වීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා සාධක විශ්ලේෂණය ද යොදා ගන්නා ලදි. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් පැහැදිලි වූයේ කාන්තා අඩු වයස් විවාහ වීම් කෙරෙහි පවුලේ ආදායම අවම වීම, දෙමාපිය රැකවරණය අහිමි වීම, නොදැනුවත්කම, අධ්‍යාපන මට්ටම අවම වීම, ප්‍රේම සබඳතා, ආගම, සංස්කෘතිය ආදී හේතු හඳුනාගත් අතර ඒවා පවුල යන සාධකය, සමාජීය සාධක, ආර්ථික සාධක හා සංස්කෘතික සාධක යන පොදු සාධක හතරකට බෙදා දක්වා ඇත. අඩු වයස් විවාහයන්ට බලපාන සාධක අවම කර ගැනීමට යොදාගත හැකි යොජනා ඉදිරිපත් කර ඇති අතර ඔවුන්ගේ ළමා විය රැකගැනීම අප කාගෙත් යුතුකම වන්නේ ය.

***ප්‍රමුඛ පද :*** *කාන්තා, අඩුවයස්, විවාහක, සාධක*

[1] **සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය, tmspthennakoon@gmail.com**

# මීගමුව කලපුව ආශ්‍රිත ධීවර කර්මාන්තයේ කාන්තා ශ්‍රම දායකත්වය

**ආර්. ඩබ්. එම්. රාජිකා ගීතමාලී**[1]

නූතන ආර්ථික ක්‍රියාකාරීත්වය තුළ ස්ත්‍රී ශ්‍රම දායකත්වය ඉහළ යාම ගෝලීය ආර්ථිකයේ කැපී පෙනෙන ලක්ෂණයකි. එම කාන්තා ශ්‍රම දායකත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ධීවර කර්මාන්තයට හිමි වනුයේ සුවිශේෂී වැදගත්කමකි. ද්වීපත්වාසී රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ධීවර කර්මාන්තයට වැදගත්කමක් හිමි වේ. ලංකාවේ මීගමුව කලපුව ආශ්‍රිත පවුල් 8127ක් පමණ ධීවර කර්මාන්තයෙහි නියැලෙන අතර මෙට්‍රික් ටොන් 1350ක පමණ මත්ස්‍ය නිෂ්පාදනයක් වාර්ෂිකව ලැබේ. එබැවින් ඒ ආශ්‍රිත කාන්තා ශ්‍රම දායකත්වයෙහි කැපී පෙනෙන ලක්ෂණ හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි. එහිදී ධීවර කර්මාන්තයේ නිරත කාන්තාවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සමාජ ආර්ථික පසුබිම හඳුනා ගනිමින් ධීවර කර්මාන්තය තුළ කාන්තාව නිරත වන විවිධ අංශ, කාන්තාව ධීවර අංශයේ නිරත වීම තුළින් කුටුම්භ සංවර්ධනයට දායක වන ආකාරය, ධීවර අංශවල නිරත කාන්තාවන් මුහුණපාන ගැටලු හඳුනා ගැනීම හා ඒවාට සුදුසු විසඳුම් යෝජනා කිරීම මෙම අධ්‍යයනය මගින් අරමුණු කෙරේ. මීගමුව නගරය 1 ධීවර පරීක්ෂක කොට්ඨාසයේ ධීවර පවුල් 915න් 7%ක් එනම් පවුල් 65ක කාන්තාවන් අවශ්‍යතාව සඳහා නියැදීම යටතේ තෝරා ගෙන ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම මිශ්‍ර වූ පර්යේෂණ ක්‍රමවේදයක් යටතේ අධ්‍යයනය සිදුකරන ලදි.

කාන්තාව ධීවර කර්මාන්තයේ විවිධ අංශ ඔස්සේ ශ්‍රමය සපයන බව අධ්‍යයනය තුළින් ගම්‍යමාන විය. කරවල වේලීම (35%), මසුන් අලෙවිය (27%), මසුන් සකස් කිරීම (19%), දැල්වලින් මසුන් වෙන් කිරීම (10%), මසුන් එකතු කිරීම (5%) හා දැල් සකස් කිරීම (3%) යන ධීවර අංශ තුළ කාන්තාවෝ නියුක්ත වී සිටිති. එසේම ධීවර කර්මාන්තයට කාන්තා ශ්‍රම දායකත්වය සැපයීමේ දී ආදායම, අධ්‍යාපන මට්ටම, වයස් ව්‍යුහය හා වෘත්තීය හැකියාව යන ලක්ෂණ බලපා තිබේ. ධීවර කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා පහළ අගයක් එනම් කිසිදා පාසල් නොගිය කාන්තාවන් 28% හා 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ 44%ක් විය. එයින් පැහැදිලි වනුයේ අඩු අධ්‍යාපනයක් යටතේ වුවද ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකි රැකියාවක් වශයෙන් ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා කටයුතුවල නියැලී ඇති බවයි. ශ්‍රම දායකත්වය සඳහා නිසි පිළිගැනීමක් නොමැති වීම, වැටුප් අසමානතා පැවතීම, සම්පත් සඳහා ප්‍රවේශ වීමේ හැකියාව අවම වීම, ආදායම් විචලනය ධීවර කාන්තාව මුහුණදෙන ප්‍රධාන ගැටලු වේ. ධීවර කටයුතුවල නියැලීම දරුවන්ගේ අධ්‍යාපනයට, දරුවන් සමඟ ඇති සබඳතාවලට මෙන්ම පවුලේ සමඟියට ගැටලුකාරී ලෙස බලපා ඇති අවස්ථා ද දැකිය හැකිය. එම ගැටලු අවම කර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගැනීම තුළින් කාන්තා ශ්‍රම දායකත්වයේ පවතින ඵලදායීතාව වැඩි කර ගැනීමට හැකියාව පවතින බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ධීවර කර්මාන්තය, කාන්තාව, ශ්‍රම දායකත්වය, ධීවර අංශ, මීගමුව කලපුව*

---

[1] **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, rwmrrajee@gmail.com**

# විශේෂ අධ්‍යාපනය හදාරන දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම

**කේ. ඒ. ටී. ශ්‍රීපාලිනී**[1]

සාමාන්‍ය හා විශේෂ අධ්‍යාපනය හදාරන දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි අධ්‍යාපනය විවිධ ආකාරයෙන් බලපානු ලබයි. ඉන් විශේෂ අධ්‍යාපනය හදාරනු ලබන දරුවන් වන්නේ යම් ආබාධයක් (අන්ධ, බිහිරි) සහිත වූවන්ය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ විශේෂ අධ්‍යාපනය හදාරනු ලබන සිසුන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමය. ඒ සඳහා රත්මලාන අන්ධ බිහිරි විද්‍යාලයේ 9, 10 හා 11 යන ශ්‍රේණිවලින් සිසුන් 150ක නියැඳියක් සරල සසම්භාවීව තෝරා ගන්නා ලද අතර සිසුන් ඇතුලුව සිසුන්ගේ දෙමව්පියන්, භාරකරුවන් හා ගුරුවරුන්ගෙන් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් තොරතුරු රැස්කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ඒකවිචල හා බහුවිචල විශ්ලේෂණ ක්‍රම, සංයුක්ත දර්ශකාංක යන සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කරන ලද අතර ඉන් ලද ප්‍රතිඵල පහත පරිදි සාරාංශ කර දැක්විය හැක. ඒ අනුව ආබාධිත සිසුන් අතරින් වැඩි ප්‍රතිශතයක් ගැහැනු ළමයින් (54%) නියෝජනය වී තිබුණු අතර සමස්ත නියැඳියෙන් 54%ක් අන්ධ තත්වයේ පසුවූ අතර 46%ක් බිහිරි තත්වයේ පසුවිය. සාධක විශ්ලේෂණය මඟින් ආබාධිත සිසුන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක ලෙස පාසල් සාධක, මෘදු කුසලතා සාධක, සාම්ප්‍රදායික සාධක, ආර්ථික සාධක, පවුල් සාධක හා සමාජීය සාධකත්, ගුරුවරුන් ලබා දුන් එකඟත්වය මත දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක ලෙස සමාජමය සාධක, දක්ෂතාමය සාධක, උපකරණ සාධක, සනීපාරක්ෂක සාධක, තෘප්තිමය සාධකත් හඳුනාගත හැකි විය. සමීක්ෂණය මඟින් එළඹි නිගමනයන් ලෙස පන්ති කාමර තුළ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමුවිය යුතු වීම, ප්‍රවේශ පහසුකම්ද වඩා ප්‍රබල විය යුතු වීම, සංඥා භාෂාව පිළිබඳව සාමාන්‍ය ප්‍රජාව තුළ අවබෝධයක් නොමැති වීමත් පෙන්වා දිය හැකිය. බ්‍රේල් සංඥා භාෂාව රටේ සෑම පුරවැසියෙකුටම යම් තරමකට හෝ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සැලසීම, ලොව පුරා එක් බ්‍රේල් මාධ්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, සංඥා භාෂාව ජාත්‍යන්තරයටම එකම භාෂාවක් ලෙස දියුණු කිරීම, ගුරුවරුන් සඳහා තවදුරටත් විශේෂ අධ්‍යාපන පාඨමාලා ආරම්භ කිරීම, අධ්‍යාපන පරිපාලන ආයතන සහ සියලුම ගුරු විද්‍යාලවල විෂය නිර්දේශයන්වලට විශේෂ අධ්‍යාපනය විෂයක් ලෙස ඇතුළත් කිරීම ආදී ක්‍රියාමාර්ග යෝජනා කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ආබාධිත ළමයි, විශේෂ අධ්‍යාපනය, සංවර්ධනය*

[1] **සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය, sigisripali@gmail.com**

# නූතන ග්‍රාමීය ආර්ථිකයෙහි සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුල ධුරාවලියේ ක්‍රියාත්මකභාවය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**එම්. එස්. අප්සරා**[1]

සාම්ප්‍රදායික කර්මාන්ත යනුවෙන් හැඳින්වෙන්නේ ඈත අතීතයේ පටන් වර්තමානය දක්වා ක්‍රමානුකූලව සෙමින් වර්ධනය වී පැමිණි කර්මාන්තයන්ය. ශ්‍රී ලංකා ඉතිහාසය ගත්විට සාම්ප්‍රදායික කර්මාන්තවලට සුවිශේෂී තැනක් හිමිවේ. මන්දයත් අතීතයේ සිට සාම්ප්‍රදායික කර්මාන්ත විශේෂිතවූ කුල ධුරාවලියක් ඔස්සේ වෙන් වෙන්වූ ගම්මාන හා සමාජ කණ්ඩායම් නිර්මාණය කිරීමේ පදනමක් සකස් කරගත් නිසාය. මේ තුළ ශ්‍රම විභජනයක්ද සිදුවී විශේෂ ප්‍රාගුණ්‍යයකින් යුතුව තම කුලයට විශේෂවූ කර්මාන්ත කරගෙන යාමට මිනිසුන් පෙළඹුණි.

අතීතයේ සිට අනන්‍යතාව ආරක්ෂාකර ගැනීමට දායක වූ ප්‍රධාන සාධකයක් ලෙස කුල ක්‍රමය හා බැඳි සාම්ප්‍රදායික කර්මාන්ත හැඳින්විය හැකිය. සමාජ විකාශනය සමඟ සමාජයේ ආරෝපිත තත්ත්වයන් අභිභවා සාධිත තත්ත්වයන් කරා මිනිසුන් යොමුවන්නට විය. එමගින් පළමු පරපුර හෝ දෙවන පරපුර කරගෙන ආ කර්මාන්ත කිරීමට ඊට පසු පරපුර උනන්දුවූ ආකාරයක් දැකිය නොහැකිය. ඒ ඔස්සේ මෙරට සාම්ප්‍රදායික කර්මාන්තවලට විවිධ ආදේශකයන් බිහිවිය. නමුත් මෙම රටාව තුළ සාධිත තත්ත්වයන් ඔස්සේ සමාජ ස්තරායනයේ ඉදිරියට පැමිණීමට නොහැකිවූ අය තුළ සේවා වියුක්තියක් ඇතිවිය. එහි වර්ධනයක් ද හඳුනාගත හැකිවිය. මෙමගින් ඇතිවූ හිඩැස ග්‍රාමීය දරිද්‍රතාවට ප්‍රධාන හේතුවක් වී ඇත. තවද කුල ක්‍රමය හා සාම්ප්‍රදායික කර්මාන්ත අතර ඇති සම්බන්ධතාව හඳුනා ගැනීම, ග්‍රාමීය දරිද්‍රතාවය පාලනයේදී සාම්ප්‍රදායික කර්මාන්තවල දායකත්වය කෙසේද යන්න හඳුනා ගැනීම, ග්‍රාමීය විරැකියාව අවම කරගැනීම සඳහා සාම්ප්‍රදායික කර්මාන්ත භාවිතාවේ යෙදවිය හැකි ආකාරය කෙසේද යන්න හඳුනා ගැනීම ආදිය අරමුණු කොටගෙන එහි ක්‍රියාත්මක භාවය වැලිගම කුඹල්ගම, තිහගොඩ උඩුදමන, කැකණදුර පරවාහැර, කඹුරුපිටිය යන ප්‍රදේශ කේන්ද්‍රකර විමසූ විට ඔවුන්ගේ ජීවන තත්ත්වයේ අසීරුතා මෙන්ම කර්මාන්තය කරගෙන යාමේ අමුද්‍රව්‍ය හිඟකම, අලෙවිකරණ ආදී ගැටලු රාශියකින් මෙම කර්මාන්ත එම ප්‍රදේශවලින් අභාවයට යාමක් හඳුනාගත හැකිය.

මේවායේ ක්‍රියාත්මකභාවය හිමබෝල නියැදි ක්‍රමය යටතේ පුද්ගලයන් 60ක් කේන්ද්‍රකරගෙන සිදු කළ අතර කඹුරුපිටිය හැර අනෙකුත් සියලු ප්‍රදේශවල 50% ආසන්න හා ඉක්මවූ අගයක් තම කර්මාන්තය සමඟ කුල ක්‍රමයක් ක්‍රියාත්මක වන බව හා එහි ප්‍රායෝගිකත්වයේ අඩුවීමක් පෙන්වා දුන්හ.

***ප්‍රමුඛ පද;*** *ආර්ථිකය, කර්මාන්ත, කුලය, ස්තරායනය, සාම්ප්‍රදාය, විරැකියාව*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **shyamipathirana@gmail.com**

# ග්‍රාමීය ජනතාවගේ බැංකු පුරුදු කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

**ටී. එම්. බතීගම**[1]

මෙම අධ්‍යයනය ග්‍රාමීය ජනතාවගේ බැංකු පුරුදුවලට බලපාන සාධක, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව ඇසුරු කර ගනිමින් සිදු කර ඇත. එහි දී කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් 4 ක තෝරාගත් පුද්ගලයින් 120 ක් ඇසුරු කර ගනිමින් කළ පර්යේෂණයේ ප්‍රතිඵල මත මෙම නිබන්ධය සම්පාදනය කර තිබේ. නිබන්ධයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ජනතාවගේ බැංකු පුරුදු කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම වේ. මෙහි දී දත්ත රැස් කිරීම ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මකව ද සිදු කර ගන්නා ලද අතර එම දත්ත භාවිතයෙන් ග්‍රාමීය ජනතාවගේ බැංකු පුරුදු සඳහා වැඩි වශයෙන් බලපාන සාධක හඳුනා ගැනීම සඳහා ප්‍රජා විද්‍යාත්මක, ආර්ථික විද්‍යාත්මක  හා බැංකු කටයුතු භාවිතය පිළිබඳ විචල්‍යය ආශ්‍රිත සාධක ආශ්‍රයෙන් පර්යේෂණ සිදු කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීමේ දී විස්තරාත්මක විශ්ලේෂණය හා ආර්ථිකමිතික විශ්ලේෂණය යන ක්‍රමවේද භාවිත කර ඇත. විස්තරාත්මක විශ්ලේෂණය ඇසුරින් හඳුනා ගත හැකි වන්නේ ග්‍රාමීය අංශයේ ජනතාවගෙන් වැඩි පිරිසක් වර්තමානය වන විට බැංකු කටයුතු භාවිතය කෙරෙහි යොමු වී ඇති නමුත් ඔවුන් වැඩි වශයෙන් යොමු වී ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශ වලට ආවේණික වූ සමුපකාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන බැංකු සමඟ වන බව ය. වාණිජ බැංකු කෙරෙහි යොමු වීම ඉතාමත් අවම වන අතර බැංකු කටයුතු වලට යොමු වීමට ඇති ප්‍රධාන බාධකය වී ඇත්තේ ග්‍රාමීය ජනතාවගේ අඩු ආදායම් තත්වය හමුවේ  ඇති මූල්‍ය දුෂ්කරතාවන් ය. ආර්ථික ගැටලු රැසක් සමඟ ජීවනෝපාය මාර්ග කරගෙන කරගෙන යන ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව ද නොදියුණු මට්ටමක පැවතීම ඔවුන්ගේ බැංකු කටයුතු අවහිර කරන්නක් ලෙස දැක්විය හැකි ය. මෙම පර්යේෂණයේ ආර්ථිකමිතික විශ්ලේෂණයේ දී බැංකු පුරුදු සඳහා බලපාන මූලික සාධක වල බලපෑම හා වැදගත්කම පිළිබඳව අවධානයට ලක් කරන ලදී. ආර්ථිකමිතික විශ්ලේෂණය යටතේ බහුගුණ ප්‍රතිපායනයක් සිදු කර ඇති අතර බැංකු පුරුදු කෙරෙහි, හඳුනාගන්නා ලද විචල්‍යය අතරින් වැඩි වශයෙන් බලපාන සාධක මොනවාද යන්න හඳුනා ගැනීමක් කර ඇත. එහි දී ග්‍රාමීය ජනතාවගේ  බැංකු පුරුදු කෙරෛහි වඩාත් බලපාන සාධකය වශයෙන් අධ්‍යාපන මට්ටම යන සාධකය හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම ආදායම, පුමිතිරි බව හා වයස යන සාධක බැංකු පුරුදු කෙරෙහි ප්‍රබල බලපෑමක් නොදක්වන බව ද පැහැදිලි විය. ඒ අනුව ග්‍රාමීය ජනතාවගේ බැංකු පුරුදු කෙරෙහි වැඩි වශයෙන් බලපාන සාධක පවතින බව හඳුනා ගත් අතර පර්යේෂකයන් විසින්  පෙර සිදු කරන ලද පර්යේෂණ මඟින් ද එම සාධක හඳුනාගෙන තහවුරු කර ඇත.

***ප්‍රමුඛ පද:*** *ග්‍රාමීය ජනතාව, බැංකු පුරුදු, නිබන්ධය, බැංකු කටයුතු*

---

[1] **ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, tharakabatheegama1991@gmail.com**

# මත්තල ගුවන් තොටුපල ඉදිකිරීමත් සමග ජීවන තත්ත්වය වෙනස් වීම

**ඩබ්ලිව්. එම්. වයි. එම්. විජේතුංග**[1]

ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල වූ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදි කිරීම අවට ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වයට යම් ධනාත්මක හෝ සෘණාත්මක බලපෑමක් වූයේද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. අධ්‍යයනයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා මත්තල ගුවන් තොටුපල අවට ග්‍රාම සේවා වසම් 4ක් ඇසුරින් කුටුම්භ 80 ක නියැදියක් ආශ්‍රයෙන් අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රජා විද්‍යාත්මක සාධක, ආර්ථික විද්‍යාත්මක සාධක සහ ගුවන් තොටුපල ඉදි කිරීම හේතුවෙන් බලපාන සාධක යන ත්‍රිත්ව ඛණ්ඩනයන් යටතේ ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් දත්ත රැස් කරන්නට විය. දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය හා ආපතිකතා විශ්ලේෂණය ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කර ඇත. විස්තරාත්මක විශ්ලේෂණය යටතේ නියැදි ප්‍රදේශයේ ස්වභාවය සහ විචල්‍යයන් මූලික අරමුණ හා සමපාත වන ආකාරය සලකා බලන ලදී. ආපතිකතා විශ්ලේෂණය යටතේ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වීමේදී ප්‍රදේශයේ සංවර්ධනය වන අනෙකුත් අංශයන් ලෙස සේවා නියුක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍ය, මහා මාර්ග, ප්‍රවාහන, සන්නිවේදන, ජල හා විදුලි පහසුකම් අංශයන් හදුනාගනිමින් එම අංශයන් මත්තල ගුවන් තොටුපල ඉදි කිරීම හරහා ප්‍රදේශයේ ව්‍යාප්ත වීම හා ජන ජීවිතයට ඇති කරන ලද බලපෑම ප්‍රවර්ග විචල්‍යයන් ද්විත්වය බැගින් ගෙන විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵලයන්ට අනුව ගුවන් තොටුපල ආශ්‍රිතව ප්‍රදේශයේ තරුණ පිරිස සදහා ස්ථාවර රැකියා අවස්ථා විශාල වශයෙන් ජනනය වීම මත ප්‍රදේශයේ ජන ජීවිතය සදහා සෘජු ධනාත්මක බලපෑමක් ඇති කර ඇති බව පැහැදිලි වේ. එසේම අධ්‍යාපන පහසුකම් ද මැනවින් ප්‍රදේශයේ සංවර්ධනය වී ඇති බවත් ජන ජීවිතයෙහි ධනාත්මක බලපෑමක් ඒ හරහා ඇති වී ඇති බවත් මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වේ. එසේම ජල හා විදුලි පහසුකම් ගුවන් තොටුපල ඉදි කිරීමට පෙර සිටම බහුතර පිරිසකට පැවතීම හේතුවෙන් පොදු පරිභෝජන අරමුණින් වූ සේවා ක්‍රියාත්මක කිරීම ගුවන් තොටුපල ඉදි කිරීමත් සමග සිදුවූ බවත් ජන ජීවිතයේ එදිනෙදා පැවැත්මට සෘජු හා වක්‍ර අයුරින් එම සේවා බලපා ඇති බවත් තහවුරු විය. එසේම සෞඛ්‍ය පහසුකම් සම්බන්ධව ද ව්‍යාපෘති ගුවන් තොටුපල ඉදි කිරීමත් සමග ක්‍රියාත්මක වූ අතර ප්‍රදේශයට ආසන්න නොවීම මත එම සේවාවන් ලබා ගැනීමට ප්‍රදේශවාසීන්ට නොහැකි වී ඇති බවත් මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය හරහා ගම්‍ය වේ. සංවර්ධන ව්‍යාපෘතියක් හරහා ඇති විය හැකි සෘණාත්මක බලපෑම් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. ඒ අනුව මත්තල ගුවන් තොටුපල ක්‍රියාකාරීත්වය මත ඇතිවන අර්බුදකාරි තත්ත්වයන් මෙම ප්‍රදේශවාසීන්ට සෘණාත්මක බලපෑමක් ඇති නොවී ඇති බවද ලබා ගත් ප්‍රතිචාරික මත විශ්ලේෂණයේ දී පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** *මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල, ප්‍රදේශවාසීන්, ජීවන තත්ත්වය, සංවර්ධනය*

[1] **ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, kuruluwijethunga1992@gmail.com**

# ධීවර උපසංස්කෘතියේ නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**කේ. ඩී. එම්. දිල්රුක්ෂි**[1]

ධීවරයන් අතීතයේ පටන් සිය වෘත්තිය ආශ්‍රයෙන් සංස්කෘතියක් ගොඩනගාගෙන ඇති අතර ඊටම ආවේණික භාෂාවක්, විලාසිතාවක් මෙන්ම ජීවන රටාවක් ගොඩනගා ගැනීමෙන් සුවිශේෂී උප සංස්කෘතියක් නිර්මාණය වී ඇත. සංස්කෘතිය, ධීවර සමාජයේ අතීත ස්වභාවය, ධීවර උපසංස්කෘතියේ ඇතිවී ඇති විපර්යාසයන් මෙහිදී අධ්‍යයනය කරන ලදී. අම්බලන්ගොඩ ධීවර වරාය ආශ්‍රිතව සහ බලපිටිය ජම්බුවත්ත යන ධීවර ගම්මාන තුළ සිටින සමස්ත ධීවර පවුල් අතරින් 15% ක නියැදියක් තෝරා ගැනුණි.

තාක්ෂණයේ දියුණුවත් සමඟ සමාජය බොහෝ සෙයින් විපර්යාසයට ලක් වී ඇත. මේ අනුව ධීවර ජනවහර, ආගමික තත්ත්වය, විවාහය, අර්ථ ක්‍රම, ඇදහිලි විශ්වාස හා පුදසිරිත් මෙන් ම ධීවර උප සංස්කෘතිය විදහාපාන ජනශ්‍රැති අංගයක් වන ජනකවි ආදිය බොහෝ සෙයින් විපර්යාසයට ලක් ව ඇත. වර්තමානය වන විට එම උප සංස්කෘතිය තුළ ධීවර භාෂාව භාවිතය බොහෝ සෙයින් අඩු වී ඇති අතර ඔවුන් මහ සමාජයට මුහුවීම නූතනයේ ඉතා ශීඝ්‍රයෙන් සිදුවී ඇත. ඒ අනුව සාම්ප්‍රදායික උපසංස්කෘතිය තුළ පැවති ලක්ෂණ සහ නූතන සමාජයේ උපසංස්කෘතික ලක්ෂණ අතර ඉතා විශාල පරස්පරතාවක් පවතින බවත් ඒ සඳහා තාක්ෂණයේ වෙනස්වීම ප්‍රබල හේතුවක් වී ඇති බවත් පැහැදිලි ය. නමුත් නව තාක්ෂණයත් සමඟ ඇතිවන්නා වූ මෙම ප්‍රවණතාව පුද්ගලයාට මෙන්ම සාගර පරිසරයට ද අහිතකර ලෙස බලපාන්නා වූ බව පැහැදිලිය.

***ප්‍රමුඛ පදඃ*** *සංස්කෘතිය, ධීවර උප සංස්කෘතිය, නව ප්‍රවණතා, ජීවන රටාව*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, manjula92123@gmail.com**

# මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය ආසාදිතයින් මුහුණදෙන සමාජ ගැටලු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ජේ. එච්. සංජීව සමන් කුමාර්[1]**

දියුණු වෙමින් පවතින ලෝකයේ රෝග කාණ්ඩයන් අතර වර්තමානය වන විට සමාජ රෝග ඉතා විශාල ලෙස වර්ධනය වෙමින් පවතී. ඒ අතර මිනිස් ජීවිතවලට දැඩිව බලපාන්නා වූ සමාජ රෝගයක් ලෙස එච්.අයි.වී. ආසාදනය හැඳින්විය හැකිය. සමාජය තුළ නිරන්තර විවිධ ගැටලු මතු කරන්නාවූ එච්.අයි.වී. ආසාදනය හේතු කොටගෙන විශාල භීතිකාවක් සමාජය තුළ මෙන්ම ආසාදිතයින් තුළද නිර්මාණය වෙමින් පවතී. මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය ආසාදිතයින් මුහුණදෙන සමාජීය ගැටලු අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ බවට පත් විය. එච්.අයි.වී ආසාදිත රෝගීන් ලියාපදිංචි ආයතනයක් වශයෙන් වේයන්ගොඩ මැදවත්ත මාවතේ පිහිටා ඇති Positive Hopes Alliance ආයතනය දත්ත ලබා ගැනීමට තෝරාගත් අතර 65ක් වු සමස්තයෙන් ස්තරීභූත සරළ සසම්භාවි නියැදි ක්‍රමය යටතේ ස්ත්‍රී 8ක් ද පුරුෂ ආසාදිතයින් 17ක් ද ඇතුළු දත්ත දායකයින් 25ක් තෝරාගනු ලැබිණ. තෝරාගත් දත්ත දායකයින් ඇසුරෙන් 68%ක් පිරිමි දත්ත දායකයින් වීමත් ඒ අතරින් 60% අවිවාහක, සමලිංගික සේවනයට යොමු වූ දත්ත දායකයින් විය. සමලිංගික සේවනයේ වර්ධනය හා අනාරක්ෂිත බව, ආසාදිත රෝගින්ගේ ලිංගික චර්යා, නොදැනුවත්භාවය රෝග ව්‍යාප්තියට හේතු සාධක වේ.

මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය ආසාදිතයින් මුහුණ දෙන ප්‍රබල සමාජ ගැටලුවක් වන්නේ සමාජයේ කොන්වීමට මෙන්ම වෙනස් කොට සැලකීමට ලක් වීමයි. එමෙන්ම අධ්‍යාපන හා වෘත්තිය අවස්ථාවන් අහිමිවීම ආදි වූ මූලික මිනිස් අයිතීන් පවා අහිමිවිම දක්නට ලැබේ. මේ හේතු කොට ගෙන සමාජගත වෛරයක් මෙන්ම දැඩි මානසික පීඩනයක් ඔවුන් තුළ ජනිත වේ. විධිමත් ලිංගික දැනුමක් පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා ලබාදීම සිදුකළ යුතු අතර පුද්ගල සමානාත්මතාව, සම අයිතීන් සමාජයේ ස්ථාපිත කළ යුතු වේ. එච්.අයි.වී. ආසාදිත රෝගීන් කොන්කරමින් සමාජයේ හංවඩු ගැසීම වෙනුවට කළයුත්තේ සමාජ සංවර්ධන මෙහෙවරට මෙන්ම එච්.අයි.වී. ආසාදනය තුරන් කිරීමේ සමාජ මෙහෙවරට ඔවුන්ගේද දායකත්වය ලබා ගැනීමයි.

***ප්‍රමුඛ පද:*** *එච්.අයි.වී., සමලිංගිකසේවනය, ලිංගික අධ්‍යාපනය, ආසාදනය*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **sanjeewakumar02@gmail.com**

# නූතන අධ්‍යාපන සංස්ථාවේ ක්‍රියාකාරිත්වය ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**එච්. එම්. නයෝමි හර්ෂණී**[1]

සාඵල්‍යතාව යනු ස්ත්‍රියක් ලබන සජීවී දරු උපත් සංඛ්‍යාව වේ. අධ්‍යාපනය යනු සමාජයේ වෙනස්කම් ඇතිකරනු ලබන ප්‍රධාන කාරකයක් වන අතර එමගින් කාන්තාවගේ සමාජ තත්ත්වයද ඉහළ නංවනු ලබයි. වර්තමානය වන විට ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාව කෙරෙහි අධ්‍යාපනය මගින් යම් බලපෑමක් සිදු වේ. නූතන අධ්‍යාපන සංස්ථාවේ ක්‍රියාකාරිත්වය ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාව කෙරෙහි බලපෑමක් කරන්නේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව බවට පත් විය. නූතන අධ්‍යාපන සංස්ථාවේ ක්‍රියාකාරිත්වය ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාව කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ වන අතර සාඵල්‍යතාවට බලපාන සමාජ විද්‍යාත්මක සාධක සොයාබැලීම, දරු උපත් සීමා කිරීම පිළිබඳ ආකල්පය හඳුනා ගැනීම, උපත්පාලන ක්‍රම අනුගමනය පිළිබඳ ඇති දැනුවත්භාවය හඳුනා ගැනීමද මෙහි අරමුණු අතර විය.

අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගනු ලැබුවේ මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හීගොඩ නම් ග්‍රාම නිළධාරී වසමයි. ගම් හතරේ විවාහක ස්ත්‍රීන් සංඛ්‍යාව සමානුපාතිකව නියෝජනය වන පරිදි නියැඳිය ලෙස විවාහක ස්ත්‍රීන් 65 දෙනෙක් තෝරා ගන්නා ලදී. පර්යේෂණය සිදු කිරීම සඳහා දත්ත රැස් කිරීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලදී.

මෙම අධ්‍යයනය තුළින් එළඹුණු නිගමන ලෙස අධ්‍යාපනය සමග විවාහ වන වයස ප්‍රමාද වීම, විවාහ වන වයස් සීමාව ප්‍රමාද වනවිට දරුවන් සංඛ්‍යාව අඩුවීම, අඩු අධ්‍යාපනය ලත් කාන්තාවන් තුළ සාඵල්‍යතාව වැඩි වීමත් උසස් අධ්‍යාපනයේ නිරත වන කාන්තාවන්ගේ සාඵල්‍යතාව අඩුවීමත්, උසස් අධ්‍යාපනය ලත් කාන්තාවන්ට පවුල් සැලසුම් පිළිබඳ දැනුම වැඩිවීමත් දැකගත හැකිය. එසේම කාන්තාවන් අධ්‍යාපනයේ නිරතවන කාල සීමාව අඩුකිරීම සඳහා නව ප්‍රතිසංස්කරණ ඇති කිරීම, සාඵල්‍යතාව වැඩිකිරීම සඳහා රජය මගින් දැනුවත් කිරීම් වැඩසටහන් ඉදිරිපත් කිරීම ආදිය සිදු කළ යුතු වේ.

***ප්‍රමුඛ පද:*** *සාඵල්‍යතාව, අධ්‍යාපනය, කාන්තාව, පවුල් සැලසුම්*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, nayomiharshani125@gmail.com**

# නාට්ටාමි වෘත්තිකයන්ගේ සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ටී. ඒ. තරංජලී**[1]

සමාජය පිළිබද ප්‍රායෝගිකව අධ්‍යයනයේදී පැහැදිලි වන කරුණක් වන්නේ විවිධ වෘත්තීන් මත පදනම්ව ද උප සංස්කෘතීන් නිර්මාණය වීමයි. එවන් එක් වෘත්තියක් ලෙස නාට්ටාමි වෘත්තිය හැඳින්විය හැකිය. මුදල් රැස්කිරීම සදහා තම ශ්‍රමය යම් භාණ්ඩයක බර මත සලකා විකුණන පිරිස නාට්ටාමි වෘත්තිකයන් වේ. නාට්ටාමි වෘත්තිකයන්ගේ සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක හැදෑරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. නාට්ටාමි වෘත්තිකයන්ගේ පවුල් පසුබිම, අනාගතයේදී මෙම වෘත්තිකයන් නිසා සමාජයට ඇතිවිය හැකි බලපෑම, සමාජ සංවර්ධනය කෙරෙහි නාට්ටාමි උපසංස්කෘතිය කෙසේ බලපාන්නේද යන්න අධ්‍යයනය කිරීම හා යෝජනා ඉදිරිපත් කිරීම සුවිශේෂී අරමුණු අතර වේ.

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැනිං වෙළඳසැල හා මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. එහිදී ස්තරීභූත නියැදික්‍රමය යටතේ මැනිං වෙළඳසැල ආශ්‍රිතව සිටින නාට්ටාමි වෘත්තිකයන් 75ක්ද මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය තුළ සිටින වෘත්තිකයන් 45ක්ද වශයෙන් 120ක නියැඳියක් පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදි. ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස්කළ අතර ඒ තුළින් නාට්ටාමි වෘත්තිකයන්ගේ සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳව විවිධ සාධක හඳුනා ගැනුණි.

පර්යේෂණය තුළින් අනාවරණය වූයේ දුෂ්කර පළාත්වලින් වැඩි පිරිසක් විරැකියාව, අඩු අධ්‍යාපනය, දුගීකම ආදී වූ සාධක මත මෙම රැකියාව කෙරෙහි යොමු වී ඇති බවයි. ඒ අතර වැඩිපිරිසක් විවාහක තරුණ ද්‍රවිඩ ප්‍රජාව වේ. මොවුන් උපයන ආදායම එදිනෙදා ජීවත්වීම සඳහා පමණක් යොදාගන්නා පිරිසක් බවද මත්පැන්/මත්ද්‍රව්‍යය භාවිතයද ඉතා වැඩි පිරිසක් යැයි ද නිගමනය කළ හැකි විය. එසේම මෙම ප්‍රජාව තුළ දුගීකමේ සංස්කෘතිය පිළිබඳ ලක්ෂණ දක්නට ලැබෙන බවද අනාවරණය විය. ප්‍රජා සහභාගීත්ව සංවර්ධනයක් ඇති කිරීම, ධනාත්මක ආකල්ප වර්ධනය, විරැකියාව තුරන් කිරීම හා වෘත්තීය අධ්‍යාපනය පුළුල් කිරීම, ස්වයං රැකියා හඳුන්වා දීම, පාසල් අධ්‍යාපනය හා ඉතිරිකිරීමේ පුරුද්ද ඇතිකිරීම මෙම වෘත්තිකයන්ගේ සමාජ සංස්කෘතික පසුබිම සංවර්ධනයට ඉදිරිපත් කරනු ලබන යෝජනා අතර වේ.

***ප්‍රමුඛ පද:*** *සංස්කෘතිය, උපසංස්කෘතිය, නාට්ටාමි වෘත්තිය, දුගීකම*

---

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, tharanjaleethambawita1991@gmail.com**

# ආහාර හා පෝෂණය සම්බන්ධව ඇති සමාජ ආකල්ප මිනිසාගේ පෝෂණය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

**ඩබ්. ජී. ටී. එන්. ඩී. විජේරත්න**[1]

යහපත් සෞඛ්‍යයක් හා සාර්ථක ජීවිතයක් පවත්වාගෙන යාමේ දී ආහාර හා පෝෂණ ක්‍රියාවලිය මිනිසාට වැදගත් කාරණයක් සේ සැලකිය හැකිය. ප්‍රාථමික, ග්‍රාමීය, අර්ධ නාගරික, නාගරික යන ඕනෑම සමාජ ව්‍යුහයක ජීවත්වන්නාවූ මිනිසා සිය මූලික අවශ්‍යතාවලදී ආහාරයට මුලිකත්වය දෙනු ලැබේ. ලොව පවත්නා සංස්කෘතීන්වලත්, වෛද්‍ය ක්‍රමවලත් යහපත් සෞඛ්‍ය තත්ත්වය ගැන සාකච්ඡා කිරීමේ දී ආහාර හා පෝෂණය නිරායාසයෙන්ම මූලික තැනක් ගනියි. ආහාර හා පෝෂණය සම්බන්ධ සමාජ ආකල්ප කෙරෙහි සමාජ ස්තරායනය, ලිංගිකත්වය, වයස් මට්ටම් හා උගත්කම යන සාධකයන් බලපායි. මිනිසුන් තුළ පවතින ආහාර හා පෝෂණය සම්බන්ධ ආකල්ප පෝෂණ ඌනතා හා පෝෂණ ගැටලු ඇතිවීමට සෘජුවම බලපාන බව වත්මන් සමාජයෙන් පැහැදිලි වේ.

ශ්‍රී ලංකාව වැනි බහු සමාජීය ලක්ෂණ දරන රටක ආහාර හා පෝෂණය සම්බන්ධ සමාජ ආකල්ප රාශියක් දැකිය හැකිය. නිසැක වශයෙන්ම වැඩිහිටි අය දරන ඇතැම් ආහාර සම්බන්ධ ආකල්ප නිසා ගර්භණී මව්වරුන්ට හා ළදරුවන්ට අවශ්‍ය පෝෂණය නොලැබී යැමක් දකිය හැකිය. සමාජ සංස්කෘතික හා ආගමික මතවාද නිසා පෝෂණ විද්‍යානුකූලව ආහාරයක ඇති ගුණාත්මක වටිනාකම නොපිළිගැනීම පෝෂණය සම්බන්ධ ගැටලු ඇතිවීමට හේතුවක් වී ඇති බව පෙනේ. ආහාර හා පෝෂණය සම්බන්ධව පවත්නා සමාජ ආකල්ප මානව ජීවිතයට කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. අසම්භාවිත (අහඹු) නියැදිය යටතේ දත්ත දායකයන් පනහක් නියැදිය වශයෙන් යොදා ගන්නා ලදි. ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස්කරන ලදී. ආහාර හා පෝෂණය සම්බන්ධ සමාජ ආකල්ප සෘජුව මිනිසාගේ පෝෂණය කෙරෙහි බලපාන බව මෙහිදී අනාවරණය විය. එබැවින් ආහාර හා පෝෂණය සම්බන්ධයෙන් පැතිර පවත්නා සමාජ ආකල්ප පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීමත් ඒවා කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමත් ග්‍රාමීය මට්ටමේ පෝෂණ ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ඉතා වැදගත් වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *පෝෂණය, ස්තරායනය, පෝෂණ ඌනතා, සංස්කෘතිය, ආහාර*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, thushariwijerathna62@gmail.com**

# සමාජ වෙනස්වීමේදී වැඩිහිටි ආරක්ෂණ ක්‍රියාවලිය තුළ සිදු වී ඇති විපර්යාසය පිළිබඳව අධ්‍යයනය කිරීම

**ඊ. එම්. ලක්මිණී නදී සාරංගි**[1]

සමාජයේ සුවිශේෂී පුද්ගල කණ්ඩායමක් වශයෙන් වයස්ගත පුද්ගලයින් හඳුනාගත හැකිය. අවුරුදු 60ට වැඩි වයස් කාණ්ඩය ජීව විද්‍යාත්මකව විවිධ විපර්යාසයන්ට ලක් වන්නා සේම ඔවුන් කෙරෙහි පවත්නා සමාජ ආකල්පයන්ද වෙනස් වේ. ඒ අනුව ඔවුන් ආරක්ෂාව ලැබිය යුතු කණ්ඩායමක් බවට පත්වී තිබේ. සාම්ප්‍රදායික සමාජයේ මානව පවුල මඟින් ඔවුන්ගේ වයෝවෘද්ධභාවය ආරක්ෂාකාරීව හා තෘප්තිමත්ව ගෙවුණි. එකල සමාජ පසුබිම තුළ වැඩිහිටියා ගැටලුවක් නොවුණි. සමාජ වෙනස්වීමේ කාරකයන්ගේ බලපෑමත් සමඟ වැඩිහිටි ආරක්ෂණය විවිධ විපර්යාසයන්ට ලක් වෙමින් වත්මන් සමාජය තුළ වයස්ගත යැපෙන්නාගේ ආරක්ෂාව ගැටලුවක් වී තිබේ. මෙම පසුබිම තුළ සමාජ වෙනස්වීම වැඩිහිටි ආරක්ෂණ ක්‍රියාවලිය කෙරෙහි සිදුකරනු ලබන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණු විය.

ග්‍රාම නිලධාරී වසම් දෙකක් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගත් අතර සමානුපාතික ස්තරීභූත නියැඳි ක්‍රමය යටතේ 75කගෙන් යුක්ත නියැඳිය 59/A/1 ආරච්චිකන්ද ග්‍රාම නිලධාරී වසමෙන් 35ක්ද 533/C එගොඩවත්ත ග්‍රාම නිලධාරී වසමෙන් 40ක් ලෙස තෝරා ගැනුණි. සමාජ සංරක්ෂණය සැලකීමේදී ග්‍රාමීය ප්‍රදේශයේ 26ක් දරුවන්ගේ රැකවරණයේ ජීවත් වුවද නාගරික ප්‍රදේශයේ දරුවන්ගේ රැකවරණයේ සිටින්නේ 6ක් පමණි. ජීවත්වන ස්ථානය පිළිබඳව තෘප්තිමත්භාවය සැලකීමේදී ආරච්චිකන්දේ 32ක් තෘප්තිමත්වූ අතර එගොඩවත්ත 31ක් අතෘප්තිමත් විය. ඔවුන්ගේ දෙමාපියන්ගෙන් ලද ආරක්ෂාවම ඔවුන්ට ලැබෙන බව ආරච්චිකන්දේ 27ක් ප්‍රකාශ කළ අතර එගොඩවත්තේ 21ක් එසේ නොවන බව ප්‍රකාශ කළහ. දත්ත දායකයින් 36කට තම දෛනික කටයුතු ඉටුකර ගත නොහැකි අතර ඉන් ආරච්චි කන්දේ බහුතරය වන 14ක් දෛනික කටයුතු ඉටුකර ගන්නා ආකාරය පිළිබඳව තෘප්තිමත් වේ. නමුත් එගොඩවත්තේ බහුතරය වන 13ක් අතෘප්තිමත් වේ. සමාජ වෙනස්වීම් කාරකයන් සමඟ වර්තමානයේ වැඩිහිටියන්ගේ ආරක්ෂාව සෘණාත්මක විපර්යාසයකට ලක්ව ඇත. මේ නිසා සමාජයේ වැඩිහිටින් රැකබලා ගැනීම විවිධ ආයතන හා පුද්ගලයින් වෙත පැවරී තිබේ.

***ප්‍රමුඛ පද:*** *සමාජ වෙනස්වීම, වයස්ගත භාවය, වැඩිහිටි ආරක්ෂණය, සමාජ සංරක්ෂණය*

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, sarangiekanayaka27@gmail.com**

# වීදි වෙළඳුන්ගේ සමාජ පසුබිම හා ඔවුන් මුහුණදෙන සමාජ අර්බුද පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**එච්. කේ. ඕ. ජයවීර**[1]

රටක ආර්ථිකයට වැදගත් තැනක් වීදි වෙළඳාමෙන් හිමිවේ. වීදි වෙළඳාම යනු යම් පුද්ගලයකු ස්ථිර ස්ථානයක් නොමැතිව තැනින් තැනට භාණ්ඩ ගෙනයමින් වෙළඳාම් කිරීමය. ලංකාවේ වීදි වෙළඳාම නීති විරෝධී බව දක්වා ඇත. විවෘත ආර්ථිකය සමඟ බහුලව ව්‍යාප්ත වූ වීදි වෙළඳුන් අනවසරයෙන් නාගරික අවකාශයන්හි වෙළඳාම් කිරීම හේතුවෙන් විවිධ සමාජ අර්බුදයන්ට මුහුණදී ඇත. ඒ අනුව වීදි වෙළඳුන්ගේ වෙළඳාම අවිනිශ්චිත වී ඇත. රටේ ආර්ථික සංවර්ධනයට උරදෙන වීදි වෙළඳුන්ගේ සමාජ පසුබිම හඳුනා ගැනීමෙන් ඔවුන්ට මුහුණපෑමට වන සමාජ අර්බුද අවම කිරීමට ප්‍රතිපත්ති යෝජනා කිරීම මෙහි අරමුණ විය.

දත්ත දායකයින් සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ තෝරාගත් අතර ඔවුන්ගෙන් ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා යටතේ දත්ත රැස්කර ගන්නා ලදි. වීදි වෙළඳාම වෘත්තියක් ලෙස තෝරා ගැනීමට ඔවුන්ට බලපා ඇත්තේ වෙනත් රැකියාවක් කිරීමට සුදුසුකම් නොමැතිවීමය.

ඔවුන්ගෙන් වැඩි දෙනෙක් මත්පැන් පානයට යොමුව ඇත. ඔවුන්ගේ සමාජ පසුබිම එලෙස සකස් ව ඇත. අනවසර ස්ථානයක වෙළඳාම් කිරීමත් කප්පම් ගෙවීමට සිදුවීමත් ඔවුන් මුහුණ දුන් ගැටලු අතර විය. නිසි ඉඩ නොවීම නිසා භාණ්ඩ සොරකම්ද දැකිය හැකි අතර වීදි වෙළඳුන් මුහුණපාන සමාජ අර්බුදයන්ට පිළියම් ලෙස වෙනත් වෙළඳ ස්ථානයන් ලබාදුන්න ද ඒවා වෙළඳුන්ට තව දුරටත් ගැටලු ඇතිකරන ඒවා බවට පත් වී ඇත. රජය මඟින් වීදි වෙළඳුන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දුන්නද එම විසඳුම් ඔවුන්ගේ සමාජ පසුබිම හා අර්බුද හඳුනා ගැනීමෙන් ඉදිරිපත් කළ ඒවා නොවේ.

***ප්‍රමුඛ පද:*** වෙළඳාම, සමාජ පසුබිම, සමාජ අර්බුද, වීදි වෙළඳාම, ආර්ථිකය

[1] **සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, oshadhijayaweera@gmail.com**

# සේවක ඵලදායීතාව උදෙසා මානව සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්. තරිඳු ධනුෂ්ක විජේතුංග[1]**

නූතනය තුළ ක්‍රියාත්මක වන විවෘත ආර්ථික ක්‍රමය හරහා ගොඩනැගෙන සංකීර්ණ ක්‍රියාවලිය තුළ ඉතාමත් අඩු අවධානයක් මානව සම්පත කෙරෙහි යොමු වී ඇත. විශේෂයෙන් රැකියා සම්බන්ධයෙන් සේවකයන් තුළ අතෘප්තිකර තත්ත්වයක් පැවතියත් එම තත්ත්වය යටපත් කරගෙන රැකියාවන්හි නිරතවන ස්වභාවයක් දැක ගත හැකි වේ. පන්නිපිටිය, මාකුඹුර සිලෝන් බිස්කට් ලිමිටඩ් ආයතනයේ ස්ථීර සහ කුලී පදනම මත සේවයේ නියුතු ස්ත්‍රී සහ පිරිමි මුළු සේවකයින් 1379 කගෙන් සමානුපාතික ස්තරීභූත සරල සසම්භාවී නියැදීම යටතේ 50 දෙනකුගෙන් යුත් නියැදියක් තෝරා ගනු ලැබිණ. සම්මුඛ සාකච්ජා හා ප්‍රශ්නාවලි මඟින් දත්ත රැස් කර ගන්නා ලදි.

ආයතනය නිපදවන ද්‍රව්‍ය මත නොව එහි සේවකයින්ගේ යහපත්භාවය මත ආයතනයේ සාර්ථකත්වය රඳා පවතින බව මෙහිදී අනාවරණය විය. මූල්‍ය හා භෞතික සම්පත් නිවැරදිව මෙහෙය වීමට හා ඒවායේ සාර්ථක අසාර්ථකභාවයට ආයතනයේ සේවකයන් ප්‍රමුඛ වන අතර ආයතනික වශයෙන් ගත් කළ ස්ථීර සේවකයන්ට සාපේක්ෂව කුලී පදනම මත සේවයේ නියුතු පිරිස මුහුණ දෙන ගැටලු ප්‍රමාණය බහුලය. මානව සම්පත් කළමනාකරණය සේවක තෘප්තිමත්භාවය තුළින් සේවක ඵලදායීතාව ඇති කිරීමට මෙන්ම සේවක ගැටලු රැසක් විසඳීමෙහිලා දායක වේ. ආයතන හා සංවිධාන තුළ සේවාවන් සපයන සේවා නියුක්තිකයන්ගේ ඉල්ලීම් ඉටු කර ගැනීමට උද්සෝෂණ, වැඩ වර්ජන, උපවාස වැනි වෘත්තීය ඉල්ලීම්වලට යොමු නොවීම සඳහා ඊට උචිත ආකාරයේ සේවා පරිසරය නිර්මාණය කිරීම සිදු කළ යුතුය.

***ප්‍රමුඛ පද:*** *සේවක ඵලදායීතාව, මානව සම්පත් කළමනාකරණය, සේවක තෘප්තිමත්භාවය*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **tharinduwijethunga91@gmail.com**

# හර්මන් හෙසගේ ජීවන දර්ශනයේ ඇති වැදගත්කම

**ඩී. ජී. ඒ. එස්. සමරසිංහ**[1]


ජීවත්වීමට ඇති හොඳ ම සහ එක ම මග විය යුත්තේ යථාවබෝධයෙන් යුක්තව ජීවත් වීමය. ව්‍යවහාරික දර්ශනයේ උප විෂය ක්ෂේත්‍රයට අයත් ජීවන දර්ශනය තුළින් නිරූපණය වන්නේ ජීවිතය ධනාත්මකව සහ ඍණාත්මකව දෘශ්‍ය විය හැකි බවයි. විවිධ අවස්ථා ඉස්මතු කරමින් ජීවිතයේ හරය කැටිකොට දක්වමින් එහි සුන්දර ස්වභාවය ම උත්කර්ෂණයට බඳුන් කළ දාර්ශනිකයන් පෙරදිග අවධිවල මෙන් ම බටහිර මුල් ග්‍රීක අවධියේ පටන් විකාශිත විවිධ අවධිවලින් හමු වේ. එමෙන්ම දුක, කඳුල පමණක් උරුම වන අර්ථ රහිත මේ ජීවිතයේ ඇති හරය නම් කිමද? සියලු සත්ත්වයෝ මංමුලාව සිටිති. ක්ෂණයක් ක්ෂණයක් පාසා නැවුම් අර්ථයන් සොයන මිනිසා ගතවන හෝරාවේ දැඩි ඉච්ඡාභංගත්වයකට පත්ව ඇත. ''අපි සැවොම පරාජිතයෝ වන්නෙමු'' මිනිස් ජීවිතය යනු හරවත් නොවන එකකැයි ඍණාත්මක පැතිකඩක සිට අර්ථ දැක්වූ සමකාලීන දර්ශනයේ ඇතැම් දාර්ශනිකයෝ සිටිති.

ජර්මන් ජාතික හර්මන් හෙසගේ දර්ශනය පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමේදී ඔහු විසින් රචිත නවකතා සහ කෙටිකතාවල අන්තර්ගත දාර්ශනික හරය (ජීවන දර්ශනය) වැදගත් කොට සලකමි. ඔහුගේ නවකතාවන් වන සිද්ධාර්ථ සහ ඩේමියන් තුළ හෙසගේ දාර්ශනික අදහස් ගැබ්ව තිබේ. විශේෂයෙන් සාන්දෘෂ්ටික පරපුරේ ලේඛකයෙකු වන හෙසගේ දර්ශනය පූර්ණ සාංදෘෂ්ටිකවාදී සංකල්පිත දර්ශනයක් නොවන බවත් එහි පැහැදිලි වෙනසක් තිබේද යන්න පිළිබඳවත් මෙම පර්යේෂණය යටතේ විමසා බැලීමට නියමිත ය. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ හෙසගේ දර්ශනය තුළ සුවිශේෂතාවක් තිබේද යන්න විමසා බැලීමයි. පර්යේෂණ අරමුණු ලෙස හර්මන් හෙසගේ ජීවන දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක් සිදුකිරීම සහ සමාජමය වැදගත්කම අධ්‍යයනය කිරීම පෙන්වාදිය හැකිය.

හෙසගේ ජීවන දර්ශනය ඇගත් බොහෝ කෘතිවල අඩංගු වන දාර්ශනික සංකල්ප පිළිබඳ මුල් විචාර හෝ පර්යේෂණයන් දුර්වල බැවින් ප්‍රසිද්ධ නවකතා වන සිද්ධාර්ථ සහ ඩේමියන් හි එන දාර්ශනික සංකල්ප සහ එමගින් නිරූපිත ජීවන දර්ශනය තුළින් විචාරයකට බඳුන් කිරීම මෙහි වැදගත්කමකි. සමකාලීන සාන්දෘෂ්ටිකවාදී දාර්ශනික අර්ථයන්ට බලපෑ බොහෝ සාධකයන් අධ්‍යයනය කර එයින් මිදී ජීවිතය ධනාත්මකව මෙහෙයවීම සඳහා ජීවිතයේ ස්වභාවය යථාර්ථවත්ව වටහා ගැනීමට මෙම පර්යේෂණය ඉතා වැදගත් වේ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මූලාශ්‍රය පරිශීලනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ අතර න්‍යායාත්මක අධ්‍යයනය තුළින් තොරතුරු ඒකරාශී කරන ලදි. හෙස විසින් රචිත සිද්ධාර්ථ සහ ඩේමියන් කෘති දෙක විමසා බැලීමේදී පෙනී යන්නේ අර්ථවත් ජීවන දර්ශනයක් ගෙන දෙන බවයි. ඒ අනුව හෙසගේ දර්ශනයේ සුවිශේෂීතාවක් පවතින බව නිගමනය කළ හැකිය.


***ප්‍රමුඛ පද:*** *ජීවන දර්ශනය, ඉච්ඡාභංගත්වය, සාන්දෘෂ්ටික, ධනාත්මක*

---

[1] **පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,**

# හෝටල් සේවකයින් ගේ රැකියා තෘප්තිය ඵලදායිත්වයට බලපාන ආකාරය පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්. (කොග්ගල ද ගෝට්ට්‍රිස් හෝටලය ඇසුරින්)

**හිරුණි ප්‍රසාංගිකා පුෂ්පවෙල**[1]

ඕනෑම ආයතනයක හෝ සංවිධානයක ප්‍රගමනය සඳහා හේතු සාධක වන ප්‍රමුඛතම තීරකවරුන් වන්නේ එම ආයතනයේ සේවක මණ්ඩලයයි. මෙම සේවකයන්ගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීම එම ආයතනයේ හෝ සංවිධානයේ අපේක්ෂිත අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ඉවහල් වන බව අපට පැවසිය හැකිය. එම කරුණ සාධනය කිරීම සඳහා හෝටල් සේවකයින් ගේ රැකියා තෘප්තිය ඵලදායිත්වයට බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කෙරේ. මේ සඳහා උචිත අධ්‍යයන ක්ෂෙත්‍රය ලෙස කොග්ගල ගෝට්ට්‍රිස් හෝටලය තෝරා ගත් අතර දත්ත රැස් කර ගැනීම සඳහා ප්‍රශ්නමාලා හා සම්මුඛ සාකච්ඡා ක්‍රම භාවිත කරන ලදි.

හෝටලය තුළ සේවයේ නියුතු සමස්ත සේවක පිරිස අතරින් වැඩි ප්‍රතිශතයක් තම රැකියාව පිළිබඳව සැහීමකට පත්වන බව ප්‍රකාළ කළ අතර තමාට සේවය කිරීමට ඇති වැඩ පැය ගණන, වැටුප හා වරප්‍රසාද, වැඩ පරිසරය, තමා දරන තනතුර ආදී කරුණු පිළිබඳව ඔවුන් මධ්‍යස්ථ එකඟතාවක් දක්වා තිබුණි. විශේෂයෙන් ම මෙහිදී සේවක තෘප්තිය වර්ධනය කිරීම උදෙසා හෝටලය තුළ සේවකයින් පුහුණු කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බව දැකගත හැකි විය.

ඕනෑම ආයතනයක සේවය කරන සේවකයින්ගේ කායික මානසික සුවතාව සඳහාත් පුද්ගල සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහාත් අභිප්‍රේරණ උපාය මාර්ගයන් යොදා ගැනීම සිදු කරන අතර එය ආයතනික සංවර්ධනය සඳහා පිටිවහලක් සපයන බව ප්‍රකාශ කළ හැකිය. එම ක්‍රමවේදයන් භාවිතයට ගැනීම තුළින් සේවකයින්ගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීම පහසු වන අතර හුදෙක් ම එය හෝටල් ක්ෂේත්‍රය සඳහා පමණක් නොව ඕනෑම වෘත්තිය ක්ෂේත්‍රයක් සඳහා භාවිතයට ගත හැකි බව මෙහිදී නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *රැකියා තෘප්තිමත්භාවය, සේවකයා, අභිප්‍රේරණය, ආයතනය*

---

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **h.prasangika@gmail.com**

# මානසික රෝග සඳහා බලපාන පසුබිම් සාධක පිළිබඳ සමාජ මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. එස්. ජේ. විතානගේ[1]

මානසික රෝග යනු ලෝකය තුළ මෙන්ම ලංකාව තුළ ද අවධානය යොමු වියයුතු අංශයකි. මානසික රෝග යනු පුද්ගල හැසිරීම් හෝ චර්යාවේ සැලකිය යුතු වෙනසක් ඇති වීමකි. පුද්ගල හැසිරීම් තමන්ට මෙන්ම අන් අයටත් හිංසාකාරී වන්නේ නම් ඔවුන් මානසික රෝගීන් ලෙස සැලකේ. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව දැනට ලෝකයේ පවතින ප්‍රධාන ආබාධ දහයෙන් මානසික ආබාධ සිව්වැනි ස්ථානයට පත්ව ඇති අතර ලෝක ජනගහනයෙන් මිලිනය 450ක පිරිසක් මානසික රෝගවලින් පෙළෙයි. ශ්‍රී ලංකාවේද සෑම පුරවැසියන් 10 දෙනකු අතරින් එක් අයෙක් සුලු මානසික රෝගාබාධයකින් පෙළෙන අතර සිව් දෙනෙකුගෙන් එක් අයෙක් උග්‍ර මානසික රෝගාබාධයකින් පෙළෙයි.

මානසික රෝගවලට බලපාන පසුබිම් සාධක කවරේද යන්න පර්යේෂණ ගැටලුව වූ අතර දත්ත රැස් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පදනම් කොට ගැණුනි.

ප්‍රශ්නාවලී හා සිද්ධි අධ්‍යයනය ඇසුරින් ජාතික රෝහලේ මානසික රෝග සායනයට පැමිණෙන රෝගීන් 60 කගේ භාර කරුවන්ගෙන් ලබා ගත් දත්ත ඇසුරින් අනාවරණය වූයේ මානසික රෝග සඳහා මත් ද්‍රව්‍යවලට මත්පැනට ඇබ්බැහි වීම ජානමය හේතු, එදිනෙදා ජීවිතයේ ඇති වන ආතතික තත්ත්වයන් හේතු වන බවයි. එසේම ශරීරය තුළ ඇති වන හෝමෝනවල වෙනස් වීම්, මානසික හේතු, සමාජමය හේතු, අඹු සැමි ගැටලු, අසාර්ථක පවුල් ජීවිත ගත කිරීම හා වයස් ගත වීම යනාදී සාධකද මානසික රෝග සඳහා බලපාන බවයි. මෙම මානසික මානසික රෝගවලින් වැළකීමට ඉහත සඳහන් තත්ත්වයන්ගෙන් මිදීමත් උපදේශනය හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීම යනාදියත් සිදු කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *මානසික රෝග, පසුබිම් සාධක, මනෝ ප්‍රතිකාර, උපදේශනය*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **kalanijayawikrama92@gmail.com**

# An Empirical Study on the Socioeconomic Factors Affecting to Chronic Kidney Disease

**C. B. M. P. D Weerasekara[1]**

Chronic kidney disease has become a major health issue especially in third world countries. In Sri Lanka main causative factors for chronic kidney disease(CKD) are not hypertension or diabetes like in other countries. High prevalence of CKD was identified in North Central Province in last few decades. But the causative factor of CKD is still unknown. The main objective of this study was to identify socioeconomic factors which affect the CKD in Anuradhapura district. Therefore the research problem is what are the socioeconomic factors affecting CKD In order to accomplish this task quantitative research approaches were employed. The research area was Kabithigollawe Divisional Secretariat and data was collected in Gonahaddanawa, Wattewewa, Aiyatlhigewewa Grama Niladhari divisions. The research sample was 100 and simple random sampling, stratified sampling methods were used to collect data from kidney patients. Key informant interviews and focused group discussions were also used to collect data.

In the theoretical part the concepts of factors affecting to chronic kidney disease were discussed. The results of the questionnaire and key informant interview present socioeconomic factors affecting to CKD and what are the policies have been taken to eradicate this situation. Male farmers who drink well water have a risk level of affecting from CKD. The mean age of the CKD patients is 60. Most of the patients have lower income and lower socioeconomic status. Majority of the patients have studied from grade 1 to grade 5. Water sources, food patterns and lifestyle mainly affect CKD. The socioeconomic background was depicted through their infrastructure facilities which were highly under developed. Enriching the knowledge of health education is important to eradicate CKD in Sri Lanka.

***Key words:*** *Chronic kidney disease, Socioeconomic factors, Infrastructure, lifestyle*

[1] **Department of Sociology and Anthropology, paramitha.hck@gmail.com**

# Health Risk of Biomass Cooking in Rural Sri Lanka: A quantitative analysis

**N. D.V. Sandaroo[1]**

The traditional, inefficient biomass energy consumption in rural settings in developing nations deprivá the community's ability to reach long term goal of sustainability because of its higher impacts on health risk of households. Although the adverse effects of indoor air pollution on respiratory health, birth weight etc. are well researched in the world, cost of biomass cooking in terms of health risk coupled with traditional fuel usage in daily cooking in Sri Lanka has not been adequately addressed and discussed. This study aims at examining the factors affecting health risk of rural households, emphasizing the significant positive impact of biomass cooking. In this Study, Health risk of households is considered as the dependent variable while, awareness on cleaner fuel benefits, fuel type used for cooking, per head income and mean age of household, time spent on cooking and collecting firewood and education level of the spouse of household head acted as explanatory variables. Primary data were collected from a sample size of 200 in Karametiya, Badulla district in Sri Lanka, using a structured questionnaire completed through trained enumerators. SPSS was used in the analysis of data while Binary logit model and Principle Component Method were employed to estimate relationships and to obtain expected results. Quartile analysis on the variable; "health risk" was performed and Pearson correlations were obtained to examine the relationships between the selected dependent and independent variables for the Binary Logit Model with the purpose of setting a base for the regression.

The results suggest that the wood fuel cooking, lack of awareness and higher mean age significantly increased the probability of a household of being in biomass cooking related health risk recommending the national policies to be implemented on changing cooking practices and fuel type, improving ventilation, and increasing opportunity cost of women being unemployed.

***Key words:*** *Binary Logit Model, Biomass, Health risk, Principle Component Method*

---

[1] **Department of Economics, veenavee92n@gmail.com**

# Factors Affecting the Cybercrime Victimization of Youth: In the Case of University of Sri Jayewardenepura

**G. P. S. Nalaka**[1]

Nowadays, technological development of internet in globe is growing rapidly by broadening its accessibility. Along with the benefits that the development of internet has brought, serious problems have emerged as a result of misusing internet for criminal purposes. According to the recorded incidents, a large portion of youth got affected from cybercrimes. Therefore, the study focuses on identifying the factors affecting the cybercrime victimization of youth. The study performed with reference to University of Sri Jayewardenepura due to its large numeral of youth population and its diversity. It is mainly based on primary data and a web-paper based questionnaire has been used to collect data**.** Stratified sampling technique has been applied to select 420 undergraduates by proportionately allocating among faculties. Descriptive statistical tools were used to present data. Furthermore, binomial test, composite index construction methods were applied to measure the cybercrime victimization and suggested determinants of cybercrime victimization. Chi**-**square tests and logistic regression are worked out to identify the factors affecting the cybercrime victimization**.** It is revealed that a youngster has more than half of chance to being a cybercrime victim. Relationship with family, digital literacy, awareness, security management, privacy concentration, and surfing internet in purpose of education were negatively associated with the cybercrime victimization of youth. On the other hand, income level, relationship with friends, and number of hours spending on internet were positively associated with the cybercrime victimization of youth. Hence, it is required to broaden the knowledge about online security, privacy, and awareness of youth on using internet effectively whilst minimizing cybercrimes. With the aim of that, knowledge centers in universities, government and the entire society has to be attentive on this dilemma.

***Key words:*** *Cybercrimes, Youth, Security, Privacy, Awareness*

[1] **Department of Social Statistics, hellonalaka@gmail.com**

# An Analytical study of the Post Conflict Psychosocial Rehabilitation of Combat Military Personnel with special reference to Sri Lanka Army

**E. D. K. Seneviratne**[1]

The conflict in Sri Lanka ended 8 years ago, yet the post conflict progress with regard to combat troops is yet to be ascertained. The main objective of this research entitled "**An Analytical study of the Post Conflict Psychosocial Rehabilitation of Combat Military Personnel with special reference to Sri Lanka Army"** was to identify the main psychosocial factors affecting combat military personnel subsequent to the conflict period and to investigate whether there is a need for post-conflict rehabilitation for Army Combat Troops. The study was carried out in three phases including a literary study, survey study and focused group discussion. Primary and secondary data were collected for the literary study and a self administered questionnaire was used for the survey study. 110 participants were randomly selected while 6 key informants were selected for the focused group discussion. 83% were male serving officers, belonging to the middle class, having higher education qualifications. Female officers were less due to limited recruitment. 65% of military personnel showed higher preference towards combat duties and reported stressful conditions in the post conflict period. Financial distress was highlighted as the main socioeconomic problem. Anticipated change after the conflict was experienced by 52%. The study has proven psychosocial rehabilitation as essential for combat military personnel. 75% of respondents had not participated in any rehabilitative programmes and reported existing programmes as unsatisfactory. The lack of educational opportunities and engagement with society in the post conflict period was the main issue highlighted. Encouraging free thinking to abolish the military mindset was amongst the recommendations made. An efficient vocational training system with fitting job opportunities to utilize the experience of combat military personnel as means of advocating reconciliation were recommended for the retired, disabled and wounded.

***Key words:*** *Post conflict, rehabilitation, combat, Army*

[1] **Department of Sociology and Anthropology, esh.sen@hotmail.com**

# She Writes With a Man in Mind (An Analysis of the 20th Century Female Künstlerroman's Role in Constructing Female Gender Stereotypes)

**H. P. Deshanee Bhagya Senevirathne**[1]

Bildungsroman flourished as a literary genre at the outset of the 19th Century. As a result, its subgenre Künstlerroman, where the main character reaches an artistic destiny through mastery of an artistic craft thrived. Though initially it was preoccupied with romance, towards the 20th Century female theorists and novelists added an aura of feminism into it. Thus, like many other, the three novels, 'The Golden Notebook' by Doris Lessing , 'Diviners' by Margaret Laurence and 'Hotel du Lac' by Anita Brookner are considered as 20th Century female Künstlerromans in which the protagonists are writers who pursue feminism. Yet, by using these three novels, I counter-argue that not all female Künstlerromans of the 20th Century can be generalized as novels which demonstrate the effects expected of feminist writing, and turn them into free women. Patriarchal notions are so powerful that detaching from it makes the three protagonists alienated and so they willingly conform to its stereotypes. Moreover, though the art of 'feminist writing' is considered as a means of challenging patriarchy, the three protagonists prove that not every woman writer explicitly supports the feminist ideologies. Since Bildungsroman is in the form of Confessional Novels, Künstlerroman has been analyzed using Rosalind Cowards' perspectives about the 'Confessional Novels'. Relating to that, it is argued that the coming-of-age of female protagonists happen in relation to phallocentrism and experiences of sexuality. In essence, Female artist is developed in terms of the female gender stereotypes, so fails often to criticize patriarchy, conventional notions about women and promote gynocentrism, though a female writer is usually known to be doing that through a text. Accordingly, 20th Century female Künstlerroman can be considered as a gendered genre.

***Key words:*** *Künstlerroman, Free women, Gynocentrism, Phallocentrism, Alienation*

[1] **Department of English, deshaneeb@gmail.com**

# Politics Economy IT GIS and Stat

# 19 වන හා 20 වන සියවස්වල ශ්‍රී ලාංකේය දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳ අධ්‍යයනයක්

**ජී. එම්. ඉරේෂා ලක්මාලි අපෝන්සු[1]**

සිංහල රාජ යුග හා සම්බන්ධ සමාජයේ සිටි කාන්තාවන් අතරින් දේශපාලනයේ යෙදුණු බිසෝවරුන් ගැනත්, වීර ක්‍රියාවන්හි නියැලුණු වීරවරියන් පිළිබඳවත් වංශකතා හා ශිලාලේඛන මූලාශ්‍රය ඇසුරින් අනාවරණය වේ. ශ්‍රී ලංකාව පැරණි යුගය පසුකර බටහිර ජාතීන්ගේ යටත් විජිතයක් බවට පත් වීමත් සමඟ මෙරට සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අංශවල විවිධාකාර විපර්යාසයන් ඇති විය. 19 වන හා 20 වන සියවස්වල ශ්‍රී ලාංකේය දේශපාලනයේ කාන්තා නියෝජනයට එම සමාජ විපර්යාසයන් විවිධ මුහුණුවරින් බලපාන ලදි. ඒ අනුව මිෂනාරි අධ්‍යාපනය, ධනවාදී ආර්ථික රටාව, දේශපාලන පවුල් පසුබිම උපස්ථම්භක වී ඇත. දේශපාලනමය අවශ්‍යතා සපුරා ගනුවස් 1931 දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය හිමි වුණි. ස්ත්‍රී පුරුෂ සමානාත්වය ඇති කිරීම ප්‍රජාතන්ත්‍රවාදී අවශ්‍යතාවකි. දේශපාලනික නියෝජනය අතින් ස්ත්‍රීන් පිරිමින්ගේ තත්ත්වයට කිසිසේත් සමාන නොවේ. රටේ ජනගහනයෙන් 53% ක් එනම් භාගයකටත් වඩා ස්ත්‍රීන් සිටියත් දේශපාලන ආයතනයක් වූ පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 4.8% ක අවම මට්ටමක පවතියි.

මේ සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රාමාණික බුද්ධිමතුන් විසින් රචනා කරන ලද ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පදනම් කරගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. පර්යේෂණයෙන් කාන්තාව දේශපාලන ක්ෂේත්‍රය නියෝජනය කළ යුත්තේ ඇයි ද යන්නත්, නිදහස් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ඡන්ද අපේක්ෂිකාවන් පිළිබඳවත් ඒ ඇසුරින් හඳුනාගත් සුවිශේෂී චරිත කිහිපයක් පිළිබඳවත් සාකච්ඡා කෙරේ. එමෙන් ම ශ්‍රී ලංකාව තුළ වර්ධනය වූ කාන්තා සංවිධානවල ක්‍රියාකාරිත්වය, පාර්ලිමේන්තු දේශපාලනයට කාන්තා නියෝජනය එක්වීමට පසුබිම සැකසුණු ආකාරයත් ඒ තුළ පැන නගින බාධකත්, ඒ සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රමවේද පිළිබඳත් අවධානය යොමු කෙරේ. තත් කාලීනව ලාංකේය ඉතිහාසයේ ස්ත්‍රීන් දියත් කළ දේශපාලන අරගල හා ව්‍යාපාර අධ්‍යයන කිරීමත්, කාන්තා නියෝජනය දේශපාලනයේ ඉහළ තළ තුළ අවම වීමට හේතු වූ කාරකයන් හා කාන්තා නියෝජනය වර්ධනයට ගත හැකි විකල්ප පෙන්වාදීම ආදිය වේ. ඒ අනුව අපට නිර්ණය කළ හැකි වන්නේ රටේ සංවර්ධනයට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම දායකත්වය එකසේ වැදගත් වන බවයි. දියණියක්, තරුණියක්, ගෘහණියක්, මවක් ලෙස සිය භූමිකාවෙන් ලොවක් සනසන ඇය තුළ දාරක ප්‍රේමය, කරුණාව මෙන්ම සැමියාගේ සාර්ථකත්වයේ පෙර සලකුණ ඇයයි. කාන්තාවක් උපතින්ම හිමි කරගන්නා මෙකී උතුම් චරිත ලක්ෂණ රටක ඉදිරිගමනකට යොදා ගත නොහැක්කේ මන්ද? එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය සුරකිමින් කාන්තාවගේ දේශපාලන නියෝජනය සක්‍රිය කිරීමට උත්සාහ ගත යුතු වේ.

***ප්‍රමුඛ පදඃ*** *දේශපාලනය, කාන්තා නියෝජනය, බාධක, විකල්ප ක්‍රම*

---

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ireshalakmali185@gmail.com**

# ප්ලතෝනික හා බෞද්ධ දේශපාලන සංකල්ප පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

කේ. ආර්. ගයානි රන්දිකා[1]

බටහිර දේශපාලන දර්ශනයේ පියා වූ ප්ලේටෝ ක්‍රි. පූ 428 දී ග්‍රීසියේ උපත ලද්දේ ය. ඇත මැත සියලු දාර්ශනිකයන් අතරින් කේන්ද්‍රීය වූ දාර්ශනික හා සංකල්පනා ඇති ශ්‍රේෂ්ඨ මිනිසා ප්ලේටෝ වන අතර, ඔහු පරමාදර්ශී දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කර තිබේ. ක්‍රි. පූ 6 වන සියවසේ දී උපන් ගෞතම බුදුරජාණන් වහන්සේ විමුක්තිය පරමාර්ථ කොට දේශනා සිදු කළත් ලෞකික ජීවිතයක් බෞද්ධ පාලන දර්ශනයක් ලොවට දේශනා කර ඇත.

පරමාදර්ශි පාලනය, දාර්ශනික පාලකයා, ජනසම්මතවාදි පාලනය, සක්විති වත, සප්ත අපරිහානි ධර්ම ආදි බෞද්ධ දේශපාලන දර්ශන අර්ථයන් හා ප්ලතෝනික දර්ශන අර්ථයන් නූතන රාජ්‍යයන් භාවිත කළත් ඒවා ජනහිතකාමි යුක්ති ගරුක, නීතිය ක්‍රියාත්මක කරන දාර්ශනික පාලකයන්ගෙන් යුත් පරමාදර්ශි රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකිද? යන්න විමසීමට ලක් කළ යුත්තකි. මෙම පර්යේෂණය ප්ලතෝනික දේශපාලන දර්ශනය හා බෞද්ධ දේශපාලන සංකල්ප තුලනාත්මක ව අධ්‍යයනය තුළින් රාජ්‍ය හා ආණ්ඩු පිළිබඳ සංකල්පය කොතෙක් දුරට සමාජ යහපත උදෙසා යොදා ගත හැකි ද යන්න විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණු වේ. එසේම ප්ලේටොගේ දේශපාලන න්‍යායට බුදුන් වහන්සේගේ දේශපාලන දර්ශනය එකතු කිරීම තුළින් වඩාත් යහපත් පාලකයෙකු බිහි කර ගැනීමටත් ඔහු තුළ යහපත් දේශපාලන ගුණාංග තිබිය යුතු බවත් මෙහිදී පර්යේෂණයට ලක් කොට තිබේ. උක්ත ප්‍රස්තුතයට අදාළව ප්ලතෝනික දර්ශනය පිළිබඳ ප්ලේටෝගේ සමූහාණ්ඩුව ග්‍රන්ථයත්, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ත්‍රිපිටකයේ අදාළ සූත්‍ර දේශනාත්, මෙම විෂය ක්ෂේත්‍රවලට අයත් වියතුන් විසින් රචිත පර්යේෂණ හා ශාස්ත්‍රීය ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය ලෙසත් පර්යේෂණ ක්‍රමවේදය සඳහා භාවිත කර ඇත.

නව ලෝකයට ගැළපෙන නව දේශපාලන ක්‍රමවේදයක් ප්ලතෝනික දර්ශනයේ හා බෞද්ධ දේශපාලන දර්ශනයේ යහපත්, සාර්ථක ක්‍රමවේද මිශ්‍රණයෙන් පරමාදර්ශි හා චක්‍රවත්තී පාලනයක් බිහිකර ගත හැකි බව මෙම පර්යේෂණයේ නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** *ප්ලතෝනික, පරමාදර්ශි, බෞද්ධ, දේශපාලන, දර්ශන, රාජ්‍ය*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, **krgayanirandika@gmail.com**

# සේනාපතිවරුන් රාජතන්ත්‍රය වෙත එල්ල කළ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (පොළොන්නරු යුගය ඇසුරින්)

**ඩී. ඩී. චන්දිමා ජානකී ධර්මසේන**[1]

මෙරට දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳව විමසා බැලීමේ දී වර්තමානයේ පාර්ලිමේන්තු පාලන ක්‍රමයක් පැවතිය ද, අතීතයේ රජු මූලික කර ගත් රාජාණ්ඩු ක්‍රමයක් පැවතුණි. එහි පාලනයේ ප්‍රධානියා රජු වූ අතර රජුට සහය පිණිස ප්‍රධාන රාජකීය නිළධාරී මඬුල්ලක් සිට ඇත. රාජ්‍ය පාලනය විෂයෙහි මෙම පිරිසගේ දායකත්වය සුළු පටු නොවේ. ඒ අතරින් ද ආරක්ෂක සංවිධානයන් භාරව කටයුතු කරන ලද සේනාපතිවරයා සතු කාර්යභාරය පොළොන්නරු අවධිය ඇසුරින් මෙහිදී විමර්ශනයට ලක් කෙරේ. රටක ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් වර්තමානය සකසා ගැනීමටත්, අනාගතය වඩාත් යහපත් අයුරින් සැලසුම් කර ගැනීමටත් හැකියාව පවතී. ඒ අනුව පොළොන්නරු අවධියේ සේනාපතිවරුන්ගේ කාර්යභාරයන් අධ්‍යයනයෙන් වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන වාතාවරණයන්, ආරක්ෂක සංවිධානයන් හා ඒවායේ ප්‍රධානීන් සම්බන්ධ කටයුතු පිළිබඳවත් අවබෝධයක් ලැබීමට වැදගත් වනු ඇත.

මෙහි දී පොළොන්නරු අවධියේ සේනාපතිවරුන්ගේ බලය වර්ධනය වී රජුන් සමඟ දේශපාලනික ගැටුම් ඇති වීම දක්වා පරිවර්තනය වූ ආකාරය හඳුනාගැනීමත්, මොවුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් පොළොන්නරු අවධියේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික යනාදී ක්ෂේත්‍රයන්ට ඇති වූ බලපෑම කවරේද යන්න විමසීමත් අරමුණු විය.

මෙම අරමුණු ඉටු කර ගැනීම උදෙසා සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක යන මූලාශ්‍රයෝ සන්සන්දනාත්මකව විග්‍රහ කරමින් ද පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා අන්තර්ජාල භාවිතය යන ක්‍රමවේදයන් ඔස්සේ ද තොරතුරු ඒකරාශී කොට විශ්ලේෂණාත්මකව විග්‍රහ කරමින් අධ්‍යයනය කරන ලදි. එමඟින් අනාවරණය වූයේ අනුරාධපුර අවධියේ දේශපාලන අවශ්‍යතාවන් මත සේනාපති තනතුර ආරම්භ වූ බවත්, පසුව පොළොන්නරු අවධියේ විවිධ පාලකයන්ගේ කාලයන්හි ඇති වූ දේශපාලන වාතාවරණයන් ඔස්සේ විශාල බලයක්, කීර්තියක් සේනාපතිවරුන්ට හිමි වීමත් සමඟ ඔවුන් එම බලය උපයෝගී කොට ගෙන පසුකාලීනව රජුන් තනන්නන් බවට පත් වූ බවත් ය. එමඟින් නිගමනය කළ හැක්කේ රජවරුන් විසින්ම පත් කර ගත් උසස් රාජකීය නිළ තනතුරක් වූ සේනාපති තනතුර දැරූවන් විසින් දේශපාලන ක්ෂේත්‍රය හැසිරවීමට යාමෙන් අභිමානවත් රජරට ශිෂ්ටාචාරය දේශපාලනික වශයෙන් දුර්වල වී පරිහානියට පත් වූ බවයි.

***ප්‍රමුඛ පදඃ*** *ආරක්ෂක සංවිධාන, දේශපාලන ක්ෂේත්‍රය, පොළොන්නරු යුගය, සේනාපතිවරයා*

---

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, chandimajanaki214@gmail.com**

# මධ්‍යගත පාලන තන්ත්‍රයට එරෙහිව නැගීසිටි ප්‍රාදේශීය පාලකයන් පිළිබඳ අධ්‍යයනයක්

**ආර්. එම්. එම්. එස්. රත්නායක**[1]

පුරාණ ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය මධ්‍යගතව මෙන්ම පළාත් හා ප්‍රාදේශීය වශයෙන් බලය විමධ්‍යගතව ද සංවිධානය වී පැවතුණි. රජුගේ සෘජු අධීක්ෂණය යොමු වූයේ අගනුවර කෙරෙහිය. අගනුවරින් දුර බැහැර ප්‍රත්‍යන්ත ප්‍රදේශ පාලනය කරනු ලැබුවේ ප්‍රාදේශීය නිලධාරීන් විසිනි. ඔවුන් රජු විසින් ලබා දෙන නියෝග හා අණපනත් එම ප්‍රදේශවල ක්‍රියාත්මක කළ යුතු විය. මෙම ප්‍රාදේශීය පාලකයින් මධ්‍යම රජයට එරෙහිව එනම් රජුට එරෙහිව නැඟී සිට අවස්ථා ද තිබේ. රජුගේ පාලනයේ දුර්වලතා, බල ලෝභීත්වය ආදිය නිසා මොවුන් කැරලි ගැසීම, ස්වාධීන වීමට උත්සාහ දැරීම ආදී ක්‍රියාමාර්ගවලට පෙළඹී තිබේ. එනිසා පර්යේෂණයේ අරමුණු අතරින් ප්‍රධාන වනුයේ ප්‍රාදේශීය පාලකයන් රජවරුන් එරෙහිව නැඟී සිටි ආකාරය හා ඒ සඳහා පාදක වූ හේතු කාරණා හඳුනා ගැනීමයි.

මේ සඳහා භාවිත කළ ක්‍රමවේදය වූයේ සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයයි. ප්‍රාථමික හා ද්විතීයික සිංහල මූලාශ්‍රය මෙන්ම ඉංග්‍රීසි මූලාශ්‍රය ද මෙම පර්යේෂණයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීම සඳහා භාවිත කරන ලදි. අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු, නිරිතදිග රාජධානි සමයන්හි මෙන්ම මහනුවර රාජධානියේ සමයේ සිටි රජවරුන්ට එරෙහිව ද ප්‍රාදේශීය පාලකයන් නැඟී සිට තිබේ. වළගම්බා රජතුමාට එරෙහිව තිස්ස බ්‍රාහ්මණයාත්, පළවන විජයබාහු රජුට එරෙහිව බුත්තල දී ඇති වූ කැරැල්ලත් ආදිය අනුරාධපුර පොළොන්නරු යුගයන්හි ප්‍රාදේශීය පාලකයන්ගේ නැඟී සිටීම් ලෙස පෙන්වා දිය හැකිය. හතරවන පරාක්‍රමබාහු රජු දවස බෝදා මාපණන් දැ කැරලි ගැසීම, හයවන පරාක්‍රමබාහු රජුට එරෙහිව උඩරට ජෝතිය සිටුවරයා ස්වෛරීව නැඟී සිටීම ආදී තවත් බොහෝ ප්‍රාදේශීය පාලකයන් සිදු කළ නැඟීසිටීම් නිරිත දිග රාජධානි සමයන්ට අදාළව හඳුනාගත හැකිය. උඩරට රාජධානියේ රජවරුන්ට පවා ප්‍රාදේශීය පාලකයන්ගේ තර්ජන හා ගර්ජනවලට මුහුණ දීමට සිදුවිය. 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා බ්‍රිතාන්‍යයන් අල්ලා ගනු ලබන්නේ ද ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය පාලකයන්ගේ එදිරිවාදිකම් නිසාවෙනි.

ප්‍රාදේශීය පාලකයන්ගේ නැඟී සිටීම් නිසා ඇති වූ ප්‍රතිඵල කිසිසේත්ම සතුටුදායක නොවීය. දේශපාලන අස්ථාවරත්වය, රටේ සම්පත් විනාශ වීම, ආක්‍රමණිකයින්ට අත වැනීම ඒ ප්‍රතිඵල අතර වේ. මෙම ව්‍යාකූල දේශපානික තත්ත්වයන්ගේ අවසාන ප්‍රතිඵලය වූයේ රට ජාතිය හා බුද්ධ ශාසනය විනාශ වීමයි.

***ප්‍රමුඛ පද:*** *ප්‍රාදේශීය පාලනය, අනුරාධපුර යුගය, කැරලි, පාලකයින්*

[1] **ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, vurdsjp@gmail.com**

# ළමා අයිතිවාසිකම් සඳහා වූ ප්‍රඥප්තීන් අරබයා රාජ්‍ය යන්ත්‍රණයේ භූමිකාව: ඇඹිලිපිටිය පරිවාස බල ප්‍රදේශය ආශ්‍රිත ප්‍රත්‍යෙයික අධ්‍යයනයක්

**බී. එච්. එම්. බුලත්සිංහල**[1]

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ළමා අයිතීන් ආරක්ෂා කිරීම උදෙසා ළමා ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලද අතර එයට ගරු කරමින් ශ්‍රී ලංකාව ද අත්සන් තබා අත. ශ්‍රී ලංකාවේ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යන්ත්‍රණය මඟින් විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබියදීත් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මඟින් අපේක්ෂිත ළමා සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීම හා විධිමත් ලෙස පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත්තේ ඇයි ද යන්න පර්යේෂණ ගැටලුව ලෙස තෝරාගත් අතර මෙය නූතන සමාජය මුහුණ දී ඇති විශාල ගැටලුවක් වන අතර මෙය ඇඹිලිපිටිය පරිවාස බල ප්‍රදේශයට ද පොදු තතත්වයකි. ඒ අනුව ළමා අයිතිවාසිකම් සඳහා වූ ප්‍රඥප්තීන් අරබයා රාජ්‍ය යන්ත්‍රණයේ භූමිකාව පිළිබඳ සිදුකරන ලද මෙම අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ වූයේ එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය යන්ත්‍රණය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් ළමා අයිතීන් ප්‍රවර්ධනය කිරීමට හා විධිමත් ලෙස පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත්තේ ඇයි ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම වන අතර ළමා ආරක්ෂක ප්‍රතිපත්තියේ ස්වභාවය, ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන රාජය යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය හා ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය හා ක්‍රියාවට නැංවීම අතර පවත්නා සබඳතාවයේ ස්වරූපය හඳුනා ගැනීම අධ්‍යයනයේ ද්විතීයික අරමුණු විය. මෙම අරමුණු උදෙසා පාසල තුළදීත්, ගෘහය තුළදීත්, ළමා නිවාස තුළදීත් ළමා අයිතීන් බිඳී යන ආකාරය හඳුනා ගැනීමට ඇඹිලිපිටිය පරිවාස බල ප්‍රදේශයට අයත් පාසලක සිසුන් 50 සඳහා ප්‍රශ්නාවලියක් ද ළමා නිවාසගතකරන ලද ළමයින් 50 දෙනෙකු සහ පරිවාසය, පොලිස් ළමා හා කාන්තා කාර්යංශයේ නිලධාරීන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකඡා තුළින් ද ද්විතීයක මූලාශ්‍රයවන පොත්පත්, සඟරා, අනත්ර්ජාලය හරහා තොරතුරු රැස් කරගත් අතර එහිදී එළඹෙන ලද නිගමනය වූයේ ළමා අයිතීන් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය යන්ත්‍රණය හරහා ගෙන ඇති ක්‍රියාමාර්ග ආශ්‍රිත සමහර ගැටලු නිසා ළමා අයිතීන් ආරක්ෂා කිරීම දුෂ්කර වී ඇති බවයි. ඒ අනුව පවත්නා නීති පද්ධතිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන මානව, භෞතික සම්පත් වර්ධනය කිරීම, දිළිඳුකම අවම කිරීම, අනිවාර්ය අධ්‍යාපනය ලබා දීමේ සීමාව 18 දක්වා වර්ධනය කිරීම, ආදී ක්‍රියාමාර්ග ගැනීම තුළින් ළමා ප්‍රඥප්තීන් තුළින් අපේක්ෂිත ළමා සුරක්ෂිතභාවය ළඟා කර ගත හැකි වනු ඇති බව මෙම අධ්‍යයනයේ නිගමනයයි.

***ප්‍රමුඛ පද:*** *ප්‍රතිපත්ති, ළමා අයිතිවාසිකම්, රාජ්‍ය යන්ත්‍රණය*

---

[1] **දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය,**

# ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි පාරිභෝගික නැඹුරුතාව සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීම (කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්)

**ආර්. එස්. එස්. එච්. එම්. එල්. කපිලානි**[1]

විවිධ සාධක හේතුවෙන් මෑත කාලීනව පුද්ගලයින් ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි දැඩි ලෙස නැඹුරුවීමක් හඳුනාගත හැකිය. මෙසේ ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි යොමුවීම නිසා මතුවන ගැටලු රැසකි. පුද්ගලයින්ගේ කායික සෞඛ්‍ය පිරිහීම, ආර්ථික පරිහානිය වැනි සමාජ ප්‍රශ්න මේ තුළින් ජනිත වේ. මෙහිදී ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙහි  මහරගම සහ සීතාවක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් විජේරාම, නාවින්න, කිරිවත්දල උතුර හා පුවක්පිටිය දකුණ යන ග්‍රාම නිළධාරී වසම් තෝරා ගන්නා ලදී. ජනගහනයට සමානුපාතිකව සරල සසම්භාවීව කුටුම්භ 172කින් නියැඳියක් තෝරා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගන්නා ලදී. මෙලෙස රැස්කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය සඳහා ඒකවිචල, ද්විවිචල සහ බහුවිචල විශ්ලේෂණ භාවිත කරන ලදී. විස්තරාත්මක විශ්ලේෂණය මඟින් පුද්ගලයින් බහුලව පරිභෝජනය කෙරහි යොමුවන ක්ෂණික ආහාර වර්ගය ෂෝට්ස් බව හඳුනාගන්නා ලදි. එමෙන්ම මෙම ආහාර පරිභෝජනය කෙරෙහි බහුලව යොමුවන වයස් කාණ්ඩය අවුː19-30 වයස් කාණ්ඩයේ තරුණ පිරිස වන බවද හඳුනාගන්නා ලදි. එමෙන්ම දත්ත විශ්ලේෂණයෙන් නාගරික හා ග්‍රාමීය බව අනුව ක්ෂණික ආහාර පරිභෝජන මට්ටමෙහි වෙනසක් නොපවතින බව හඳුනාගත හැකිවිය. එමෙන්ම පුද්ගලයින් ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි යොමුවීමට ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස, විවාහක තත්ත්වය, ජනවාර්ගිකත්වය, අධ්‍යාපන මට්ටම සහ වෘත්තිය මට්ටම යන විචල්‍යයන් බලපා ඇති බවද හඳුනාගන්නා ලදි. එමෙන්ම පුද්ගලයින් ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි යොමුවීමට බලපානු ලබන සාධක ආර්ථික සාධක, මිල පිළිබඳ සාධක, දෛනික පුරුදු, පරිසර සාධක සහ ආහාරවල ස්වභාවය ලෙස පොදු සාධක පහක් හඳුනාගත හැකිවිය. එම එක් එක් සාධකයන්ට අදාළව දර්ශක ගොඩනගන ලද අතර එම දර්ශක හා පාරිභෝගිකයින් ක්ෂණික ආහාර පරිභෝජනය සඳහා සතියකට දරන වියදම අතර ප්‍රතිපායන ආකෘති ගොඩනැඟීමෙන් මිල පිළිබඳ සාධක, දෛනික පුරුදු සහ පරිසර සාධක ක්ෂණික ආහාර පරිභෝජන මට්ටම තීරණයවීම කෙරෙහි බලපාන බව හඳුනාගත හැකිවිය. මෙලෙස ශ්‍රී ලාංකික පුද්ගලයින් ක්ෂණික ආහාර පරිභෝජනය කෙරෙහි යොමුවීමෙන් ඈත් කිරීම සඳහා පවුලේ ගෘහණිය, දෙමාපියන් සහ පාසලේ ගුරුභවතුන් ක්‍රියාකළ යුතු අතර ක්ෂණික ආහාර නිෂ්පාදකයින් රසායනික ද්‍රව්‍යයන්ගෙන් තොරව පිරිසුදු ආහාර නිෂ්පාදනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමුකළ යුතුය. මෙවැනි වැදගත් යෝජනා රැසක් මෙම අධ්‍යයනය මඟින් ඉදිරිපත් කර ඇත.

***ප්‍රමුඛ පදඃ*** *ක්ෂණික ආහාර, පරිභෝජනය, ආර්ථික පරිහානිය*

[1] **සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය, lasantakapilani@gmail.com**

# දක්ෂිණ සංචාරක වෙරළ තීරයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

ඕ. එච්. ඒ. එම්. විජේරත්න[1]

සංචාරක කර්මාන්තය වත්මන් ලොව සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයේ වැදගත් අංගයක් බවට වත්මනේ පත් වී ඇත්තේ සෑම සංචාරකයින් 05කින් 01 රැකියා අවස්ථාවක් බිහිකරන බැවිනි. මෙය සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි වශයෙන් බිහිවීමට ද හේතු වී ඇත. ශ්‍රී ලංකාව පිළිබඳව විමසීමේදී දකුණු වෙරළ තීරයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ආකර්ෂණීය බව හේතුවෙන් සංචාරක කර්මාන්තය ඉතා සාර්ථකව සිදු කෙරෙන අතර ඒ ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තයන් වන ලී කැටයම්, ස්වර්ණාභරණ, බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි, බීරලු රේන්ද නිෂ්පාදන කර්මාන්ත වැඩි වශයෙන් ව්‍යාප්ත වී තිබේ. මෙකී කර්මාන්තයන්ගේ සංවර්ධනයට බලපා ඇති සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

අධ්‍යයනය සඳහා ප්‍රදේශයේ පවතින කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත 34ක්, සංචාරක නිෂ්පාදන අළෙවි සැල් 17ක් සහ සංචාරකයින් 10ක් නියදිය වශයෙන් තෝරා ගන්නා ලදී. අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය ඔස්සේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත වර්ග, ඒවා සංවර්ධනයට බලපා ඇති සාධක, පවතින ගැටලු මොනවාද යනාදී තොරතුරු සපයා ගත්හ. මේ අනුව සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනයට කර්මාන්ත අයිතියේ ස්වභාවය, වෙළෙඳපොළ තත්ත්වය, සේවක සංඛ්‍යාව, වෙළෙඳපොළට නිෂ්පාදන සපයන ආකාරය, කර්මාන්ත හිමියන්ගේ අධ්‍යාපන මට්ටම සහ නව තාක්ෂණය භාවිත කිරීමේ හැකියාව යනාදී සාධක කිනම් බලපෑමක් කර ඇත්දැයි අධ්‍යයනය කරන ලදී. මෙමගින් එළඹීමට හැකි වූ නිගමනයන් වූයේ කර්මාන්ත හිමියන්ගේ ඉහළ අධ්‍යාපනය, නව තාක්ෂණය භාවිතය, වෙළෙඳපොළ තත්ත්වය යහපත් වීම, වැඩි සේවක සංඛ්‍යාව යනාදී සාධක යහපත්ව පැවති කර්මාන්ත 10ක පමණ සාමාන්‍ය මාසික ආදායම රු. 60,000 පමණ වන නමුදු ඉහත සාධකයන් මනාව නොමැති කර්මාන්තයන්ගේ සාමාන්‍ය මාසික ආදායම රු. 35000ක් පමණ විය. අමුද්‍රව්‍ය ලබාගන්නා ආකාරය සහ කර්මාන්ත හිමිකාරීත්වය (ස්ත්‍රී/පුරුෂ බව) යන සාධක කර්මාන්ත සංවර්ධනය අඩු හෝ වැඩි වීම කෙරෙහි වැඩි බලපෑමක් සිදුකර නොමැති බව වටහා ගත හැකිවිය. ඒ අනුව අධ්‍යයනයට යොදාගත් කර්මාන්ත අතුරින් ලී කැටයම්, ස්වර්ණාභරණ, බීරලුරේන්ද සහ අත්යන්ත්‍ර රෙදිපිළි ආදී කර්මාන්ත වැඩි දියුණුවක් ලබා තිබුණ ද ශ්‍රම හිඟබව යනාදී සාධක මත බතික් වැනි කර්මාන්ත අඩු දියුණු මට්ටමක පවතින බව ද නිගමනය කළ හැකිවිය.

***ප්‍රමුඛ පදඃ*** *සංචාරක කර්මාන්තය, දක්ෂිණ සංචාරක වෙරළ තීරය, කුඩා සහ මධ්‍ය පරිමාණ, සංවර්ධනය*

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, **madushiwijerathna9275@gmail.com**

# ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ දායකත්වය

ආර්. ජී. සචිත්‍රා ප්‍රභාෂිනී බණ්ඩාර[1] සහ ආර්. එම්. කේ. රත්නායක[2]

ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රමුඛ අරමුණ වන්නේ ප්‍රදේශ අතර පවත්නා සංවර්ධන විෂමතාව අවම කරමින් සමබර සංවර්ධනයක් ඇති කිරීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය අරභයා මේ දක්වා අනුගමනය කර ඇති ක්‍රමෝපායන් අතුරෙන් ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ප්‍රධාන තැනක් ගනී. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ගණනාවක් හඳුනාගත හැකිය. ඒ අතුරින් අතරමැදි ග්‍රහණයෙන් ගොවීන් මුදවා, ගොවීන් ශක්තිමත් කිරීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනයට ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් ලෙස ග්‍රාමීය හා ප්‍රාදේශීය නාගරික ප්‍රදේශ කේන්ද්‍රකොට ගනිමින් ස්ථාපිත කරන ලද ආර්ථික මධ්‍යස්ථාන හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාව තුළ එලෙස පිහිටුවනු ලැබූ ආර්ථික මධ්‍යස්ථාන 12 අතුරින් ප්‍රථම සහ කාර්යක්ෂම සේවා මධ්‍යස්ථානය වන දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ස්ථාපිත වෙළඳ මධ්‍යස්ථාන තොග වෙළඳාමේ නියුතු වෙළඳුන් සඳහා ස්ථාපිත කර එමඟින් සැලසුම් සහගතවුත්, ක්‍රමාණුකූලවුත්, තොග වෙළඳාමක් තුළින් ගනුදෙනු කරන ප්‍රජාවගේ ආදායම ඉහළ නංවාලීම සහ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා දීම සිදු කරයි. මේ හරහා 5000 කට අධික ඍජු රැකියා මෙන්ම 15,000 කට අධික පිරිසකට වක්‍ර රැකියා සපයමින් දඹුල්ල සේවා මධ්‍යස්ථානය හා පර්යන්තය මුළු ශ්‍රී ලංකාවේම සංවර්ධනය සඳහා ඍජු සහ වක්‍ර අන්දමින් සක්‍රීයව දායක වී ඇත. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට ගනිමින් සේවා මධ්‍යස්ථානයකින් ඒ ආශ්‍රිත පර්යන්තයේත් සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධන දෘෂ්ටි කෝණයෙන් විමසීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ලෝකයේ ආර්ථික මධ්‍යස්ථාන සංකල්පය සංවර්ධනය, ඒ ආශ්‍රිත ගැටලු හා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ලබාගත හැකි ද්විතීයික මූලාශ්‍රය මේ සඳහා දායක කරගනු ලැබිණ. ඊට අමතරව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය, ඒ නිසාම ස්ථාපිත වූ සේවාවන්ගේ කාලීන වර්ධනය හා ආසන්න පර්යන්ත ප්‍රාදේශ සංවර්ධනයට ඉන් ලැබෙන පිටිවහල අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික දත්ත රැස් කරන ලදි. මෙලෙස පිහිටුවනු ලැබූ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය නිසාවෙන් පර්යන්තයේ පදිංචිකරුවන් සඳහා කෘෂි නොවන රැකියා අවස්ථා ඇති වීම, යටිතල පහසුකම් සංවර්ධනය වීම, විවිධ සේවාවන්ගේ ඉහළ අංශයන් කේන්ද්‍රගත වීම, ස්වාභාවික සම්පත් සහ සංස්කෘතික කාර්යයන් සඳහා ජනප්‍රියත්වයක් ඇතිවීම යනාදිය ඍජු වාසි ප්‍රදේශයේ සංවර්ධනයට ලබාගත හැකි වූ අතර වක්‍රව ලැබෙන ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක්ද ආර්ථික මධ්‍යස්ථානය නිසාම නිර්මාණය වී ඇත. මෙලෙස ඍජු හා වක්‍ර බලපෑම් ප්‍රාදේශීය සංවර්ධයට ඉතා වැදගත් වී ඇත.

***ප්‍රමුඛ පදඃ*** *ආර්ථික මධ්‍යස්ථානය, ප්‍රදේශීය සංවර්ධනය, කෘෂි නොවන සේවා, තොග වෙළඳාම*

[1] **භූගෝල විද්‍යාව අධ්‍යයනාංශය, sachithraprabhashinie@gmail.com**

[2] **මහාචාර්ය, භූගෝල විද්‍යාව අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

# ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ මතුවන අක්‍රමිකතා සහ රාජ්‍ය පරිපාලන කටයුතු අතර ඇති සම්බන්ධතා

**පී. කේ. ඩී. එස්. ඩී. විජේගුණවර්ධන**[1]

රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාවයේ පසුබෑම පිළිබිඹු කරමින් මෙම පර්යේෂණයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අනුබද්ධිත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වයේ ගැටලු සහගත දිශාවන් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ආපදා කළමනාකරණය සහ සහන සේවා සඳහා ශ්‍රම විභජනය මත පදනම්ව ආයතනගත ව්‍යූහයක් යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් ක්‍රියාත්මක වුවද කාර්යක්ෂම සහ වගවීමෙන් යුතු සහන සේවාවක් විපතට පත් ජනතාවට සහන සේවා ලබාදීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන්නේ ඇයි යන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙරට ආපදා කළමනාකරණයට කාර්ය ක්ෂේත්‍රයන් වර්ගීකරණය යටතේ ස්ථාපිත ආයතනික ව්‍යූහයේ සංකීර්ණභාවය වැඩිවන තරමට උපරිපතන ඇතිවීම හරහා මෙරට ජාතික ආපදා කළමනාකරණයේ කාර්යක්ෂමතාව පහත වැටී පීඩාවට පත්වූවන්ට සහන සැලසීම ප්‍රමාදවීම නම් ගැටලුව අධ්‍යයනයට ලක් කර ඇත. පර්යේෂණය සඳහා 2016 මැයි මස ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය සිද්ධි අධ්‍යයනය ලෙසට ගෙන එම ආපදාවට මුහුණ පෑ කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ වෙලේහංදිය ග්‍රාම සේවා වසමේ නිවාස 50ක් පමණ නියැදිය වශයෙන් උපයුක්ත කරගෙන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ ඇසුරින් ලබාගත් දත්ත හා තොරතුරු මෙන්ම ආපදා කළමනාකරණය සම්බන්ධව පළවී ඇති සාහිත්‍ය පරිශීලනයෙන් ලබාගත් දැනුම පාදක කරගෙන ඇත. මේ අනුව කඩුවෙල වෙලේහන්දිය ප්‍රදේශයේ වාර්ෂිකව නිරිතදිග මෝසම සක්‍රීය වීමෙන් ඇතිවන වර්ෂාපතනයත් සමග ඇතිවන සුළු ගංවතුර තත්ත්වය අක්‍රමවත් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ආපදා තත්ත්වයක් බවට පත්වී තිබෙන බවට පැහැදිලි විය. පසුගිය රජය විසින් මේ ප්‍රදේශය හරහා අධිවේගී මාර්ගය ඉදි කිරීම සහ මේ ප්‍රදේශය තුළ කාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් වැනි සංවර්ධන ව්‍යාපෘති පිහිටුවීම, කැලණි ගඟ ආශ්‍රිතව සිදු කෙරෙන මහාපරිමාණ වැලි ගොඩදැමීම, කැලණි ගංගා මිටියාවත ආශ්‍රිතව පිහිටි අනවසර ඉදි කිරීම් සහ වගුරු බිම් ගොඩකිරීම වැනි මානව ක්‍රියාකාරකම් මේ ප්‍රදේශය ගංවතුර ආපදා අවදානම් කලාපයක් බවට පත් කර ඇත. මේවාට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී රජයේ අකාර්යක්ෂමතාව පිළිබිඹු වන අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවිධිමත් ආයතනික ව්‍යූහය මේ ක්‍රියාවලිය තවත් සංකීර්ණ කර ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය තුළ ඇතිවී තිබෙන මෙම ගැටලු සහගතභාවය සහ ආපදා ඇතිවීමෙන් සිදුවන හානිය අවම කර ගැනීමට විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණය මගින් සිදුකර ඇත.

***ප්‍රමුඛ පද:*** *ආපදා කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, කාර්යක්ෂමතාව, සම්බන්ධීකරණය*

[1] **දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය,**

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත කිරීමේදී සලකා බලන සාධක පිළිබඳ අධ්‍යයනක්: ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරිනි

**පී. ඩී. සමරසිංහ**[1]

මිනිසුන්ගේ අසීමිත වූ මානව අවශ්‍යතා තෘප්ත කරමින් සමාජය තුළ ආර්ථික මෙහෙවර ඉටු කරන්නේ ලාභ ඉපැයීම ප්‍රමුඛ අරමුණ කරගත් කර්මාන්ත අංශය මගිනි. කාර්මික විප්ලවයේ ආරම්භයත් සමඟ ආර්ථික ව්‍යුහය තුළ කර්මාන්ත අංශයේ වැදගත්කම ප්‍රචලිත වන්නට විය. එබැවින් කර්මාන්ත ස්ථානගත වීම ලොව පුරා ප්‍රකට තේමාවක් බවට පත්ව ඇති අතර ග්‍රාමීය ප්‍රදේශවල කර්මාන්ත ස්ථාපිත කිරීම ග්‍රාමීය සංවර්ධනය සඳහා වැදගත් වේ. මෙම පර්යේෂණයේ දී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත වීමේදී බලපාන විචල්‍යයන් ලෙස ශ්‍රම සුලභතාව, අමුද්‍රව්‍ය සපයාගැනීමේ පහසුව, භූමි හිමිකාරිත්වය, ප්‍රාග්ධන භාවිතය, වැටුප්, වෙළෙඳපොළ හා ප්‍රවාහන පහසුකම් යන සාධක භාවිත විය. පර්යේෂණයේ අරමුණු වූයේ ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත කිරීමේ දී සලකා බලන සාධක අධ්‍යයනය කිරීම, එම සාධකයන්හි තීව්‍ර බලපෑමක් හා දුර්වල බලපෑමක් සහිත සාධක හඳුනාගැනීම හා කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ග්‍රාමීය ව්‍යවසායකයන් මුහුණපාන ප්‍රධාන ගැටලු අධ්‍යයනය කිරීම යි. ප්‍රාථමික හා ද්විතීයක යන දත්ත මූලාශ්‍රයන් භාවිත කරන ලදි. අධ්‍යයනය සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ලියාපදිංචි කුඩා කර්මාන්ත 60ක් සරල සසම්භාවී ලෙස තෝරාගැනුණි. මෙහිදී කුඩා කර්මාන්තකරුවන්ට ලබාදුන් ප්‍රශ්නාවලියක් ඇසුරෙන් රැස් කරගත් දත්ත විශ්ලේෂණය සිදු විය. මෙහි ප්‍රධාන සොයාගැනීම් වන්නේ කාරක ප්‍රාග්ධනය කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ප්‍රබල බලපෑමක් නොමැති සාධකයක් වන අතර කර්මාන්ත අතර අවම තරගකාරිත්වයක් පැවතීම හේතුවෙන් හුදෙකලා ලෙස කර්මාන්ත ස්ථානගත වන බවයි. ග්‍රාමීය ප්‍රදේශවල පවතින ඉහළ ශ්‍රම සුලභතාව හේතුවෙන් අඩු පිරිවැයට ශ්‍රමය ලබාගැනීමට හැකි වීම පෙළඹුම් සාධකයක් වේ. බදුකුලී පිරිවැය අවම කරගැනීමට තමාට අයත් ඉඩමක් භාවිත කිරීම බහුල ව සිදු වේ. මෙම සොයාගැනීම් අනුව නිගමනය වන්නේ වර්ධනය වන පාදක ව්‍යුහයක් පැවතීම, ශ්‍රමය හා අමුද්‍රව්‍ය සුලභතාව, වැටුප් හා භූමි හිමිකාරිත්වය කාර්මික සංවර්ධනයකට ඉතා තීව්‍ර තීරකයන් වන අතර ඒ සඳහා අවශ්‍ය පසුබිමක් නිර්මාණය වීමෙන් උපයෝජනය නොකරන ලද ප්‍රාදේශීය සම්පත් භාවිතය හරහා ව්‍යවසායකත්ව අවස්ථා නිර්මාණය වීමට එම සාධක හේතු වේ. එමෙන් ම ග්‍රාමීය ප්‍රදේශවල තවදුරටත් කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා විභවතාවක් පවතින නමුත් කුඩා ව්‍යවසායකයන් මුහුණපාන සංරෝධකයන් පැවතීම බාධාකාරී වන අතර කර්මාන්ත ස්ථාපිත කිරීම ආකර්ෂණය සඳහා විවිධ ආයතනික සහයෝගයන් ලබා දෙමින් ග්‍රාමීය අංශයේ ශ්‍රම සූචක කර්මාන්ත ස්ථාපිත කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *ස්ථානගත වීමේ සාධක, නිෂ්පාදන කර්මාන්ත, ප්‍රාදේශීය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත*

---

**[1] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, pdsamarasingha.pds@gmail.com**

# ඉලෙක්ට්‍රොනික බැංකුකරණය කෙරෙහි බැංකු පාරිභෝගිකයින් යොමුවීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ලංකා බැංකු පාරිභෝගිකයින් ඇසුරින්)

**ජේ. එම්. එස්. එස්. ජයසිංහ**[1]

පසුගිය දශක කිහිපයක කාල පරාසය තුළ තොරතුරු තාක්ෂණයේ වේගවත් වර්ධනයත් සමග ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයෙහි ඇති වූ නව ප්‍රවණතාවක් වන්නේ ඉලෙක්ට්‍රොනික බැංකුකරණය (Electronic Banking) යි. අන්තර්ජාල බැංකුකරණය නමින් ද හඳුන්වන මෙම ක්‍රියාවලිය හරහා බැංකු ගනුදෙනුකරුවන්ට වඩා නම්‍යශීලී, සමීප වූ සේවාවක් ලබාදීමට හැකියාව ලැබී තිබේ. තොරතුරු තාක්ෂණික හා ජංගම උපාංග හරහා විවිධ මෘදුකාංග යොදා ගනිමින් බැංකු ගනුදෙනුකරුවන් හට සිය මූල්‍ය කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීමට ඉඩ සලසන ලබන ක්‍රමවේදය ඉලෙක්ට්‍රොනික බැංකුකරණය ලෙස හැඳින්විය හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ඉලෙක්ට්‍රොනික බැංකුකරණය සඳහා බැංකු ගනුදෙනුකරුවන් නැඹුරුවීම කෙරෙහි බලපානු ලබන සාධක හඳුනා ගැනීමයි. කොළඹ දිස්ත්‍රික්කයේ ලංකා බැංකු පාරිභෝගිකයන් 100 ක් පහසු නියැඳිම මඟින් නියැදිය වශයෙන් තෝරාගැනිණ. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කළ අතර ද්විතීයික දත්ත සඳහා බැංකු හා මූල්‍ය ආයතනවල වාර්තා, පුවත්පත් හා සඟරා, අන්තර්ජාලය මඟින් පළවූ ලිපි ආදිය භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීමේ දී විස්තරාත්මක ක්‍රමය සහ ප්‍රමාණාත්මක ක්‍රමය ලෙස ප්‍රධාන වශයෙන් ක්‍රමවේද දෙකක් භාවිත කෙරිණ. ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රමයේ දී සංඛ්‍යාන විද්‍යාත්මක ඇස්තමේන්තු කිරීම සඳහා ලඝු ප්‍රතිපායන ආකෘතියක් ඇස්තමේන්තු කෙරිණ. එම ප්‍රතිපායන ආකෘතියට අනුව බැංකු පාරිභෝගිකයන් ඉලෙක්ට්‍රොනික බැංකුකරණය දෙසට යොමුවීමට බලපානු ලබන ප්‍රධාන සාධක අටක්, පුම්තිරි බව, වයස, ජීවත්වන ප්‍රදේශය, මාසික ආදායම් මට්ටම, ප්‍රතිචාරක අධ්‍යාපන මට්ටම, පරිගණක සාක්ෂරතාව, අන්තර්ජාල සාක්ෂරතාව සහ ඉලෙක්ට්‍රොනික බැංකුකරණය පිළිබඳ පාරිභෝගික ආකල්පය යනුවෙන් හඳුනාගනු ලැබී ය. මෙම නවීන සේවාව කෙරෙහි යොමුවීමට බොහෝ පාරිභෝගිකයන් අනවශ්‍ය බියක් දක්වන බව සමීක්ෂණය මගින් පැහැදිලි විය. විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික බැංකුකරණය යනු අධික වියදම් සහිත ඉතා සංකීර්ණ වූ තාක්ෂණික පහසුකමක් බව බොහෝ අයගේ අදහස වී තිබිණි. මේ නිසා ලංකා බැංකුව විසින් සපයනු ලබන ඉලෙක්ට්‍රොනික බැංකු සේවා පිළිබඳ දැනුවත් වුවද ඒ සඳහා යොමුවීමෙන් වැළැකී සිටියි. මෙම සේවාව ප්‍රචලිත කිරීමට හා එහි සංවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි. ඉලෙක්ට්‍රොනික බැංකුකරණ පහසුකම් විවිධාංගීකරණය කිරීම, ඒ පිළිබඳ ඇති වැරදි සමාජ ආකල්පය හා ප්‍රතිරූපය ඉවත් කිරීම සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රචාරක මාධ්‍ය හරහා සමාජගත කිරීම, රජයේ කාර්යභාරය හා අවධානය පුළුල් කිරීම එම යෝජනාවන් ය.

***ප්‍රමුඛ පද:*** *ඉලෙක්ට්‍රොනික බැංකුකරණය, වාණිජ බැංකු, නැඹුරුවීම*

[1] **ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, shehanijayasinghe91@gmail.com**

# ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා කාන්තාවන් ගේ දායකත්වය සහ ඒ කෙරෙහි බලපාන සාධක

**එම්. ඒ. එම්. ලක්ෂානී**[1]

ලෝකයේ බොහෝ රටවල මූල්‍ය අංශයේ වැදගත් සංරචකයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය හඳුනාගන්නා එමඟින් ආර්ථිකයට කරනු ලබන බලපෑම වැදගත් ලෙස සලකා තිබේ. ක්ෂුද්‍ර මූල්‍ය සඳහා දායකවන පාර්ශවයන් සලකා බැලීමේ දී ක්ෂුද්‍ර මූල්‍ය සඳහා කාන්තාවන් ගේ දායකත්වය සුවිශේෂී මට්ටමක පවතින බව හඳුනාගන්නා බැවින් ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා කාන්තාවන් ගේ දායකත්වය සහ ඒ කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම නිළධාරි වසම් 4 ක තෝරාගත් කාන්තාවන් 200 කින් යුත් නියැදිය ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය කරනු ලබයි. මෙහි දී ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මකව ද දත්ත රැස්කරගන්නා ලද අතර එම දත්ත භාවිතයෙන් කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීම කෙරෙහි වැඩි වශයෙන් බලපාන සාධක හඳුනාගැනීම සඳහා ප්‍රජා විද්‍යාත්මක, ආර්ථික විද්‍යාත්මක මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සම්බන්ධ ආකල්ප පිළිබඳ ව පරීක්ෂණ සිදු කර තිබේ. මෙහිදී දත්ත, විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රම, ආර්ථිකමිතික විශ්ලේෂණ ක්‍රම සහ ආකල්ප පරීක්ෂා කළ හැකි ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කර තිබේ. විස්තරාත්මක විශ්ලේෂණය මඟින් විචල්‍යයන් මූලික අරමුණ හා සමපාත වන ආකාරය සලකා බලන ලද අතර ආර්ථිකමිතික විශ්ලේෂණයේ දී මූලික සාධක වල වැදගත්කම හා බලපෑම පිළිබඳව අවධානයට ලක් කරන ලදී. ආර්ථිකමිතික විශ්ලේෂණය යටතේ logistic ප්‍රතිපායන විශලේෂණයක් යොදා ගත් අතර කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීම ට සාපේක්ෂව දායක නොවීමේ සම්භාවිතාව පරීක්ෂා කරන ලදි. හඳුනාගන්නා ලද විචල්‍යයන් කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීම කෙරෙහි බලපාන ආකාරය හා බලපෑමේ සම්භාවිතාව ද logistic ප්‍රතිපායන විශ්ලේෂණය යටතේ සලකා බලන ලද අතර ඒ අනුව විශ්ලේෂණයේ දී මූලික වශයෙන් වැදගත් වන සාධකවල බලපෑම හඳුනාගත හැකි විය. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීමේදී කාන්තාවන් ට වඩාත් බලපාන සාධක වශයෙන් ආදායම, අධ්‍යාපන මට්ටම, රැකියාව, පවුලේ සාමාජිකයන් ගණන, විවාහක අවිවාහක බව යන සාධක වැදගත් විය. එම සාධක කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීම කෙරෙහි වෙසෙසියාත්මක බලපෑමක් ඇති කරන බව හඳුනාගත හැකි විය. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීම කෙරෙහි කාන්තාවන් ගේ ආකල්ප බලපාන ආකාරය ආකල්ප පරීක්ෂාව මඟින් වටහා ගත හැකි විය. කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා දායක වීමට දක්වන නැඹුරුව කෙරෙහි බලපාන සාධකවල ප්‍රබලත්වය හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** *ක්ෂුද්‍ර මූල්‍ය ණය, කාන්තා දායකත්වය, දරිද්‍රතාව, ස්වයං රැකියා*

[1] **ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, manushimatharaarachchi@gmail.com**

# කර්මාන්ත ශාලාවක නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කර ගන්නා ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**කාරියවසම් නදීකා දිල්හානි**[1]

මිනිස් ශ්‍රමය හා උපකරණ භාවිතයෙන් නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කරන ආයතනයක් කර්මාන්ත ශාලාවක් ලෙස හඳුනාගත හැකිය. එවන් කර්මාන්තයක් ලෙස ඇඟලුම් කර්මාන්තය හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය වන ඇඟලුම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. කර්මාන්ත ශාලාවක සේවක අභිප්‍රේරණය මගින් නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කර ගන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් Vouge ආයතනයේ ශාඛාවක් වන ඉන්ටෙක් මෝඩ් ඇඟලුම් කර්මාන්තශාලාවේ සේවකයන් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. එහි මුළු සේවක සංඛ්‍යාව 1194 ක් වන අතර නියැදිය ලෙස 100 දෙනෙකු තෝරා ගැනිණ. ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස් කරන ලදී. සේවක අභිප්‍රේරණය මගින් නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කර ගත හැකිවන අතර එහි අතෘප්තිකර අංශයන් කෙරෙහි අවධානයට ලක් කරමින් නිෂ්පාදන ඵලදායිතාව සේවක අභිප්‍රේරණය මගින් සිදු කළහැකි බව අනාවරණය විය. එසේම සේවක දිරි දීමනා තව තවත් වර්ධනය කරමින් විශේෂ අවස්ථාවන්හිදි කරනු ලබන සංවිධානමය තත්වයන් ලබාදීම මගින් නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කර ගත හැකි බව යෝජනා කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ඇඟලුම්, සේවක අභිප්‍රේරණය, නිෂ්පාදන, ඵලදායිතාවය*

[1] සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, **nadeekadilhani151@gmail.com**

# නව ලිබරල් සමාජ දේශපාලන මතවාදයෙහි නව ප්‍රවණතා

**ඊ. එම්. ඩී. එච්. ඒකනායක**[1]

රාජ්‍ය පිළිබඳව ඉදිරිපත්වූ මතවාද අතරින් ලිබරල්වාදී දේශපාලන මතවාදය ඉතා වැදගත් වේ. ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන මතවාදයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එම මතවාදය පැවති ධනවාදී ආර්ථිකයන්ගේ ස්වරූපය අනුව විකාශනයට ලක්වීමයි. මේ අනුව 1970-1980 දශකය පුරා ඇමෙරිකාව ප්‍රමුඛ කරගනිමින් ලෝකය පුරා ව්‍යාප්ත වන ලද නවලිබරල්වාදය, ලිබරල්වාදයේ වැදගත් විකාශනාත්මක අවධියක් ලෙස පෙන්වා දිය හැක. නවලිබරල්වාදය හෙවත් නිදහස් වෙළඳපළ ක්‍රමය 1970-1980 දශකවල දී ලොව පුරා පිළිගැනීමට පාත්‍රවුවද වර්තමානය වන විට එම මතවාදය අර්බුදකාරී තත්වයකට මුහුණ දෙමින් පවතී. 1970-1980 දශක තුළ නව ලිබරල් මතවාදය ලොව පුරා පිළිගැනීමට පාත්‍රවුව ද වර්තමානයේ එම මතවාදය අභියෝගයට ලක්වන්නේ ඇයි? යන ගැටලුව මූලික කරගනිමින් ඉදිරිපත් කරන ලද මෙම පර්යේෂණය හරහා නවලිබරල්වාදයේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ වීය. මෙම පර්යේෂණය මගින් මූලිකව නවලිබරල්වාදය වර්තමානයේ අභියෝගයට ලක්වී ඇති ආකාරයත්, ඒ සම්බන්ධයෙන් බලපානු ලබන සාධක පිළිබඳවත් සොයා බැලීම සිදුකර ඇත.

මේ සඳහා මූලික වශයෙන් ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රිතව තොරතුරු රැස් කිරීම සිදුකළ අතර ඒ සඳහා සාහිත්‍ය විමර්ශන, සඟරා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය භාවිතය හරහා තොරතුරු හා දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන ලද්දේ වර්තමානය වනවිට නවලිබරල්වාදය පැහැදිලි ලෙසම අර්බුදයකට ලක් වී ඇති බවයි. මේ සදහා බලපාන ලද ප්‍රධාන හේතුවක් වූයේ 2008 දී ඇමෙරිකාව තුළ ඇති වූ මූල්‍ය අර්බුදයයි. මේ අර්බුදය සඳහා විසඳුම් වශයෙන් ජෝර්ජ් බුෂ් රජය විසින් මෙන්ම බැරැක් ඔබාමා රජය විසින් විවිධ විසඳුම් ඉදිරිපත් කර ඇති අතර බොහෝ ධනවාදී රටවල නායකයන් විසින් වොෂිංටන් සමුළුව, G-7 හා G-20 වැනි සමුළු පැවැත්වූ අතර ඊට අමතරව 2008 දී හදිසි ආර්ථික ස්ථාවර පනත මගින් ද 2008 බැංකු පනත මගින් ද මේ සම්බන්ධයෙන් විසඳුම් ඉදිරිපත් කරන ලදී. එහි අසාර්ථක භාවය හමුවේ නවලිබරල් ආර්ථික මතවාදය පැහැදිලි අර්බුදයකට ලක් වූ බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් නවලිබරල් දේශපාලන මතවාදය ද අර්බුදයට ලක් වූ බව පැහැදිලි වේ. කෙසේ නමුත් අවසාන වශයෙන් වර්තමානය වනවිට නවලිබරල්වාදය අර්බුදයකට ලක්වී ඇති බව මේ අනුව පැහැදිලි වේ.

***ප්‍රමුඛ පදඃ*** *ලිබරල්වාදය, නවලිබරල්වාදය, මූල්‍ය අර්බුදය, නිදහස් වෙළඳපල ක්‍රමය, විවෘත ආර්ථිකය*

[1] **දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, hansamaliekanayaka@gmail.com**

# වතු දෙමළ ආධිපත්‍ය සහ ලංකා කම්කරු කොංග්‍රසයේ භූමිකාව

**එම්. ටී. ජී. චතුරිකා දුලංජලී වීරසිංහ**[1]

ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට විශාල දායකත්වයක් දක්වන්නා වූ ශ්‍රම බලකායක් ලෙස වතු කම්කරුවන් හඳුනා ගත හැකිය. ඒ අනුව වතු දෙමළ ආධිපත්‍යය සහ ලංකා කම්කරු කොංග්‍රසය යන්න මාතෘකාව යටතේ ඉන්දීය වතු දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා ගොඩ නැංවූ ලංකා කම්කරු කොංග්‍රසය මෑත කාලීනව විභේදනයට ලක් වීමක් දක්නට ලැබෙන්නේ ඇයි ද යන්න අධ්‍යයනය කරනු ලබයි. මෙම අධ්‍යයනයේ අරමුණු වශයෙන් ඉන්දීය වතු දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා ලංකා කම්කරු කොංග්‍රසය කොතෙක් දුරට සමත් වී ඇත් ද යන්න අධ්‍යයනය කිරීම සහ වතු දෙමළ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින ලංකා කම්කරු කොංග්‍රසයේ ක්‍රියාකාරීත්වය සහ එකී ක්‍රියාකාරීත්වය පදනම් කර ගනිමින් ලංකා කම්කරු කොංග්‍රසය තුළ ඇති වූ අභ්‍යන්තර විසංවාදයන් පිළිබඳව අධ්‍යයනය කිරීම ද, වතු දෙමළ ජනතාව වෙනුවෙන් ලංකාණ්ඩුව දැක්වූ අවධානය පිළිබඳ අධ්‍යයනය ද, වතු කම්කරු අයිතිවාසිකම් ලබා දීමට, සීමා කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හා විවිධ අණ පනත් ඇතුළු නෛතික විධිවිධාන පිළිබඳව අධ්‍යයනය ද, ඉන්දීය වතු දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ලංකා කම්කරු කොංග්‍රසය කොතෙක් දුරට සමත් වී ඇත්ද යන්න අධ්‍යයනය ද අරමුණු කරන ලදී.

මේ යටතේ ප්‍රාථමික මෙන්ම ද්විතීයික මූලාශ්‍රය දෙකම භාවිත කරනු ලැබීය. ඒ යටතේ සම්මුඛ සාකච්ඡා මෙන්ම ප්‍රශ්නාවලි යන මූලික ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීමේ මූලධර්ම අනුගමනය කරන ලදී. මෙම අධ්‍යයනයේ අවසන් ප්‍රතිඵල ලෙස කොංග්‍රසයේ වර්තමාන නායකත්වය ජනතාව විෂයෙහි සංවේදී නොවීම, පාලකයන් ප්‍රභූ හිතවාදී තීන්දු තීරණ ගැනීම, වර්තමාන කොංග්‍රසය බිම් මට්ටමේ දේශපාලන සහභාගීත්වයක් ඇති කර නොගැනීම, පොරොන්දු දේශපාලනයක නිරත වීම, ජනතාව කොංග්‍රසයේ සාමාජිකත්වයෙන් මිදී වෙනත් පක්ෂ වෙත ආකර්ෂණය වීම, කොංග්‍රස් නායකත්ව ආධිපත්‍යය පක්ෂයේ සුළුතරයක් සාමාජිකයින් වටා ගොඩනැඟී තිබුණ ද ජනතාව කෙරෙන් ගොඩනැඟී තිබු ආධිපත්‍යය දුරස් වීම යනාදිය හඳුනා ගත හැකිය.

***ප්‍රමුඛ පද:*** *ආධිපත්‍යය, අනුභාසාත්මක නායකත්වය, දේශපාලන පක්ෂ ක්‍රමය, සාම්ප්‍රදායික ආධිපත්‍යය*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, **dulanjaliweerasinghe92@gmail.com**

# The Impact of Microfinance Services on the Growth of the Microenterprises in Sri Lanka: With special reference to Homagama DS. Division

**Shohani Upeksha Badullahewage**[1]

The microfinance is the provision of financial services to low income sectors, including the micro and small enterprises. It is mostly used in developing economies where micro and small enterprises do not have access to other sources of financial assistance. The microenterprises said to be the less privileged business group in the society which could play a significant role in the economy. There are substantial microenterprises operated in the Homagama region, but no study of impact of microfinance services on the growth of the microenterprises has been conducted. This study intended to ascertain the impact of microfinance services on the growth of income and productivity of the microenterprises being operated on the micro loans and advisory and training services provided by microfinance institutions. All microenterprises in Homagama is the target population and out of which 60 microenterprises which have obtained micro loans from the microfinance institutions were selected based on the judgmental sampling method. The primary data were collected on face to face interview through structured questionnaire and secondary data were collected through literature survey. Quantitative and qualitative techniques were used to undertake data analysis respectively based on descriptive statistics and parameter estimation and open-ended questions. The paired sample t-test, multiple regression, chi-square test, gamma and Kendal tau-b tests in the SPSS software were used to achieve the expected objective. The findings of the study indicated that micro loan and advisory and training services have created positive impact on the income and productivity growth of the micro enterprises. Majority agreed that the micro loan was fair enough for the expected tasks, they were satisfied with financial assistance received and success of their business. The study concluded that the microfinance services create impact on the growth of the microenterprises in Homagama region. Microfinance institutions should develop diversification in their products and government should create legal and regulatory environment to the entry of microfinancing by local and foreign investors.

***Key words:*** *Growth, Microenterprises, Microfinance*

[1] **Department of Economics, Shohani.92v@gmail.com**

# The Determinants of Job Mobility among Marketing Executives in Non-Bank Finance Sector

**Sathya Garusinghe**[1]

The research investigates the determinants which affect the mobility of marketing executives in the non-bank finance sector in Colombo. It focuses on an empirical understanding of the determinants of job mobility and identify the economic, social, environmental, physical and mental factors that affect mobility of marketing executives. The significance of the study is to provide useful implication for policy intervention to guard and improve the welfare of workers. The method used to analysis is the binary logistic analysis. In order to analyze the data collected the researcher used SPSS software. In the model job mobility is the dependent variable and there are five independent variables. Those are income, career development, working conditions, employee empowerment and staffing policies. The population of the study is 200 and the sample size is 120 employees based on three major companies. The companies are Merchant Bank Sri Lanka PLC, LB Finance Company and Peoples Leasing Company. The primary data were collected through questionnaires and secondary data were collected from exit interview records (Interview which takes place when an employee leaves the Company) of each company. Major finding is career development, working condition and staffing policies were significant to the mobility of marketing executives. Income and employee empowerment were insignificant with the job mobility of marketing executives. To support the major findings of this study, the policy actions to be taken by the company, industry and the government are suggested.

***Key words:*** *Binary Logistic Analysis, Employee Empowerment, Job Mobility, Non-Bank Finance Sector, Staffing Policies*

[1] **Department of Economics, sathyagarusinghe@gmail.com**

# The level of financial literacy among the undergraduates and factors determining the level of financial literacy

**Kanjala Jinendarathne**[1]

In the recent past years financial literacy has become a life skill same as the general literacy and the computer literacy. The knowledge of the financial literacy for young adults is far more important than their parents due to rapid changes in the financial market as well as the complexity of the financial products. The general assumption of the positive relationship between financial literacy and general financial literacy is not practical in today's world. In Sri Lanka more than 90% of the adult general literacy level ended up with 35% of the adult financial literacy level. Among many reasons to low level of financial literacy in Sri Lanka, the education system become one of the major factors. Therefore, this study carried out to find "if there is a high financial literacy among the undergraduates in the public universities, the factors behind the financial literacy and the way to improve it" To find the data about the level and the factors behind the financial literacy multiple choice questionnaires were distributed to management students in the university of Sri Jayewardenepura, covering the areas of general personal finance knowledge, savings and borrowing knowledge, investment knowledge and insurance knowledge. Multiple regression analysis method is used to find the factors that are gender, specialization in the field, type of students' residence, class standing, work status, mother's educational level and father's educational level, relating to financial literacy. This study found that the average level of financial literacy is 60.45% in the Management and Commerce Faculty of the University. It was found that the level of financial literacy is moderate among Sri Lankan university students. The financial literacy increases with the working experience and parents' education level. The level of financial literacy is high among students who are not coming from their own house, final year students and finance students. Students gave an opinion on improving financial literacy within the university education as a new subject in a semester which involves with active and innovative approach apart from the traditional approach.

***Key words:*** *Financial Literacy, Multiple Regression, University Students*

[1] **Department of Economics, kanjala.jinendarathne@gmail.com**

# A Study on Factors Determining the Youth Development Index (YDI) of Sri Lanka

**Thevuni Kotigala**[1]

Young people worldwide are rising as agents of change, demanding their rights for freedom and fair opportunities as they are in a need to fulfill their legitimate aspirations to improve their lives. Youth development is critical for young people in order to realize their capabilities to pursue decent employment, education opportunities, health and wellbeing, as well as civic and political empowerment. As a result, Commonwealth Youth Development Index (YDI) was built as a tool to measure relative youth development across countries. But, the relative youth development in Sri Lanka has not been tracked over the years due to the absence of a National YDI. Therefore, this gap should be minimized by measuring the YDI of Sri Lanka; an indicator of living conditions of youth in the country. Hence, the study aims to identify the factors that determines the youth development index of Sri Lanka. The study was carried out in the case of Colombo district, within the age bracket of youth in between 18-34 years. Primary data collection method of survey questionnaires was used to gather data. Secondary data were obtained from Census of Population and Housing (2012), National Youth Survey III (2013) and UN Statistics on Sri Lanka (1990-2014). A representative sample of 385 urban (78%) and rural (22%) youth were chosen using stratified sampling with proportionate allocation. The sample data was tested for reliability and validity by using Cronbach's alpha (above 0.7) and Bartlett's test of sphericity (Pvalue=0.00, KMO=0.927), and factor analysis technique was carried out to find the most significant factors that determine the YDI. According to the results, the 5-factor model indicates that the significant factors are; Education, Employment, Health and Wellbeing, Political Participation and Civic Participation. However, the total variance explained in the 5-factor model is only 56% and this suggests that there are more factors that contribute in determining the YDI of Sri Lanka, which was not revealed from this study. The study indicates a higher national YDI compared to the Commonwealth YDI on Sri Lanka, suggesting the need for investing in further research in national level. It also provides strategic suggestions for Sri Lanka to improve on its youth development, by presenting recommendations for government and policy makers, civil society and youth, and finally for further researches. In conclusion, the study contributes to greater precision in guiding, planning and establishing social policies on youth development in Sri Lanka.

***Keywords:*** *Youth, Development, Factors, Youth Development Index*

[1] **Department of Social Statistics, thevunik@gmail.com**

# Impact of Occupational Health and Safety Measures on Employees' Job Performance: In the case of Selected Electric Equipment Manufacturing Organizations

**Deepthi Ihalage[1]**

In present competitive and dynamic business world many organizations are adopting the advanced technology. Increasing technologies involves high risk, where the question of industrial safety arises. The life of the industrial worker is full of risk. Moreover human resource is the most valuable resource that an organization has. Therefore the occupational health and safety is a current issue in present business context. The research objective is to identify the impact of occupational health and safety measures on employees' job performance. In this study, researcher selected list of employees as the sample frame. The sample consisted at 304 employees from three selected electric equipment manufacturing organizations and it was done through stratified random sampling technique. Data were collected from both primary and secondary data sources. The exploratory study was done in order to collect basic information about the organizations. For that, telephone interviews and face to face interviews were conducted with Human Resource Managers. A structured questionnaire, observations, and key informant discussions were used to collect primary data. Statistical data analytical tools were used for descriptive analysis, regression and factor analysis. The statistical model was built by applying a regression analysis as there are five independent variables and their impact was measured on employees' job performance which is the sole dependent variable. As a result, working conditions, employee contribution, organization policies and procedures and prioritization are significant factors to the employees' job performance model. The regression coefficients are 0.693, 0.190, 0.143 and 0.104 respectively. Leadership on employees' job performance is less significantly important to the model. As per the evidence provided by the results it can be concluded that the existence of good occupational health and safety measures greatly affect the high job performance level of the employees. This study comes out with recommendations to the future researchers to conduct a research to identify the impact of occupational health and safety on employees' job performance based on construction industry where the highest number of fatal accidents have occurred.

***Key words:*** *Health, Safety, Performance*

[1] **Department of Social Statistics, h.deepthi77@gmail.com**

# Factors Affecting Purchase Intention of Motorcycles (In the Case of Urban Consumers in Dehiwala Divisional Secretariat)

**S. D. Ilangasekara[1]**

The trend of using motorcycles is crucial to support daily activities of urban consumers: avoiding general traffic congestion, high fuel efficiency, time saving and price benefits over the other vehicles. Thus, when fulfilling customers' expectations, new sources of ideas and information on purchase intention of motorcycles are significant through relieving empirical evidence to the knowledge of marketing professionals. This research mainly focuses on identifying the factors that affect urban consumers' purchase intention on motorcycle brands: Bajaj, Hero, TVS and Honda. The required data were collected using a structured questionnaire through the simple random sampling and cluster sampling methods with a sample size of 168. A correlation analysis and a multiple linear regression analysis were used to analyze the collected data. Each of the individual independent variables: brand loyalty, perceived quality, brand image, product knowledge and price was positively correlated with purchase intention. Furthermore, the results of the multiple linear regression revealed three variables: brand loyalty, brand image and product knowledge had the highest impact on purchase intention of urban consumers except perceived quality and price. This study recommends many promotional tools in marketing such as the introduction of easily operated - fuel efficient motorcycles, introduction of more attractive motorcycles to fulfill consumers' needs and affordable pricing that can encourage and educate consumers on the benefits and features of motorcycles. This study could be extended by incorporating the key markets such as China and Japan as the closest competitors to India in the motorcycle market in Sri Lanka. Despite, there is a need of identifying the factors affecting the purchase intention of male and female consumers towards motorcycles.

**Key words:** *Motorcycles, multiple linear regression, purchase intention and urban consumers*

[1] **Department of Social Statistics, ilangasekara@gmail.com**

# A Study on the Challenges of Using DNA Evidence in the Field of Criminal Investigation in Sri Lanka

**K.G.S.D. Weerawardhana**[1]

Deoxyribonucleic acid (DNA) is an organism's genetic material that has already begun to shape medicine, forensic sciences and environmental sciences. The criminal investigation is the process of discovering evidence to determine what happened and who is responsible for the crime. DNA evidence can be found at the crime scene and the forensic DNA analysis of those evidence help to convict criminals, exonerates the wrongly accused, and identifies victims of crime and war.

Though DNA is vastly used for the criminal investigation because of its accuracy, there are some challenging factors which affect to the use of DNA evidence in criminal investigation. Errors in the collection of evidence or handling of the biological samples and using unreliable machines for DNA analysis and the time takes for the DNA analysis can be challenge for the use of DNA evidence in criminal investigation. So it is timely important to question the challenges of using DNA technology in criminal investigation to identify the strengths, opportunities, weaknesses and threats of the investigation field due to lack of studies based on DNA technology in the field of criminal investigation in Sri Lanka.

The persuading aim of this study is to identify the challengers which affect to the effective use of DNA technology in criminal investigation in Sri Lanka. Methodologically this study is conceptual and has done using semi-structured interview and in-depth interview methods with the police officers and analysts in DNA based investigation fields.

The findings proved two hypothesis: the time takes for the analysis and the type of crime challenge for the effective use of DNA in criminal investigation, and rejected other two hypotheses: the accuracy of machineries and the human resource error level challenge for the effective use of DNA in criminal investigation. Apart from that there are some other challenging factors and the future researchers will able to do the further researches on them.

***Key words**: DNA, Criminal Investigation, Challenges, Biological, Genetic*

[1] **Department of Criminology and Criminal Justice, sinekadw@gmail.com**